C/3
BQ
1372
A1
S5
1954

THE

# DHAMMAPADA

WITH PĀLI TEXT

SINHALESE AND ENGLISH TRANSLATIONS

By

B. SIRI SIVALI

Printed at Peramuna Ltd.
1st Division, Maradana

1954

Theology Library
SCHOOL OF THEOLOGY
AT CLAREMONT
California

ධම්මපද

# THE DHAMMAPADA

# CONTENTS


| | | Page |
|---|---|---|
| | Foreword | 5 |
| | Preface | 7 |
| I. | Yamakavaggo—Twin Verses | 10–11 |
| II. | Appamādavaggo—Vigilance | 26–27 |
| III. | Cittavaggo—The Mind | 34–35 |
| IV. | Pupphavaggo—Flowers | 42–43 |
| V. | Bālavaggo—The Fool | 54–55 |
| VI. | Paṇḍitavaggo—The Wise | 66–67 |
| VII. | Arahantavaggo—The Worthy | 76–77 |
| VIII. | Sahassavaggo—The Thousands | 84–85 |
| IX. | Pāpavaggo—Evil | 96–97 |
| X. | Daṇḍavaggo—Punishment | 106–107 |
| XI. | Jarāvaggo—Old age | 118–119 |
| XII. | Attavaggo—The Self | 126–127 |
| XIII. | Lokavaggo—The World | 134–135 |
| XIV. | Buddhavaggo—The Enlightened One | 142–143 |
| XV. | Sukhavaggo—Happiness | 156–157 |
| XVI. | Piyavaggo—Affections | 164–165 |
| XVII. | Kodhavaggo—Anger | 172–173 |
| XVIII. | Malavaggo—Impurities | 182–183 |
| XIX. | Dhammaṭṭhavaggo—The Righteous | 198–199 |
| XX. | Maggavaggo—The Path | 208–209 |
| XXI. | Pakiṇṇakavaggo—Miscellaneous | 220–221 |
| XXII. | Nirayavaggo—Woeful State | 232–233 |
| XXIII. | Nāgavaggo—The Elephant | 242–243 |
| XXIV. | Taṇhāvaggo—Craving | 252–253 |
| XXV. | Bhikkhuvaggo—The Bhikkhu | 270–271 |
| XXVI. | Brāhmaṇavaggo—The Brahmin | 286–287 |

# FOREWORD

I heartily welcome the publication of the present edition of the Dhammapada by the Ven. B. Siri Sivali Thera, the well known Scholar and writer for two reasons: Buddhists all over the world are celebrating Sam Buddha Jayanti and Chattha Sangāyan is being held in the Union of Burma.

This sacred anthology of the Sayings of the Buddha provides all enquiring minds with spiritual solace and solution to the great problems of life.

The book is very well got up and on excellent paper. I have no doubt that it will be most helpful to readers in many countries as it contains an English translation and the text is in Roman characters.

Senior students in Secondary Schools and students at the University level should find it interesting, instructive and inspiring in their religious education.

U. BA LWIN

*(Minister for the Union of Burma in Ceylon.)*

**25-10-54.**

ප්‍රගතිශීලි සාහිත්‍යය } 30
Progressive Literature Series }

*Published by*
Mc CALLUM BOOK DEPOT,
COLOMBO.

# PREFACE

The Sutta Pitaka is one of the three sections of the Buddhist canon (Tripitaka). It comprises of five volumes, the last of which, Khuddaka Nikāya contains fifteen divisions. The second of these divisions is the book known as Dhammapada, a collection of 423 beautiful Pāli stanzas, given under 26 chapters.

The Dhammapada in its present form is supposed to have been committed to writing along with its sister works at Alu Vihāra, a cave temple near Mātale in Ceylon. The popularity of the book could be gauged by the fact, that it has remained the hand-book of the Buddhist the world over for twenty long centuries since its commital to writing. This unique work, though only a part of the Buddhist canon, has won the esteem and veneration of Buddhists, just as the Bhagavad Gītā amongst Hindus, the holy Bible amongst Christians, and the holy Koran amongst Muslims.

For a comprehensive understanding and appreciation of this work one should as well refer to its commentary, the Dhammapadaṭṭha Kathā, written by the famous Buddhist commentator Buddhaghosa.

It is with the greatest love and zeal that the Buddhist monks study the Dhammapada and even memorise its stanzas prior to their higher ordination. The layman, who is not conversant with Pāli has to resort to translations for a complete understanding of the pithy sayings found therein. Thus the existence of a variety in works of translations by different scholars would widen the field of appreciation.

The Dhammapada embodying the essentials of Buddhism, is a vast treasure store of wisdom. In it is to be found the unfailing means of improving man's inner self. The secret of the immense popularity of this work is to be unearthed in that direction. In a world torn asunder by dissensions and fears this work holds a beacon of hope, faith and courage to all those whose horizons have become darkened due to the horrors of the atomic age.

There are numerous translations of the Dhammapada in both oriental and occidental languages by different authors. A number of these was produced in Ceylon. The incentive to produce an English translation became the greater after my Sinhalese translation published some years ago. And this is the fruit of it. In this work, the original Pāli Text is to be found in Sinhalese as well as in Roman characters. The translations are given in both Sinhalese and English.

I have to express my debt of gratitude to His Excellency **U. Ba Lwin,** the Minister for the Union of Burma in Ceylon for the Foreword written by him. My thanks are due to **Mr. P. L. Prematilaka** (B. A. Honours) and **Mrs. B. L. Ranasinghe** (B.A. Honours, Diploma in Education) for kindly helping me in compiling this work. I also thank **Mr. B. L. Ranasinghe** (B. A. Honours, Diploma in Education), **Rev. P. Ānanda, Mr. R. K. Dharmasena** and **Mr. A. M. Premavansa** for their kind assistance.

**SISI**

*Vidyālankāra Pirivena.*
*Kelaniya, Ceylon.*

# ධම්මපද

# DHAMMAPADA

## යමක වග්ගෝ පඨමෝ.

1. මනෝ පුබ්බංගමා ධම්මා
මනෝ සෙට්ඨා මනෝමයා,
මනසා චේ පදුට්ඨේන
භාසති වා කරෝති වා,
තතෝ නං දුක්ඛමන්වේති
චක්කංව වහතෝ පදං.

2. මනෝ පුබ්බංගමා ධම්මා
මනෝ සෙට්ඨා මනෝමයා,
මනසා චේ පසන්නේන
භාසති වා කරෝති වා,
තතෝ නං සුඛමන්වේති
ඡායාව අනපායිනී.

## *1. YAMAKAVAGGO PAṬHAMO*

1. Manopubbaṅgamā dhammā manosetthā manomayā,
Manasā ce padutthena bhāsati vā karoti vā,
Tato naṃ dukkhamanveti cakkaṃ ‘va vahato padaṃ.

2. Manopubbaṅgamā dhammā manosetthā manomayā
Manasā ce pasannena bhāsati vā karoti vā
Tato naṃ sukhamanveti, chāyā’ va anapāyinī.

# ධම්මපද භාවය

## 1. යමක වර්ගය.

1 චෛතසිකයන්ට හෙවත් සිතේ ඇති වන ගතිවලට සිත පෙරටු ය. ඒ ගති සිත ම ශ්‍රේෂ්ඨ කොට පවතින්නෝ ය; සිතින් ම උපදින්නෝ ය. ඒ නිසා යමෙක් නරක - කිලිටි - සිතින් යමක් කියයි නම්, කරයි නම්, කරත්තය අදිනා ගොනාගේ පය අනුව රෝදය යන්නාක් මෙන්, ඔහු පසු පස්සේ දුක ලුහුබඳී.

2. චෛතසිකයන්ට හෙවත් සිතේ ඇති වන ගතිවලට සිත පෙරටු ය. ඒ ගති සිත ම ශ්‍රේෂ්ඨ කොට පවතින්නෝ ය; සිතින් ම උපදින්නෝ ය. ඒ නිසා යමෙක් හොඳ - පහන් - සිතින් යමක් කියයි නම්, කරයි නම්, සිරුර නො හැර යන සෙවණැල්ල මෙන් ඔහු පසු පස්සේ සැපය ලුහුබඳී.

## 1. TWIN VERSES

1. All mental natures are mind-marshalled. Mind is their chief; and they are mind-made. If, with an impure mind, one speaks or acts, then suffering follows him even as the wheel, the hoof of the ox.

2. All mental natures are mind-marshalled. Mind is their chief; and they are mind-made. If, with a pure mind, one speaks or acts, happiness follows him like the shadow that never leaves him.

3. අක්කොච්ඡි මං, අවධි මං,
අජිනි මං, අහාසි මෙ;
යෙ තං උපනය්හන්ති,
වෙරං තෙසං න සම්මති.

4. අක්කොච්ඡි මං, අවධි මං,
අජිනි මං, අහාසි මෙ;
යෙ තං න උපනය්හන්ති,
වෙරං තෙසූපසම්මති.

5. න හි වෙරෙන වෙරානි
සම්මන්තීධ කුදාචනං,
අවෙරෙන ච සම්මන්ති,
එස ධම්මො සනන්තනො.

3. Akkocchi maṃ, avadhi maṃ, ajini maṃ, ahāsi me;
Ye taṃ upanayhanti, veraṃ tesaṃ na sammati.

4. Akkocchi maṃ, avadhi maṃ, ajini maṃ, ahāsi me;
Ye taṃ na upanayhanti, veraṃ tesûpasammati.

5. Na hi verena verāni sammantîdha kudācanaṃ;
Averena ca sammanti, esa dhammo sanantano.

3. අසුවලා මට බැන්නේ ය, මට ගැසුවේ ය, මා පැරද වූයේ ය, මා සතු දේ පැහැර ගත්තේ ය යනුවෙන් යම් කෙනෙක් ක්‍රොධ බඳිද් ද ඔවුන්ගේ වෛරය නො සංසිඳේ.

4. අසුවලා මට බැන්නේ ය, මට ගැසුවේ ය, මා පැරද වූයේ ය, මා සතු දේ පැහැර ගත්තේ ය යනුවෙන් යම් කෙනෙක් ක්‍රොධ නො බඳිද් ද ඔවුන්ගේ වෛරය සංසිඳේ.

5. මේ ලෝකයේ කවදා වත් වෛරයෙන් වෛරයෝ නො සංසිඳෙත්; අවෛරයෙන් ම වෛරයෝ සංසිඳෙත්; මෙය පෙර සිට පවතින (ධර්ම) ස්වභාවය යි.

3. 'He abused me, beat me, overcame me, robbed me' – in those who harbour such thoughts hatred does not cease.

4. 'He abused me, beat me, overcame me, robbed me' – in those who do not harbour such thoughts hatred does cease.

5. In this world hatreds are never appeased by hatred. They are appeased by love alone. This is the ancient law.

6. පරේ ච න විජානන්ති
මයමෙත්ථ යමාමසේ,
යේ ච තත්ථ විජානන්ති
තතෝ සම්මන්ති මේධගා.

7. සුභානුපස්සිං විහරන්තං
ඉන්ද්‍රියේසු අසංවුතං,
භෝජනම්හි අමත්තඤ්ඤුං
කුසීතං හීනවීරියං,
තං වේ පසහති මාරෝ
වාතෝ රුක්ඛංව දුබ්බලං.

6. Pare ca na vijānanti mayam'ettha yamāmase,
Ye ca tattha vijānanti tato sammanti medhagā.

7. Subhānupassiṃ viharantaṃ indriyesu asaṃvutaṃ,
Bhojanamhi amattaññuṃ kusītaṃ hīnavīriyam,
Taṃ ve pasahati Māro vāto rukkhaṃ' va dubbalaṃ.

6. මාගේ ගුණ දනුමැතිකම් නොපිළිගන්නෝ 'අපි (මේ කලහයෙන්) මෙහි දී වැනසෙන්නම්හ' යන බව නො දනිත්. යම් කෙනෙක් එය දනිත් නම් ඒ නිසා කලහ සංසිඳේ.

7. යමෙක් රූපාදි අරමුණු ශුභ වශයෙන් ගනිමින් ඉන්ද්‍රිය සංවරයකුත් නැතිව, කෑමෙහි පමණකුත් නො දැන, මැළිව, වීර්යයෙන් හීනව වෙසේ ද, මාරයා හෙවත් මරණය ඔහුට පහර දෙන්නේ වාතය දුබල ගසකට පහර දෙන්නාක් මෙනි.

6. Others do not know that we come to an end here. But those who know this, have their quarrels calmed thereby.

7. As the wind throws down a weak tree, so verily Māra (the tempter) overthrows him who lives looking for pleasures, unrestrained in senses, immoderate in food, indolent and inert.

8. අසුභානුපස්සිං විහරන්තං
ඉන්ද්‍රියේසු සුසංවුතං,
භෝජනම්හි ච මත්තඤ්ඤුං
සද්ධං ආරද්ධ වීරියං;
තං වේ නප්පසහති මාරෝ
වාතෝ සේලංව පබ්බතං.

9. අනික්කසාවෝ කාසාවං
යෝ වත්ථං පරිදහෙස්සති,
අපේතෝ දමසච්චේන
න සෝ කාසාවමරහති.

8. Asubhānupassiṃ viharantaṃ indriyesu susaṃvutaṃ,
Bhojanamhi ca mattaññuṃ saddhaṃ āraddhavīriyaṃ,
Taṃ ve nappasahati Māro vāto selaṃ'va pabbataṃ.

9 Anikkasāvo kāsāvaṃ yo vatthaṃ paridahessati,
Apeto damasaccena na so kāsāvamarahati.

8. යමෙක් රූපාදි අරමුණු අශුභ වශයෙන් ගනිමින් ඉන්ද්‍රිය සංවරය ඇතිව, කෑමෙහි ද පමණ දැන, සැදැහැතිව, ඇරඹූ වීර්‍ය ඇතිව වෙසේ ද, වාතයට ගල නොසෙල්විය හැකිවා මෙන් මරණයට ද ඔහු මැඩ ලිය නොහැකි ය.

9. යමෙක් කෙලෙස් කහට සහිතව සිවුර දරයි ද, ඉඳුරන් දැමීමෙන් හා ඇත්ත කීමෙන් (පවා) තොර වූ ඔහු කිසි සේත් සිවුරට සුදුසු නැත.

8. As the wind does not throw down a rocky mountain, so verily Māra (the tempter) does not overthrow him who lives meditating on the impurities, well restrained in senses, moderate in food, full of faith and of strenuous effort.

9. He who wears the yellow robe, without being freed from impurity, who is devoid of self-control and truth, is not worthy of it.

10. යෝ ච වන්තකසාවස්ස
සීලේසු සුසමාහිතෝ,
උපේතෝ දමසච්චේන
ස වේ කාසාවමරහති.

11. අසාරේ සාරමතිනෝ
සාරේ චාසාරදස්සිනෝ,
තේ සාරං නාධිගච්ඡන්ති
මිච්ඡාසංකප්පගෝචරා.

12. සාරං ච සාරතෝ ඤත්වා
අසාරං ච අසාරතෝ,
තේ සාරං අධිගච්ඡන්ති
සම්මාසංකප්පගෝචරා.

10. Yo ca vantakasāv'assa sīlesu susamāhito,
Upeto damasaccena sa ve kāsāvamarahati.

11. Asāre sāramatino sāre cā'sāradassino,
Te sāraṃ nādhigacchanti micchāsaṅkappagocarā.

12. Sārañ ca sārato ñatvā asārañ ca asārato,
Te sāraṃ adhigacchanti sammāsaṅkappagocarā

10. යමෙක් කෙලෙස් කහට රහිතව සිල්හි පිහිටා ඉඳුරන් දැමීමෙන් හා සත්‍ය වචනයෙන් යුක්ත වෙයි ද, ඔහු ඒකාන්තයෙන් ම සිවුරට සුදුසු ය.

11. නිසරු දේ සරු කොටත්, සරු දේ නිසරු කොටත් දකින්නා වූ වැරදි කල්පනාවල එල්බුණු පුද්ගලයෝ සරු දෙයක්-දහමක්-නො ලබත්.

12. සරු දේ සරු හැටියටත්, නිසරු දේ නිසරු හැටියටත් හැඳින ගෙන නිවැරදි කල්පනාවල යෙදෙන්නෝ සරු දෙයක් ම ලබත්.

10. He who is freed from all impurities, is well established in morals, is possessed of self-control and truth, is indeed, worthy of the yellow robe.

11. They who imagine in the unreal the real and in the real the unreal, they who abide in the pasture-ground of wrong thoughts do not arrive at the real.

12. They who know the real as the real and the uneral as the unreal, they who abide in the pasture-ground of right thoughts arrive at the real.

13. යථා අගාරං දුච්ඡන්නං
වුට්ඨි සමතිවිජ්ඣති,
ඒවං අභාවිතං චිත්තං
රාගෝ සමතිවිජ්ඣති.

14. යථා අගාරං සුච්ඡන්නං
වුට්ඨි න සමතිවිජ්ඣති,
ඒවං සුභාවිතං චිත්තං
රාගෝ න සමතිවිජ්ඣති.

15. ඉධ සෝචති, පෙච්ච සෝචති,
පාපකාරී උභයත්ථ සෝචති;
සෝ සෝචති, සෝ විහඤ්ඤති,
දිස්වා කම්ම කිලිට්ඨමත්තනෝ.

13. Yathā agāraṃ ducchannaṃ vutthi samativijjhati.
Evaṃ abhāvitaṃ cittaṃ rāgo samativijjhati.

14. Yathā agāraṃ succhannaṃ vutthi na samativijjhati,
Evaṃ abhāvitaṃ cittaṃ rāgo na samativijjhati.

15. Idha socati, pecca socait, pāpakārī ubhayattha socati,
So socati, so vihaññati, disvā kammakilitthamattano.

13. හොඳින් සෙවිලි නො කළ ගෙය වැස්සෙන් තෙමෙන්නාක් මෙන් භාවනාවට පුරුදු නො කළ සිත රාගයෙන් තෙත් වේ. (රාගය අභාවිත සිත විනිවිද ගෙන යයි.)

14. හොඳින් සෙවිලි කළ ගෙය වැස්සෙන් නො තෙමෙන්නාක් මෙන් මනාව භාවනාවට පුරුදු කළ සිත රාගයෙන් තෙත් නො වේ. (රාගය භාවිත සිත විනිවිද ගෙන නො යයි.)

15. පව් කරන්නා මෙ ලොවත් ශෝක කරයි; පර ලොවත් ශෝක කරයි. දෙ ලොව මත් ශෝක කරයි. ඔහු තමාගේ කිලිටි කර්මය දැක ශෝක කරයි; වෙහෙසෙයි.

13. As rain penetrates an ill-thatched house, so lust penetrates an undeveloped mind.

14. As rain does not penetrate a well-thatched house, so lust does not penetrate a well-developed mind.

15. The evil-doer grieves here, he grieves hereafter. He grieves in both worlds. He grieves, he perishes, seeing his own impure deed.

16. ඉධ මෝදති, පෙච්ච මෝදති,
කතපුඤ්ඤෝ උභයත්ථ මෝදති;
සෝ මෝදති, සෝ පමෝදති,
දිස්වා කම්ම විසුද්ධිමත්තනෝ.

17. ඉධ තප්පති, පෙච්ච තප්පති.
පාපකාරී උභයත්ථ තප්පති;
පාපං මෙ කතන්ති තප්පති,
භිය්‍යෝ තප්පති දුග්ගතිං ගතෝ.

11. ඉධ නන්දති, පෙච්ච නන්දති,
කතපුඤ්ඤෝ උභයත්ථ නන්දති;
පුඤ්ඤං මෙ කතන්ති නන්දති,
භිය්‍යෝ නන්දති සුග්ගතිං ගතෝ.

16. Idha modati, pecca modati, Katapuñño ubhayattha modati;
So modati, so pamodati, disvā kammavisuddhimattano.

17. Idha tappati pecca tappati, pāpakārī ubhayattha tappati;
Pāpaṃ me katan ti tappati, bhīyo tappati duggatiṃ gato.

18. Idha nandati, pecca nandati, katapuñño ubhayattha nandati;
Puññaṃ me katan ti nandati, bhīyo nandati suggatiṃ gato.

16. පින් කළ තැනැත්තා මෙ ලොවත් සතුටු වෙයි; පරලොවත් සතුටු වෙයි; දෙ ලොව මත් සතුටු වෙයි. ඔහු තමාගේ ශුද්ධ කර්මය දැක සතුටු වෙයි; ඉතා සතුටු වෙයි.

17. පව් කරන්නා මෙ ලොවත් තැවෙයි; පරලොවත් තැවෙයි; දෙ ලොව මත් තැවෙයි. මා විසින් පවක් කරන ලදැයි සිතා තැවෙයි; ඒ නිසා දුගතියට ගියේ වඩාත් තැවෙයි.

18. පින් කළ තැනැත්තා මෙ ලොවත් සතුටු වෙයි; පරලොවත් සතුටු වෙයි; දෙ ලොව මත් සතුටු වෙයි. මා විසින් පිනක් කරන ලදැයි සිතා සතුටු වෙයි; ඒ නිසා සුගතියට ගියේ වඩාත් සතුටු වෙයි.

16. The well-doer rejoices here, he rejoices hereafter. He rejoices in both worlds. He rejoices, exceedingly rejoices, seeing his own pure deed.

17. The evil-doer laments here, he laments hereafter. He laments in both worlds. He laments thinking that he has done evil. He laments even more when he goes to hell.

18. The well-doer rejoices here, he rejoices hereafter. He rejoices in both worlds. He rejoices thinking that he has done good. He rejoices even more when he goes to heaven.

19. බහුම්පි චේ සහිතං භාසමානෝ
න තක්කරෝ හෝති නරෝ පමත්තෝ;
ගෝපෝව ගාවෝ ගණයං පරේසං
න භාගවා සාමඤ්ඤස්ස හෝති.

20. අප්පම්පි චේ සහිතං භාසමානෝ
ධම්මස්ස හෝති අනුධම්මචාරී,
රාගං ච දෝසං ච පහාය මෝහං
සම්මප්පජානෝ සුවිමුත්තචිත්තෝ,
අනුපාදියානෝ ඉධ වා හුරං වා
ස භාගවා සාමඤ්ඤස්ස හෝති.

**යමකවග්ගෝ නිට්ඨිතෝ.**

---

19. Bahumpi ce sahitaṃ bhāsamāno
Na takkaro hoti naro pamatto ;
Gopo'va gāvo gaṇayaṃ pāresaṃ
Na bhāgavā sāmaññassa hoti.

20. Appampi ce sahitaṃ bhāsamāno
Dhammassa hoti anudhammacārī,
Rāgañ ca dosañ ca pahāya mohaṃ
Sammappajāno suvimuttacitto,
Anupādiyāno idha vā huraṃ vā
Sa bhāgavā sāmaññassa hoti.

19. යමෙක් තුන් පිටකය ඉගෙන බොහො ම බණ කියතත්, තමා එය නො පිළිපදී නම්, නො සලකයි නම්, ඔහු අනුන්ගේ හරක් රකිනා ගොපල්ලා මෙන්, මහණ දමේ ඵලයට හිමි කාරයෙක් නො වේ.

20. යමෙක් තුන් පිටකය ටිකක් කියතත්, ධර්මය අනුව පිළිපදී නම්, ඔහු රාග, ද්වේෂ, මෝහ දුරු කොට හොඳ නුවණින් හා මිදුණු සිතින් යුක්ත ව මෙ ලොව පර ලොව කිසි ම බැඳීමක් - ගැනීමක් - නැති ව මහණ දමේ ඵලයට හිමි කාරයෙක් වෙයි.

යමක වග්ගය නිමි.

---

19. Though he recites a large number of scriptural texts, but does not act accordingly, that heedless man is like the cowherd who counts others' cows; he has no share in the blessings of a recluse.

20. Though he recites a small number of scriptural texts, but acts in accordance with the Teaching, and having forsaken lust, hatred and delusion, being possessed of right knowledge, and serenity of mind, clinging to nothing here and hereafter, he shares the blessings of a recluse.

---

## අප්පමාද වග්ගෝ දුතියෝ.

21. අප්පමාදෝ අමතපදං,
පමාදෝ මච්චුනෝ පදං;
අප්පමත්තා න මීයන්ති,
යේ පමත්තා යථා මතා.

22. ඒතං විසේසතෝ ඤත්වා
අප්පමාදම්හි පණ්ඩිතා,
අප්පමාදේ පමෝදන්ති
අරියානං ගෝචරේ රතා.

23. තේ ඣායිනෝ සාතතිකා
නිච්චං දළ්හපරක්කමා,
ඵුසන්ති ධීරා නිබ්බාණං
යෝගක්ඛේමං අනුත්තරං.

## *II. APPAMĀDAVAGGO DUTIYO*

21. Appamādo amatapadaṃ, pamādo maccuno padaṃ;
Appamattā na mīyanti, ye pamattā yathā matā.

22. Etaṃ visesato ñatvā appamādamhi paṇḍitā,
Appamāde pamodanti ariyānaṃ gocare ratā.

23. Te jhāyino sātatikā niccaṃ daḷhaparakkamā,
Phusanti dhīrā nibbānaṃ yogakkhemaṃ anuttaraṃ.

## 2. අප්‍රමාද වර්ගය.

21. නො පමාව - සැලකිල්ල - නිවනට කරුණු වේ. පමාව - නො සැලකිල්ල - මරණයට කරුණු වේ. නො පමා වූවෝ නො මැරෙත්. පමා වූවෝ (නො මළත්) මළවුන් වැනි ය.

22. මේ කරුණ වෙසෙසින් දැන, ආර්යයන්ට ම විෂය වන (=කැපෙන, ගැළපෙන) නො පමා බවෙහි ඇලුණු පණ්ඩිතයෝ එහි ලා ඉතා සතුටු වෙත්.

23. ඔවුහු හෙවත් ධ්‍යාන භාවනා කරන, නිතර පවත්නා දැඩි උත්සාහය ඇති ඒ පණ්ඩිතයෝ නිරුත්තර වූ, දුකින් වෙන් වූ නිවන ලබත්.

## 2. VIGILANCE

21. Vigilance is the path to deathless. Negligence is the path to death. The vigilant do not die. The negligent are as if dead already.

22. Distinctly understanding this difference of vigilance the wise rejoice therein, delighting in the realm of the Noble.

23. These wise ones constantly meditative, ever persevering realise Nibbāna, which is free of all bonds and su preme.

24. උට්ඨානවතෝ සතිමතෝ
සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
සඤ්ඤතස්ස ච ධම්මජීවිනෝ
අප්පමත්තස්ස යසෝභිවඩ්ඪති.

25. උට්ඨානේනප්පමාදේන
සංයමේන දමේන ච,
දීපං කයිරාථ මේධාවී
යං ඔඝෝ නාභිකීරති.

26. පමාදමනුයුඤ්ජන්ති
බාලා දුම්මේධිනෝ ජනා;
අප්පමාදං ච මේධාවී
ධනං සෙට්ඨං ව රක්ඛති.

24. Utthānavato satimato sucikammassa nisammakārino
Saññatassa ca dhammajīvino appamattassa yaso'bhi-
vaḍḍhati

25. Utthānen'appamādena saṃyamena damena ca,
Dīpaṃ kayirātha medhāvī yaṃ ogho nâbhikīrati.

26. Pamādamanuyuñjanti bālā dummedhino janā;
Appamādañ ca medhāvī dhanaṃ setthaṃ'va rakkhati.

24. නැගී සිටි වීර්‍ය ඇති, තමා ගැන තමාට ම දැනෙන සිහිය ඇති, නිදොස් දේ කරන, විමසා බලා කටයුතු කරන, තැන්පත් දැහැමි දිවි පැවතුම් ඇති නො පමා පුද්ගලයාගේ කීර්තිය මනා ව වැඩේ.

25. පණ්ඩිතයා නැගී සිටි වීර්‍ය, සැලකිල්ල, තැන්පත්කම, ඉන්ද්‍රිය දමනය යන දේවලින් කෙලෙස් වතුරට යට නො වන දිවයිනක් - මුදුනක් - තනා ගන්නේ ය.

26. අනුවණ බාලයෝ පමාවෙන් - නො සැලකිල්ලෙන් කල් යවත්. පණ්ඩිතයා නො පමා බව උසස් ධනයක් මෙන් රකී.

24. Whoso is energetic, mindful, pure in deed, discriminative, self-restrained, righteous of life, vigilant, his glory increases gradually.

25. By effort, by vigilance, by restraint, by control, let the wise man make for himself an island which the flood cannot overwhelm.

26. The foolish and ignorant men indulge in negligence. The wise man guards his vigilance as his best treasure.

27. මා පමාදමනුයුංජේථ,
මා කාමරතිසන්ථවං;
අප්පමත්තෝ හි ඣායන්තෝ
පප්පෝති විපුලං සුඛං.

28. පමාදං අප්පමාදේන
යදා නුදති පණ්ඩිතෝ,
පඤ්ඤාපාසාදමාරුය්හ
අසෝකෝ සෝකිනිං පජං
පබ්බතට්ඨෝව භුම්මට්ඨේ
ධීරෝ බාලේ අවෙක්ඛති.

29. අප්පමත්තෝ පමත්තේසු
සුත්තේසු බහුජාගරෝ,
අබලස්සංව සීඝස්සෝ
හිත්වා යාති සුමේධසෝ.

27. Mā paṃādaṃ anuyuñjetha, Mā kāmaratisanthavaṃ;
Appamatto hi jhāyanto pappoti vipulam sukhaṃ.

28. Pamādaṃ appamādena yadā nudati pandito,
Paññāpāsādamāruyha asoko sokiniṃ pajaṃ
Pabbatattho'va bhummatthe dhīro bāle avekkhati

29. Appamatto pamattesu suttesu bahujāgaro
Abal 'assaṃ'va sīgh'asso hitvā yāti sumedhaso.

27. පමාවෙන් කල් නො යවව්. කාමයෙහි ඇලී, යෙදී නො වසව්. නො පමා ව ධ්‍යාන භාවනා කරන්නා මහත් සැපයට පැමිණේ.

28. යම් විටක පණ්ඩිතයා නො පමාවෙන් පමාව මඟ හරවා ගනී ද එ විට ඔහු නුවණ නමැති පහයට නැඟී, ශෝක රහිත ව, ශෝකී ජනයා දෙස බලයි. ඔහු ඔවුන් දෙස බලන්නේ කඳු මුදුනක සිටින්නකු බිම සිටින්නන් දෙස බලන්නාක් මෙනි.

29. පමා වූවන් අතුරෙහි නො පමා වන්නා වූත්, නිදන්නන් අතුරෙහි බොහෝ නිදි මරන්නා වූත් බුද්ධිමතා වේගයෙන් දුවන අශ්වයා අබලන් අශ්වයා පසු කොට යන්නාක් මෙන්, පමා වූවන් හැර දමා යයි.

27. Give not yourselves over to negligence. Do not have intimacy with lust and sensual pleasures. The vigilant, meditative person attains abundant happiness.

28. When the wise man drives away negligence by vigilance, ascending the palace of wisdom he gazes sorrowless on the ignorant sorrowing men as a mountaineer, the groundlings.

29. Vigilant among the negligent, wide awake among sleepy, the wise man advances like a swift horse, leaving behind the hack.

30. අප්පමාදේන මඝවා
දේවානං සෙට්ඨතං ගතෝ;
අප්පමාදං පසංසන්ති
පමාදෝ ගරහිතෝ සදා.

31. අප්පමාදරතෝ භික්ඛු
පමාදේ භයදස්සි වා,
සංයෝජනං අණුං ථූලං
ඩහං අග්ගීව ගච්ඡති.

32. අප්පමාදරතෝ භික්ඛු
පමාදේ භයදස්සි වා,
අභබ්බෝ පරිහාණාය
නිබ්බාණස්සේව සන්තිකේ.

**අප්පමාද වග්ගෝ නිට්ඨිතෝ.**

---

30. Appamādena Maghavā devānaṃ setthataṃ gato;
Appamādaṃ pasaṃsanti pamādo garahito sadā.

31. Appamādarato bhikkhu pamāde bhayadassi vā,
Saṃyojanaṃ aṇuṃ thūlaṃ ḍahaṃ aggī'va gacchati.

32. Appamādarato bhikkhu pamāde bhayadassi vā,
Abhabbo parihānāya nibbānass'eva santike.

---

30. ශක්‍රයා දෙවියන් අතර ශ්‍රේෂ්ඨ වූයේ නො පමා බව නිසා ය. පණ්ඩිතයෝ නිතර ම නො පමා බවට පසසත්. පමාව හැම ද ගරහන ලද්දකි.

31. පමාවෙහි බිය දක්නා නො පමා බවෙහි ඇලුණු භික්ෂුව ලොකු කුඩා බන්ධන දවමින් ගින්නක් මෙන් (නිවන කරා ඉහළට) ගමන් කරයි.

32. පමාවෙහි බිය දක්නා නො පමා බවෙහි ඇලුණු භික්ෂුව පිරිහෙන්ට බැරි කෙනෙකි. ඔහු නිවන සමීපයෙහි වූවෙකි.

අප්‍රමාද වර්ගය නිමි.

---

30. By vigilance Sakra rose to the lordship of Gods. Vigilance is praised. Negligence is ever deprecated.

31. The Bhikkhu who delights in vigilance, and who looks with fear on negligence advances like fire burning all fetters, small and large.

32. The Bhikkhu who delights in vigilance, and who looks with fear on negligence is not liable to fall; he is close to Nibbāna.

---

## චිත්ත වග්ගෝ තතියෝ.

33. ඵන්දනං චපලං චිත්තං
දුරක්ඛං දුන්නිවාරයං;
උජුං කරෝති මේධාවී
උසුකාරෝව තේජනං.

34. වාරිජෝව ථලේ ඛිත්තෝ
ඔකමෝකත උබ්භතෝ;
පරිඵන්දතිදං චිත්තං
මාරධෙය්‍යං පහාතවේ.

35. දුන්නිග්ගහස්ස ලහුනෝ
යත්ථ කාමනිපාතිනෝ,
චිත්තස්ස දමථෝ සාධු,
චිත්තං දන්තං සුඛාවහං.

## *III. CITTAVAGGO TATIYO*

33. Phandanaṃ capalaṃ cittaṃ durakkhaṃ dunnivārayaṃ;
Ujuṃ karoti medhāvī usukāro'va tejanaṃ.

34. Vārijo' va thale khitto okamokata ubbhato,
Pariphandati'daṃ cittaṃ Māradheyyaṃ pahātave.

35. Dunniggahassa lahuno yattha kāmanipātino,
Cittassa damatho sādhu, cittaṃ dantaṃ sukhāvahaṃ.

## 3. චිත්ත වග්ගය.

33. හී වඩුවා හී දණ්ඩෙහි ඇද අරින්නාක් මෙන් බුද්ධිමතා සෙලවෙන්නා වූ, චපල වූ, රැකීමට අපහසු වූ, (අරමුණු කරා යෑමෙන්) නො වැළැක්විය හැක්කා වූ සිත සෘජු කරයි.

34. මේ සිත දියෙන් උඩට ගෙන බිම තැබූ මාලුවකු මෙන් හැම අතින් ම සැලෙයි. ඒ නිසා මාරධේය (=සංසාර චක්‍රය) නැසිය යුතු ය.

35. අල්ලා ගැනීමට අපහසු වූ, වහා ඇති ව නැති වන්නා වූ, කැමැති තැනක වැටෙන්නා වූ සිත දමනය කිරීම යහපත් ය. දැමූ සිත සුව ගෙන දේ.

## 3. THE MIND

33. The wise man straightens the fickle, unsteady mind, difficult to guard and difficult to control as the fletcher straightens the arrow.

34. As a fish drawn away from its watery abode and thrown on land this mind quivers all over. Hence the realm of Māra (Death) should be abandoned.

35. It is good to control the mind, which is hard to check. It is swift and wanders at will. A controlled mind brings happiness.

36. සුදුද්දසං සුනිපුණං
යත්ථ කාමනිපාතිනං,
චිත්තං රක්ඛේථ මේධාවී,
චිත්තං ගුත්තං සුඛාවහං.

37. දූරංගමං ඒකචරං
අසරීරං ගුහාසයං,
යේ චිත්තං සංයමෙස්සන්ති,
මොක්ඛන්ති මාරබන්ධනා.

38. අනවට්ඨිතචිත්තස්ස
සද්ධම්මං අවිජානතෝ,
පරිප්ලවපසාදස්ස
පඤ්ඤා න පරිපූරති.

36. Sududdasaṃ sunipunaṃ yattha kāmanipātinaṃ,
Cittaṃ rakkhetha medhāvī, cittaṃ guttaṃ sukhā-
vahaṃ.

37. Duraṅgamaṃ ekacaraṃ asarīraṃ guhāsayaṃ,
Ye cittaṃ saṃyamessanti, mokkhanti Mārabandhanā.

38. Anavatthitacittassa saddhammaṃ avijānato,
Pariplavapasādassa paññā na paripūrati.

36. බුද්ධිමතා දැක්මට ඉතා අමාරු වූ, ඉතා සියුම් වූ, කැමැති තැනක වැටෙන්නා වූ සිත රක්නේ ය. රක්නා ලද සිත සුව ගෙන දේ.

37. යම් කෙනෙක් කොතරම් දුර ඇති අරමුණක් කරා වුවත් යන්නා වූ, එක වර උපදනා එක් සිතකට ම සීමා වූ, සටහනක් හෝ ආකාරයක් නැති, රූප නමැති ගුහාවෙහි පවත්නා සිත තැන්පත් කර ගනිද් ද ඔවුහු මාර බන්ධනයෙන් මිදෙත්.

38. නො පිහිටි සිත් ඇති, බණ නො දන්නා වූ, ඉල්පෙන සැදැහැ ඇත්තහුගේ නුවණ නො පිරේ, හෙවත් වැඩී සම්පූර්ණ නො වේ.

36. The mind is very difficult to perceive. It is extremely subtle and wanders at will. Let the wise man guard it. A guarded mind brings happiness.

37. The mind travels far and wanders alone. It is incorporeal and seated in the cave (of heart). Those who restraine the mind are freed from the fetters of death.

38. He whose mind is unsteady, he who knows not the Noble Doctrine, he whose faith wavers, the wisdom of such a one is not perfected.

39. අනවස්සුත චිත්තස්ස
අනන්වාහතචේතසෝ
පුඤ්ඤපාපපහීණස්ස
නත්ථි ජාගරතෝ භයං.

40. කුම්භූපමං කායමිමං විදිත්වා,
නගරූපමං චිත්තමිදං ඨපෙත්වා,
යෝධේථ මාරං පඤ්ඤාවුධේන,
ජිතං ච රක්ඛෙ, අනිවේසනෝ සියා.

39. Anavassutacittassa ananvāhatacetaso
Puññapāpapahînassa natthi jāgarato bhayaṃ.

40. Kumbhūpamaṃ kāyaṃ imaṃ viditvā,
Nagarupamaṃ cittaṃ idaṃ thapetvā,
Yodhetha Māraṃ paññāvudhena.
Jitañ ca rakkhe, anivesano siyā.

39. රාගයෙන් තෙත් නො වූත්, ද්වේෂයෙන් නො ගැටුණා වූත්, පින් පව් දුරු කළා වූත් නිදි වර්ජිතයාට කෙලෙසුන්ගෙන් බියක් නැත.

40. මේ කය මැටි බඳුනක් යයි දැන, මේ සිත නුවරක් මෙන් තහවුරු ව තබා ගෙන, නුවණ නමැති ආයුධයෙන් මාරයාට පහර දිය යුතු ය. එසේ කොට දිනා ගත් තරුණ විදර්ශනාව ද රැක ගත යුතු ය. එහෙත් එ පමණිනුත් සෑහීමකට පත් නො විය යුතු ය.

39. There is no fear for a watchful man whose mind is not wetted (by lust), whose mind is not agitated (by hatred) and who has discarded both good and evil.

40. Knowing that this body is fragile as a jar, fortifying this mind as a city let the man attack Māra, (the tempter) with the weapon of wisdom. He also should guard what he has conquered and remain unattached to it.

41. අචිරං වතයං කායෝ
පඨවිං අධිසෙස්සති;
ඡුද්ධෝ අපේතවිඤ්ඤාණෝ
නිරත්ථංව කලිංගරං.

42. දිසෝ දිසං යං තං කයිරා
වේරී වා පන වේරිනං,
මිච්ඡාපණිහිතං චිත්තං
පාපියෝ නං තතෝ කරේ.

43. න තං මාතා පිතා කයිරා
අඤ්ඤේ වාපි ච ඤාතකා,
සම්මාපණිහිතං චිත්තං
සෙය්‍යසෝ නං තතෝ කරේ.

**චිත්ත වග්ගෝ නිට්ඨිතෝ.**

---

41. Aciraṃ vat'ayaṃ kāyo pathaviṃ adhisessati;
Chuddho apetaviññāṇo niratthaṃ'va kaḷiṅgaraṃ.

42. Diso disaṃ yaṃ taṃ kayirā verī vā pana verinaṃ,
Micchāpaṇihitaṃ cittam pāpiyo naṃ tato kare.

43. Na taṃ mātā pitā kayirā, aññe vā'pi ca ñātakā,
Sammāpaṇihitaṃ cittaṃ seyyaso naṃ tato kare.

---

41. ඉවත ලූ වැඩකට නැති දර කැබැල්ලක් මෙන්, මේ කය, පහ වූ සිත් ඇති ව, නො බෝ කලකින් පොළොව මත හෝනේ ය.

42. සොරෙක් තවත් සොරකුට යමක් කරන්නේ ද, වෛර කාරයෙක් තවත් වෛර කාරයකුට යමක් කරන්නේ ද, නො මනා ව යෙදූ සිත මිනිසා එයටත් වැඩියෙන් පාපියකු කරන්නේ ය.

43. මවු හෝ, පියා හෝ, අනික් නෑයෝ හෝ යම් යහපතක් කෙරේදී ද, මනා ව යෙදූ සිත මිනිසාට එයටත් වැඩි යහපතක් කරන්නේ ය.

චිත්ත වර්ගය නිමි.

---

41. Before long, alas ! this body will lie on the earth, despised, bereft of consciousness, even as a useless log.

42. Whatever an enemy may do to an enemy or a hater to a hater, an ill-directed mind may do one even far greater harm.

43. Neither mother, nor father, nor other relatives do so much; a well-directed mind does a man greater service.

---

## පුප්ඵ වග්ගෝ චතුත්ථෝ.

44. කෝ ඉමං පඨවිං විජේස්සති,
යමලෝකං ච ඉමං සදේවකං?
කෝ ධම්මපදං සුදේසිතං,
කුසලෝ පුප්ඵමිව පචෙස්සති?

45. සේඛෝ පඨවිං විජේස්සති
යමලෝකං ච ඉමං සදේවකං;
සේඛෝ ධම්මපදං සුදේසිතං
කුසලෝ පුප්ඵමිව පචෙස්සති.

46. ඵේණූපමං කායමිමං විදිත්වා,
මරීචිධම්මං අභිසම්බුධානෝ,
ඡේත්වාන මාරස්ස පපුප්ඵකානි,
අදස්සනං මච්චුරාජස්ස ගච්ඡේ.

## *IV. PUPPHAVAGGO CATUTTHO*

44. Ko imaṃ pathaviṃ vijessati, Yamalokañ ca imaṃ sadevakaṃ ?

Ko dhammapadaṃ sudesitaṃ, kusalo puppham iva pacessati ?

45. Sekho pathaviṃ vijessati Yamalokañ ca imaṃ sadevakaṃ ;

Sekho dhammapadaṃ sudesitam kusalo puppham iva pacessati.

46. Pheṇūpamaṃ kāyam imaṃ viditvā,
Marīcidhammaṃ abhisambudhāno,
Chetvāna Mārassa papupphakāni,
Adassanaṃ, Maccurājassa gacche.

## 4. පුෂ්ප වර්‍ගය.

44. කවරෙක් මේ ආත්ම භාවය නමැති පොළොවත්, යම ලෝකය (සතර අපාය) ත්, දෙව් ලොව සහිත වූ මේ මිනිස් ලොවත් පිළිවිද දැන ගන්නේ ද? දක්‍ෂ මාලා කාරයකු මල් තෝරා රැස් කරන්නාක් මෙන් කවරෙක් මනා ව දෙසන ලද සත් තිස් බෝධි පාක්‍ෂික ධර්‍මය පිළිවිස දැන ගන්නේ ද?

45. ශෛක්‍ෂයා (=සෝවාන් මග පටන් රහත් මග තෙක් ගිය සත් දෙනා) මේ ආත්ම භාවය නමැති පොළොවත්, යම ලෝකයත්, දෙව් ලොව සහිත මේ මිනිස් ලොවත් පිළිවිද දැන ගන්නේ ය. දක්‍ෂ මාලා කාරයකු මල් තෝරා රැස් කරන්නාක් මෙන් ශෛක්‍ෂයා මනා ව දෙසන ලද සත් තිස් බෝධි පාක්‍ෂික ධර්‍මය පිළිවිස දැන ගන්නේ ය.

46. මේ කය පෙණ පිඩක් බඳු බව දැන, මිරිඟුවක් බව අවබෝධ කොට, මාරයාගේ මල් (=ඔහුගේ ගති පැවතුම් වූ අකුසල්) සිඳ දමා ඔහුට නො පෙනෙන තැන වූ නිවනට යන්නේ ය.

## 4. FLOWERS

44. Who shall conquer this earth and the realm of Yama with its deities? Who shall investigate the well-delivered factors of the Doctrine as an expert searches out the flowers (for a garland).

45. The Leaner shall conquer this earth and the realm of Yama with its deities. The Learner shall investigate the well delivered factors of the Doctrine as an expert searches out the flowers (for a garland).

46. Knowing that this body is like froth, comprehending its mirage nature, breaking the flowery shafts of Māra, one will go beyond the sight of the King of death (Māra).

47. පුප්ඵානි හේව පචිනන්තං
බ්‍යාසත්තමනසං නරං,
සුත්තං ගාමං මහෝඝෝව
මච්චු ආදාය ගච්ඡති.

48. පුප්ඵානි හේව පචිනන්තං
බ්‍යාසත්තමනසං නරං,
අතිත්තං යේව කාමේසු
අන්තකෝ කුරුතේ වසං.

49. යථාපි භමරෝ පුප්ඵං
වණ්ණගන්ධං අහේඨයං
පලේති රසමාදාය,
ඒවං ගාමේ මුනී චරේ.

47. Pupphāni h'eva pacinantaṃ byāsattamanasaṃ naraṃ
Suttam gāmaṃ mah'ogho ' va maccu ādāya gacchati.

48. Pupphāni h'eva pacinantaṃ byāsattamanasaṃ naraṃ,
Atittaṃ y'eva kāmesu antako kurute vasaṃ.

49. Yathā'pi bhamaro pupphaṃ vaṇṇagandhaṃ ahethayaṃ
Paleti rasam ādāya, evaṃ gāme munī care.

47. මහ වතුරක් නිදි ගත් ගමක් ගසා හරින්නාක් මෙන්, මරුවා පස් කම් නමැති මල් ම රැස් කරන, එහි ම ඇලුණු සිත් ඇති මිනිසා ඇද ගෙන යයි.

48. මාරයා පස් කාම් නමැති මල් ම සොයන, එහි ම ඇලුණු සිත් ඇති, එයින් සෑහීමකට පත් නො වූ මිනිසා වශග කර ගනී.

49. යම් සේ බමරු මලත්, එහි පැහැය හා සුවඳත් නො පෙළා පැණි ගෙන යයි ද එසේ ම මුනිවරයා (=භික්ෂුව) ගම නො පෙළා ගමෙහි හැසිරෙන්නේ ය.

47. The man who gathers flowers (of sensual plea sures) whose mind is distracted, death carries him off as a flood a sleeping village.

48. The man who gathers flowers (of sensual pleasures) whose mind is distracted, even before he is satiated in his sensual pleasures, the destroyer brings under his sway.

49. As a bee gathers honey from a flower and flies away, without injuring the flower, its colour and scent, so let the sage wander in the village.

50. න පරේසං විලෝමානි,
න පරේසං කතාකතං;
අත්තනෝ’ව අවෙක්ඛෙය්‍ය
කතානි අකතානි ච.

51. යථාපි රුචිරං පුප්ඵං
වණ්ණවන්තං අගන්ධකං,
එවං සුභාසිතා වාචා
අඵලා හෝති අකුබ්බතෝ.

52. යථාපි රුචිරං පුප්ඵං
වණ්ණවන්තං සගන්ධකං,
ඒවං සුභාසිතා වාචා
සඵලා හෝති සකුබ්බතෝ.

50. Na paresaṃ vilomāni, na paresaṃ katākataṃ,
Attano’va avekkheyya katāni akatāni ca.

51. Yathā‘pi ruciraṃ pupphaṃ vaṇṇavantaṃ agandhakaṃ,
Evaṃ subhāsitā vācā aphalā hoti akubbato.

52. Yathā‘pi ruciraṃ pupphaṃ vaṇṇavantaṃ sagandhakaṃ,
Evaṃ subhāsitā vācā saphalā hoti sakubbato.

50. අනුන්ගේ රළු පරළු කථාත්, අනුන් කළ නො කළ දේත් නො සෙවිය යුතු ය. තමා (ගේ) ම කළ නො කළ දේ සෙවිය යුතු ය.

51. මනහර මලක් වර්ණවත් වුවත් සුවඳ නැත් නම් නිෂ්ඵල වන්නේ යම් සේ ද, එසේ ම නො පිළිපදින්නාට හොඳ වචනයෙන් පලක් නැත.

52. වර්ණයෙන් මෙන් ම සුවඳින් යුත් මනහර මලක් ප්‍රයෝජනවත් වන්නේ යම් සේ ද, එසේ ම පිළිපදින්නාට යහපත් වචනයෙන් පල ලැබේ.

50. One should not regard the faults of others, things done and left undone by others; but one's own deeds of commission and ommission.

51. As a flower that is lovely and colourful, but is scentless, even so fruitless is the well-spoken word of one who does not practise it.

52. As a flower that is lovely and colourful and fragrant, even so fruitful is the well-spoken word of one who practises it.

53. යථාපි පුප්ඵරාසිම්හා
කයිරා මාලාගුණේ බහූ,
ඒවං ජාතේන මච්චේන
කත්තබ්බං කුසලං බහුං.

54. න පුප්ඵගන්ධෝ පටිවාතමේති,
න චන්දනං තගරමල්ලිකා වා,
සතං ච ගන්ධෝ පටිවාතමේති,
සබ්බා දිසා සප්පුරිසෝ පවාති.

55. චන්දනං තගරං වාපි
උප්පලං අථ වස්සිකී,
ඒතේසං ගන්ධජාතානං
සීලගන්ධෝ අනුත්තරෝ.

53. Yathā'pi puppharāsimhā kayirā mālāguṇe bahū,
Evaṃ jātena maccena kattabbaṃ kusalaṃ bahuṃ.

54. Na pupphagandho pativātam eti,
Na candanaṃ tagaramallikā vā,
Satañ ca gandho pativātam eti,
Sabbā disā sappuriso pavāti.

55. Candanaṃ tagaraṃ vā'pi uppalaṃ atha vassikī,
Etesaṃ gandhajātānaṃ sīlagandho anuttaro.

53. මල් රැසකින් බොහෝ මල් දම් ගොතන්නේ යම් සේ ද, එසේ ම, උපන් මිනිසා විසින් බොහෝ කුසල් කටයුතු ය.

54. සාමාන්‍ය මල් සුවඳක් හෝ, සඳුන්, තුවරලා ඉද්ද වැනි මල්වල සුවඳක් හෝ උඩු සුළඟට නො යයි. එහෙත් සත්පුරුෂයන්ගේ (සිල්) සුවඳ උඩු සුළඟට ද යයි. සත්පුරුෂයා සියලු දිශාවල ම සිල් සුවඳ පතුරුවයි.

55. සඳුන්, තුවරලා, මහනෙල්, දෑසමන් යන සියලු මල් ජාතීන්ගේ සුවඳට වඩා සිල් සුවඳ උසස් ය.

53. As many garlands are made from a heap of flowers so many good deeds should be done by one born a mortal.

54. The scent of flowers, of sandal-wood, of Tagara and of jasmine blows not against the wind. But the fragrance of the virtuous blows against the wind. The virtuous man pervades in all directions.

55. Sandal-wood, Tagara, water-lily, wild jasmine—of all these kinds of perfumes, the perfume of virtue is by far the best.

56. අප්පමත්තෝ අයං ගන්ධෝ
යායං තගර චන්දනී,
යෝ ච සීලවතං ගන්ධෝ
වාති දේවේසු උත්තමෝ.

57. තේසං සම්පන්නසීලානං
අප්පමාද විහාරිනං
සම්මදඤ්ඤා විමුත්තානං
මාරෝ මග්ගං න වින්දති.

58. යථා සංකාරධානස්මිං
උජ්ඣිතස්මිං මහාපථේ,
පදුමං තත්ථ ජායේථ
සුචිගන්ධං මනෝරමං—

56. Appamatto ayaṃ gandho yāyaṃ tagaracandanī,
Yo ca sīlavataṃ gandho vāti devesu uttamo.

57. Tesaṃ sampannasīlānaṃ appamādavihārinaṃ
Sammadaññā vimuttānaṃ Māro maggaṃ na vindati.

58. Yathā saṅkāradhānasmiṃ ujjhitasmiṃ mahāpathe,
Padumaṃ tattha jāyetha sucigandhaṃ manoramaṃ.

56. තුවරලා, සඳුන් ආදියෙහි යම් සුවඳක් වේ නම් එය ඉතා සුළු ය; හෙවත් සුළු තැනක විහිදෙන්නකි. සිල්වතුන්ගේ උතුම් සුවඳ දෙව් ලෝවල පවා විහිදේ.

57. සීල ගුණයෙන් පොහොසත් වූ, නො පමා විහරණ ඇති, චතුරාර්‍ය සත්‍යය මනා ව අවබෝධ කොට දුකින් මිදුණා වූ ඒ උතුමන් ගිය මඟ මාරයා නො දනී.

58. මහ පාරේ දැමූ කසල ගොඩකත් හොඳ සුවඳ ඇති මනහර වූ නෙළුම් මලක් පිපෙන්නේ හෙවත් පිපී බබළන්නේ යම් සේ ද,

56. Little is the fragrance of Tagara and Sandal, but the fragrance of the virtuous blows even amongst the Gods as the highest

57. Māra, the tempter finds not the path of those who are virtuous, vigilant in living, and delivered by perfect knowledge.

58 As on a heap of rubbish thrown on the highway grows a sweet smelling lovely lotus,

59. ඒවං සංකාරභූතේසු
අන්ධභූතේ පුථුජ්ජනේ,
අතිරෝචති පඤ්ඤාය
සම්මා සම්බුද්ධසාවකෝ.

**පුප්ඵ වග්ගෝ නිට්ඨිතෝ.**

---

59. Evaṃ saṅkārabhūtesu andhabhūte puthujjane,
Atirocati paññāya Sammāsambuddhasāvako.

---

59. එසේ ම, කසල ගොඩවල් වැනි වූ අන්ධ බාල මිනිසුන් අතර බුද්ධ ශ්‍රාවකයා නුවණින් බබළයි.

පුෂ්ප වර්ගය නිමි.

---

59. Even so among those blinded mortals, who are like unto rubbish, a disciple of the fully Enlightened One outshines in wisdom.

---

## බාල වග්ගෝ පංචමෝ.

60. දීඝා ජාගරතෝ රත්ති,
දීඝං සන්තස්ස යෝජනං,
දීඝෝ බාලානං සංසාරෝ
සද්ධම්මං අවිජානතං.

61. චරං චේ නාධිගච්ඡෙය්‍ය
සෙය්‍යං සදිසමත්තනෝ,
ඒකචරියං දළ්හං කයිරා;
නත්ථි බාලේ සහායතා.

62. පුත්තා මත්ථි ධනම්මත්ථි
ඉති බාලෝ විහඤ්ඤති,
අත්තා හි අත්තනෝ නත්ථි,
කුතෝ පුත්තා? කුතෝ ධනං?

## *V. BĀLAVAGGO PAÑCAMO*

60. Dīghā jāgarato ratti, dīghaṃ santassa yojanaṃ,
Dīgho bālānaṃ saṃsāro saddhammaṃ avijānataṃ,

61. Carañ ce nādhigaccheyya seyyaṃ sadisam attano,
Ekacariyaṃ daḷhaṃ kayirā; natthi bāle sahāyatā.

62. Puttā m'atthi dhanaṃ m'atthi iti bālo vihaññati,
Attā hi attano natthi, kuto puttā ? kuto dhanaṃ ?

## 5. බාල වර්ගය

60. නිදි මරන්නාට රැය දිග ය. ගමන් ගොස් වෙහෙසුණහුට යොදුන දිග ය. බණ නො දන්නා වූ මෝඩයන්ට සසර දිග ය.

61. කල්‍යාණ මිත්‍රයකු සොයා ඇවිදින්නකුට තමාට වඩා උසස් කෙනෙක් හෝ, තමාට සමාන කෙනෙක් හෝ නො ලැබෙත් නම් තනි ව හැසිරීමේ අදහස දැඩි කර ගත යුතු ය. බාලයන් - මෝඩයන් - හා එක් වීම හොඳ නැත.

62. මෝඩයා 'මට දරුවෝ ඇත, මට ධනය ඇත' කියා සිතමින් වෙහෙසෙයි. තමාට තමාත් නැති කල මොන පුත්තු ද? මොන ධනය ද?

## V. THE FOOL

60. Long is the night to the wakeful; long is the Yojana (league) to the weary; long is the chain of existence to the foolish who do not know the sublime truth.

61. If a seeker meets not a companion who is better or equal let him firmly pursue his solitary journey. There is no companionship with the foolish.

62. 'I have sons', 'I have wealth,' thinking thus the fool is tormented. Verily, he himself is not his own. Whence sons? Whence wealth?

63. යෝ බාලෝ මඤ්ඤති බාල්‍යං
පණ්ඩිතෝ වාපි තේන සෝ,
බාලෝ ච පණ්ඩිතමානී
ස වේ බාලෝති වුච්චති.

64. යාවජීවම්පි චේ බාලෝ
පණ්ඩිතං පයිරුපාසති,
න සෝ ධම්මං විජානාති
දබ්බී සූපරසං යථා.

65. මුහුත්තමපි චේ විඤ්ඤූ
පණ්ඩිතං පයිරුපාසති,
ඛිප්පං ධම්මං විජානාති
ජිව්හා සූපරසං යථා.

63. Yo bālo maññati bālyaṃ paṇḍito vā'pi tena so,
Bālo ca paṇḍitamānī sa ve bālo'ti vuccati.

64. Yāvajīvam pi ce bālo paṇḍitaṃ payirupāsati,
Na so dhammaṃ vijānāti dabbī sūparasaṃ yathā.

65. Muhuttam api ce viññu paṇḍitaṃ payirupāsati,
Khippaṃ dhammaṃ vijānāti jivhā sūparasaṃ yathā.

63. යම් මෝඩයකුට තමාගේ මෝඩකම ගැන හැඟේ නම් එසින් මත් ඔහු පණ්ඩිතයෙක් වේ. තමා පණ්ඩිතයෙකැ යි සිතන මෝඩයා ඒකාන්තයෙන් ම මෝඩයෙකි; හෙවත් කිසි ම සැකයක් නැති ව ඔහුට මෝඩයෙකැ යි කියනු ලැබේ.

64. හැන්දට මාළුපිණි රස නො දැනෙන්නාක් මෙන් මෝඩයාට දිවි පවත්නා තාක් පණ්ඩිතයකු ඇසුරු කළත් ධර්මය දැන ගත නො හැකි ය.

65. දිවට මාළුපිණි රස දැනෙන්නාක් මෙන් බුද්ධිමතාට මොහොතක් වුවත් පණ්ඩිතයකු ඇසුරු කිරීමෙන් වහා ධර්මය දැන ගත හැකි ය.

63. The fool who is aware of his foolishness is wise at least to that extent. But the fool who thinks himself wise is called a fool indeed.

64. Though a fool associates with a wise man even all his life he does not more perceive the truth than a spoon, the flavour of soup.

65. Though even for a moment, an intelligent man associates with a wise man, he perceives the truth quickly as the tongue, the flavour of the soup.

66. චරන්ති බාලා දුම්මේධා
අමිත්තේනේව අත්තනා,
කරොන්තා පාපකං කම්මං
යං හෝති කටුකප්ඵලං.

67. න තං කම්මං කතං සාධු
යං කත්වා අනුතප්පති,
යස්ස අස්සුමුඛෝ රෝදං
විපාකං පටිසේවති

68. තං ච කම්මං කතං සාධු
යං කත්වා නානුතප්පති,
යස්ස පතීතෝ සුමනෝ
විපාකං පටිසේවති.

66. Caranti bālā dummedhā amitten 'eva attanā,
Karontā pāpakaṃ kammaṃ yaṃ hoti katukapphalaṃ.

67. Na taṃ kammaṃ kaṭaṃ sādhu yaṃ katvā anutappati,
Yassa assumukho rodaṃ vipākaṃ patisevati.

68. Tañ ca kammaṃ kataṃ sādhu yaṃ katvā nānutappati,
Yassa patīto sumano vipākaṃ patisevati.

66. නුවණ මඳ මෝඩයෝ කටුක විපාක ගෙන දෙන පව්කම් කරමින් තමන්ට ම සතුරු වූ ආත්මයක් සමඟ හැසිරෙත්.

67. යමක් කොට පසු තැවෙන්ට වේ ද, යමක විපාකය කඳුළු පිරුණු මූණින් යුක්ත ව අඬමින් විඳින්ට සිදු වේ ද එබඳු දේ නො කිරීම යහපත් ය.

68. යමක් කොට පසු තැවෙන්ට නො වේ ද, යමක විපාකය ප්‍රීතියෙන් හා සොම්නසින් යුක්ත ව විඳිය හැකි ද එබඳු දේ කිරීම යහපත් ය.

66. Fools of little wit, being enemies to themselves, move about doing evil deeds the fruit whereof is bitter.

67. The deed is not well done, which being done, one afterwards repents, and the fruit whereof one receives weeping and with tearful face.

68. The deed is well done, which being done, one afterwards repents not, and the fruit whereof one receives with delight and happiness.

69. මධුවා මඤ්ඤති බාලෝ
යාව පාපං න පච්චති,
යදා ච පච්චති පාපං
අථ බාලෝ දුක්ඛං නිගච්ඡති.

70. මාසේ මාසේ කුසග්ගේන
බාලෝ භුඤ්ජේථ භෝජනං,
න සෝ සංඛතධම්මානං
කලං අග්ඝති සෝළසිං.

71. න හි පාපං කතං කම්මං
සජ්ජු ඛීරංව මුච්චති,
ඩහන්තං බාලමන්වේති
භස්මච්ඡන්නෝව පාවකෝ.

69. Madhu'vā maññatī bālo yāva pāpaṃ na paccati,
Yadā ca paccatī pāpaṃ atha bālo dukkhaṃ nigacchati.

70. Māse māse kusaggena bālo bhuñjetha bhojanaṃ,
Na so sankhatadhammānaṃ kalaṃ agghati soḷasiṃ.

71. Na hi pāpaṃ kataṃ kammaṃ sajju khīraṃ' va muccati,
Ḍahantaṃ bālam anveti bhasmacchanno' va pāvako.

69. මෝඩයා පව මෝරා විපාක දෙන තෙක් එය මී පැණි මෙන් සලකයි. යම් විටක පව මෝරා විපාක දෙයි ද එ විට ඔහු දුකට වැටේ.

70. මෝඩයා (=කුහකයා) මසක් පාසා කුස තණ අගින් ගෙන බොජුන් වළඳයි. එහෙත් ඔහු චතුරාර්‍ය සත්‍යය පිරිසිඳ දත් ආර්යයන්ගේ සොළොස් වන කලාව තරම් වත් නො වටනේ ය.

71. දෙවූ වහා ම කිරි නො මිදෙන්නාක් මෙන් කෙනකු කළ පව වහා නො මෝරයි. එය අළු යට වූ ගින්නක් මෙන් මෝඩයා දවමින් (ඔහු) ලුහුබඳී.

69. So long as an evil deed does not ripen the fool thinks that it is like honey; but when it ripens, then the fool comes to grief.

70. A foo month after month may eat his food with the Kusa grass blade, but he is not worth the sixteenth part of those who have comprehended the Truth.

71. An evil deed committed immediately bears no fruit, like newly drawn milk curdles not at once; smouldering, like fire covered by ashes, it follows the fool.

72. යාවදේව අනත්ථාය
ඤත්තං බාලස්ස ජායති;
හන්ති බාලස්ස සුක්කංසං
මුද්ධමස්ස විපාතයං.

73. අසතං භාවනමිච්ඡෙය්‍ය
පුරෙක්ඛාරං ච භික්ඛුසු,
ආවාසේසු ච ඉස්සරියං
පූජා පරකුලේසු ච.

72. Yāvad'eva anatthāya ñattaṃ bālassa jāyati;
Hanti bālassa sukkaṃsaṃ muddham assa vipātayaṃ.

73. Asataṃ bhāvanam iccheyya purekkhārañ ca bhikkhusu,
Āvāsesu ca issariyaṃ pūjā parakulesu ca.

72. මෝඩයා දත් යම් දෙයක් ඇත් නම් ඒ සියල්ල ඔහුගේ අනර්ථය පිණිස පවතී. එය ඔහුගේ නුවණ නමැති හිස පොඩි කර කුසල් නමැති යහපත් ගති ගුණ නසා ලයි.

73. අයහපත් හිස් භික්ෂුව අනුන්ගේ ගරු බුහුමන් කැමැති වේ; භික්ෂූන් අතර පෙරටු බව කැමැති වේ; ආවාසයන්හි අධිපතිකම කැමැති වේ; නො නෑ කුලයන්හි පුද සැලකිලි කැමැති වේ.

72. Verily, the knowledge that a fool acquires stands only for his ruin. It destroys his bright lot and cleaves his head (wisdom).

73. The fool wishes undue reputation, precedence among monks, authority over monasteries and honour among other family groups.

74. මමේව කතමඤ්ඤන්තු
ගිහී පබ්බජිතා උභෝ,
මමේව අතිවසා අස්සු
කිච්චාකිච්චේසු කිස්මිචි,
ඉති බාලස්ස සංකප්පෝ
ඉච්ඡා මානෝ ච වඩ්ඪති.

75. අඤ්ඤා හි ලාභූපනිසා,
අඤ්ඤා නිබ්බාණගාමිනී,
ඒවමේතං අභිඤ්ඤාය
භික්ඛු බුද්ධස්ස සාවකෝ
සක්කාරං නාභිනන්දෙය්‍ය;
විවේකමනුබ්‍රෑහයේ.

**බාල වග්ගෝ නිට්ඨිතෝ.**

---

74. Mam eva kata maññantu gihī pabbajitā ubho,
Mam'eva ativasā assu kiccākiccesu kismici,
Iti bālassa saṅkappo icchā māno ca vaḍḍhati.

75. Aññā hi lābhūpanisā, aññā nibbānagāminī,
Evam etaṃ abhiññāya bhikkhu Buddhassa sāvako,
Sakkāraṃ nābhinandeyya; vivekam anubrūhaye.

74. 'ගිහි පැවිදි දෙ ගොල්ල ම පන්සලේ සියලු වැඩ මා විසින් කරන ලදැ යි ද, සියලු කටයුතු නො කටයුතුවල දී ඔවුහු මට පක්ෂ වෙත්වා!' යි ද සිතයි. මේ අයුරින් මෝඩයාගේ මෝඩ කල්පනාව ද, ආශාව ද, මානය ද වැඩේ.

75. ලාභ සත්කාර උපදවන පිළිවෙත එකකි; නිවන කරා ලං වන පිළිවෙත අනිකකි. බුද්ධ ශ්‍රාවක වූ භික්ෂුව මෙය මෙසේ දැන ලාභ සත්කාරවලට සතුටු නො විය යුතු ය. විවේකය වැඩිය යුතු ය.

බාල වර්ගය නිමි.

---

74. 'Let the laymen and the monks think that this is done by me. Let them refer to me in what should be done and what should not be done'—such is the ambition of the fool, so his desire and pride increase.

75. The path that leads to gain is one. The path that leads to Nibbāna is another. Thus understanding this, let the monk, the disciple of the Buddha take no delight in the favours (of men) but give himself over to solitude.

---

## පණ්ඩිත වග්ගෝ ඡට්ඨෝ.

76. නිධීනංව පවත්තාරං
යං පස්සේ වජ්ජදස්සිනං,
නිග්ගය්හවාදිං මේධාවිං
තාදිසං පණ්ඩිතං භජේ;
තාදිසං භජමානස්ස
සෙය්‍යෝ හෝති න පාපියෝ.

77. ඕවදෙය්‍යානුසාසෙය්‍ය,
අසබ්භා ච නිවාරයේ;
සතං හි සෝ පියෝ හෝති,
අසතං හෝති අප්පියෝ.

## *VI. PAṆḌITAVAGGO CHAṬṬHO*

76. Nidhīnaṃ va pavattāraṃ yaṃ passe vajjadassinaṃ,
Niggayhavādiṃ medhāviṃ tādisaṃ paṇḍitaṃ bhaje;
Tādisaṃ bhajamānassa seyyo hoti na pāpiyo.

77. Ovadeyyanusāseyya, asabbhā ca nivāraye;
Sataṃ hi so piyo hoti, asataṃ hoti appiyo.

## 6. පණ්ඩිත වර්ගය.

76. යමෙක් නිධානයක් දක්වන්නකු මෙන් කෙනකුගේ ඇති වරද දකිසි ද, එයට තරවටු කරසි ද, එබඳු වූ බුද්ධිමත් පඬුවකු සේවනය කළ යුතු ය. එබඳු කෙනකු ඇසුරු කරන්නාට වැඩක් ම වේ. අවැඩක් නො වේ.

77. පණ්ඩිතයා අනුන්ට අවවාද කළ යුතු ය; අනුශාසනා කළ යුතු ය. අනුන් අසභ්‍ය දෙසින් – අකුසලයෙන් – වැළැක්විය යුතු ය. එසේ කරන්නා සත්පුරුෂයන්ට ප්‍රිය වේ. අසත්පුරුෂයන්ට අප්‍රිය වේ.

## VI. THE WISE

76. If a person sees a wise man, who, as if indicating a hidden treasure, points out faults and reproves, he should associate with such a wise one. It fares well and not ill to have the acquaintance of such a one.

77. Let him admonish, instruct and restrain from wrong. He becomes beloved of the good and detestable to the bad.

78. න භජෙ පාපකෙ මිත්තෙ,
න භජෙ පුරිසාධමෙ;
භජේථ මිත්තෙ කල්‍යාණෙ,
භජේථ පුරිසුත්තමෙ.

79. ධම්මපීති සුඛං සේති
විප්පසන්නේන චේතසා,
අරියප්පවේදිතේ ධම්මේ
සදා රමති පණ්ඩිතෝ.

80. උදකං හි නයන්ති නෙත්තිකා,
උසුකාරා නමයන්ති තේජනං,
දාරුං නමයන්ති තච්ඡකා,
අත්තානං දමයන්ති පණ්ඩිතා.

78. Na bhaje pāpake mitte, na bhaje purisādhame,
Bhajetha mitte kalyāne, bhajetha puris'uttame.

79. Dhammapīti sukhaṃ seti vippasannena cetasā,
Ariyappavedite dhamme sadā ramati paṇḍito.

80. Udakaṃ hi nayanti nettikā,
Usukārā namayanti tejanaṃ,
Dāruṃ namayanti tacchakā,
Attānaṃ damayanti paṇḍitā.

78. පව්වු - නරක - මිතුරන් ඇසුරු නො කළ යුතු ය. අධම - පහත් - මිනිසුන් ඇසුරු නො කළ යුතු ය. කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කළ යුතු ය. උතුම් මිනිසුන් ඇසුරු කළ යුතු ය.

79. දහම් රසය බොන්නා පහන් සිතින් සුව සේ වෙසේ. පණ්ඩිතයා ආර්යයන් ප්‍රකාශ කළ ධර්මයෙහි හැම දා ඇලේ.

80. දියඑළුවෝ තමන් කැමැති තැනට දිය ගෙන යත්. ඊ වඩුවෝ තමන් කැමැති පරිදි ඊ දඬු නමත්. වඩුවෝ තමන්ට ඕනෑ විධියට ලී නමත්. පණ්ඩිතයෝ තමන්ට වුවමනා පිළිවෙළට ආත්මය දමනය කරත්.

78. Associate not with evil friends, associate not with despicable men. Associate with good friends. Associate with noble men.

79. He who imbibes the Dhamma (Doctrine) lives happily with a serene mind. The wise man ever rejoices in the Dhamma delivered by the Nobles.

80. Irrigaters lead the water. Fletchers shape the shaft. Carpenters bend the wood. The wise restrain themselves.

81. සේලෝ යථා ඒකඝනෝ
වාතේන න සමීරති,
ඒවං නින්දා පසංසාසු
න සමිඤ්ජන්ති පණ්ඩිතා.

82. යථාපි රහදෝ ගම්භීරෝ
විප්පසන්නෝ අනාවිලෝ,
ඒවං ධම්මානි සුත්වාන
විප්පසීදන්ති පණ්ඩිතා.

83. සබ්බත්ථ වේ සප්පුරිසා වජන්ති,
න කාමකාමා ලපයන්ති සන්තෝ;
සුඛේන ඵුට්ඨා අථ වා දුඛේන,
න උච්චාවචං පණ්ඩිතා දස්සයන්ති.

81. Selo yathā ekaghano vātena na samīrati,
Eva nindāpasaṃsāsu na samiñjanti paṇḍitā.

82. Yathāpi rahado gambhīro vippasanno anāvilo,
Evaṃ dhammāni sutvāna vippasīdanti paṇḍitā.

83. Sabbattha ve sappurisā cajanti, na kāmakāmā lapayanti santo;

Sukhena phutthā atha vā dukhena, na uccāvacaṃ paṇḍitā dassayanti.

81. ඝන ගල් පව්ව වාතයෙන් නො සෙල්වෙන්නේ යම් සේ ද, එසේ ම, නින්දා, ප්‍රශංසා දෙක්හි දී පණ්ඩිතයෝ නො සැලෙත්.

82. පැහැදිලි දිය ඇති, නො කැලඹුණු, ගැඹුරු විල යම් සේ ද, බණ අසා පැහැදුණු පණ්ඩිතයෝත් එසේ ම ය.

83. සත්පුරුෂයෝ සියලු තැන ඇල්ම අත් හරිත්; ඒ ඒ දේ ගැන ආශාවෙන් කථා නො කරත්; නො කරවත්. පණ්ඩිතයෝ සැපෙහි දී මෙන් ම දුකෙහි දීත් උස් පහත් ගතියක් නො දක්වත්.

81. As a solid rock is unshaken by the wind, so the wise are unmoved amidst blame and praise.

82. Even as a lake, deep, clear and still, so the wise become well clarified on listening the Teachings.

83. Verily, the good renounce attachment for everything. The saintly do not prattle yearning for pleasures. The wise do not show elation or depression affected by happiness or by sorrow.

84. න අත්තහේතු, න පරස්ස හේතු,
න පුත්තමිච්ඡෙ, න ධනං, න රට්ඨං,
න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධිමත්තනෝ;
ස සීලවා පඤ්ඤවා ධම්මිකෝ සියා.

85. අප්පකා තේ මනුස්සේසු
යේ ජනා පාරගාමිනෝ,
අථායං ඉතරා පජා
තීරමේවානුධාවති.

86. යේ ච ඛෝ සම්මදක්ඛාතේ
ධම්මේ ධම්මානුවත්තිනෝ,
තේ ජනා පාරමෙස්සන්ති,
මච්චුධෙය්‍යං සුදුත්තරං.

84. Na attahetu, na parassa hetu, na puttam icche, na dhanaṃ, na raṭṭhaṃ,

Na iccheyya adhammena samiddhim attano; sa sīlavā paññavā dhammiko siyā.

85. Appakā te manussesu ye janā pāragāmino,
Athāyaṃ itarā pajā tīram evānudhāvati.

86. Ye ca kho sammadakkhāte dhamme dhammānuvattino,
Te janā pāram essanti, maccudheyyaṃ suduttaraṃ.

84. යමෙක් තමා නිසා හෝ, අනුන් නිසා හෝ පවක් නො කරයි ද වැරදි පිළිවෙළකින් පුතකු හෝ, ධනය හෝ, රටක් හෝ නො පතයි ද, අධර්මයෙන් තමාගේ වැඩි දියුණුවක් බලාපොරොත්තු නො වෙයි ද, ඔහු සිල්වතෙකි; බුද්ධිමතෙකි; ධාර්මිකයෙකි.

85. මිනිසුන් අතුරෙහි පර තෙරට (නිවනට) යන්නෝ ටික දෙනෙකි. සෙස්සෝ මෙ තෙරට (භවයට) ම දිවෙත්.

86. යම් කෙනෙක් බුදුන් විසින් මනා කොට වදාළ ධර්මය දැන ඒ අනුව පවතිද් ද, ඔවුහු ඉතා අමාරුවෙන් එතර කළ යුතු මාරධේය (=සංසාර සාගරය) තරණය කොට නිවනට යන්නාහ.

84. One, for one's own sake or for the sake of another, should not wish for a son, wealth or kingdom. One should not wish one's success by unfair means. Such a one is indeed virtuous, wise and righteous.

85. There are few among men who reach the farther shore. But the rest of this mankind run along the hither bank.

86. Those, who rightly follow the Teaching which has been well delivered, will pass to the other shore, the realm of Death which is very difficult to cross.

87. කණ්හං ධම්මං විප්පහාය
සුක්කං භාවේථ පණ්ඩිතෝ,
ඔකා අනෝකං ආගම්ම
විවේකේ යත්ථ දූරමං—

88. තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය
හිත්වා කාමේ අකිංචනෝ,
පරියෝදපෙය්‍ය අත්තානං
චිත්තක්ලේසේහි පණ්ඩිතෝ.

89. යේසං සම්බෝධිඅංගේසු
සම්මා චිත්තං සුභාවිතං,
ආදානපටිනිස්සග්ගේ
අනුපාදාය යේ රතා,
ඛීණාසවා ජුතිමන්තෝ
තේ ලෝකේ පරිනිබ්බුතා.

**පණ්ඩිත වග්ගෝ නිට්ඨිතෝ.**

---

87. Kaṇhaṃ dhammaṃ vippahāya sukkaṃ bhāvetha paṇḍito,
Okā anokaṃ āgamma, viveke yattha dūramaṃ—

88. Tatrābhiratim iccheyya hitvā kāme akiñcano,
Pariyodapeyya attānaṃ cittakkleshi paṇḍito.

89. Yesaṃ sambodhiangesu sammā cittaṃ subhāvitaṃ,
Ādānapatinissagge anupādāya ye ratā,
Khīṇāsavā jutīmanto te loke parinibbutā.

87. පණ්ඩිතයා හෙවත් පණ්ඩිත භික්ෂුව අකුසල් හැර දමා කුසල් වැඩිය යුතු ය. ගිහි ගෙය හැර පැවිදි වූ පුද්ගලයා දුකා සේ සිත් ඇලවිය යුතු තැන වූ-

88. නිවනෙහි සිත් ඇලවිය යුතු ය. ඔහු ලෝභය හැර දැමිය යුතු ය; කිසි ම දෙයක අයිතියක් නැත්තකු විය යුතු ය. එසේ වී, සිත කිලිටි කරන අකුසල්වලින් මිදී ආත්මය පිරිසිදු කර ගත යුතු ය.

89. යම් කෙනකුන්ගේ සිත සම්බෝධි අංගයන්හි මනා කොට වඩන ලද ද, යම් කෙනෙක් ආශාවෙන් කිසිවක් නො ගෙන නිවනෙහි ඇලුණාහු ද ඒ ආනුභාව සම්පන්න රහත්හු ලෝකයෙහි පිරිනිවියාහු වෙත්.

පණ්ඩිත වර්ගය නිමි.

---

87. After coming from home to the homeless let the wise man leave the way of darkness and follow the way of light. He should seek delight in solitude which is hard to love.

88. Abandoning all sensual pleasures, calling nothing his own, let the wise man rejoice there and cleanse himself from all the impurities of mind.

89. They, whose minds are well grounded in the factors of Enlightenment, they who, without hankering after anything rejoice in freedom from attachment, they, the corruption-free, shining ones, attain Nibbāna in this world.

---

## අරහන්ත වග්ගෝ සත්තමෝ.

90. ගතද්ධිනෝ විසෝකස්ස
විප්පමුත්තස්ස සබ්බධි,
සබ්බගන්ථප්පහීනස්ස
පරිළාහෝ න විජ්ජති.

91. උය්‍යුඤ්ජන්ති සතිමන්තෝ
න නිකේතේ රමන්ති තේ,
හංසාව පල්ලලං හිත්වා
ඕකමෝකං ජහන්ති තේ.

## *VII. ARAHANTAVAGGO SATTAMO*

90. Gat‘addhino visokassa vippamuttassa sabbadhi
Sabbaganthappahīnassa pariḷāho na vijjati.

91. Uyyuñjanti satīmanto, na nikete ramanti te,
Haṃsā ‘ va pallalaṃ hitvā ōkam okaṃ jahanti te.

## 7. අර්හත් වර්ගය.

90. සසර ගමන ඉවර කළ, ශෝක දුරු කළ, සෑම තන්හි (තැනින්) මිදුණු, සියලු කෙලෙස් ගැට දුරු කළ රහතන් වහන්සේට දැවිල්ලක් නැත.

91. මනා සිහි ඇත්තෝ උනන්දුවෙන් ධ්‍යාන භාවනාංයෙහි යෙදෙත්. ඔවුහු (කිසි) තැනක නො ඇලෙත්. විල හැර යන හංසයන් මෙන් ඔවුහු වසන හැම තැනක් ම හැර දමා යත්.

## VII. THE WORTHY

90. For him who has completed the journey, who is sorrowless, wholly set free and rid of all fetters, there exists no fever of passions.

91. The mindful exert themselves; they do not delight in an abode; like swans who leave their lake, they leave home after home.

92. යේසං සන්නිචයෝ නත්ථි
යේ පරිඤ්ඤාතභෝජනා,
සුඤ්ඤතෝ අනිමිත්තෝ ච
විමොක්ඛෝ යේසං ගෝචරෝ,
ආකාසේව සකුන්තානං
ගති තේසං දුරන්නයා.

93. යස්සාසවං පරික්ඛීණා
ආහාරේ ච අනිස්සිතෝ,
සුඤ්ඤතෝ අනිමිත්තෝ ච
විමොක්ඛෝ යස්ස ගෝචරෝ,
ආකාසේව සකුන්තානං
පදං තස්ස දුරන්නයං.

92. Yesaṃ sannicayo natthi, ye pariññātabhojanā,
Suññato animitto ca vimokkho yesaṃ gocaro,
Ākāse ‘ va sakuntānaṃ gati tesaṃ durannayā.

93. Yassāsavā parikkhīnā, āhāre ca anissito,
Suññato animitto ca vimokkho yassa gocaro.
Ākāse‘ va sakuntānaṃ padaṃ tassa durannayaṃ.

92. යම් කෙනකුන්ගේ කර්මය හෝ සිවු පසය රැස් කිරීමක් නැද් ද, යම් කෙනෙක් තමන්ගේ භෝජන සීමාව පිරිසිඳ දන්නෝ ද, යම් කෙනකුන්ට රාගාදියෙන් මිදුණා වූත්, රාගාදි නිමිති රහිත වූත් නිවන අරමුණු වේ ද, එබඳු රහතුන් මරණින් මතු ගිය මඟ හෝ යන මඟ නො දත හැකි ය; අහසෙහි කුරුල්ලන් ගිය මඟ නො දත හැකිවා මෙනි.

93. යමකුගේ ආශ්‍රව හාත්පසින් ම දුරු වූයේ ද, යමෙක් ආහාරයෙහි නො ඇලුණේ ද, යමකුට රාගාදියෙන් මිදුණා වූත්, රාගාදි නිමිති රහිත වූත් නිවන අරමුණ වේ ද, එබඳු පුද්ගලයා ගිය තැන නො දත හැකි ය. අහසෙහි කුරුල්ලන් ගිය මඟ නො දත හැකිවා මෙනි.

92. Those who have no accumulation, who reflect well over their food, whose object is the void and the unconditioned freedom, their course cannot be traced like that of birds through the sky.

93. He whose passions are destroyed, who is indifferent to food, whose object is the void and the unconditioned freedom his path cannot be traced like that of birds through the sky.

94. යස්සින්ද්‍රියානි සමථං ගතානි
අස්සා යථා සාරථිනා සුදන්තා,
පහීණමානස්ස අනාසවස්ස
දේවාපි තස්ස පිහයන්ති තාදිනෝ.

95. පඨවිසමෝ නෝ විරුජ්ඣති,
ඉන්දඛීලූපමෝ තාදි සුබ්බතෝ,
රහදෝව අපේතකද්දමෝ,
සංසාරා න භවන්ති තාදිනෝ.

96. සන්තං තස්ස මනං හෝති,
සන්තා වාචා ච කම්ම ච,
සම්මදඤ්ඤා විමුත්තස්ස
උපසන්තස්ස තාදිනෝ.

94. Yass' indriyāni samathaṅgatāni,
Assā yathā sārathinā sudantā,
Pahīnamānassa anāsavassa
Devā'pi tassa pihayanti tādino.

95. Pathavīsamo no virujjhati,
Indakhīlûpamo tādi subbato,
Rahado'va apetakaddamo,
Saṃsārā na bhavanti tādino.

96. Santaṃ tassa manaṃ hoti, santā vācā ca kamma ca
Sammadaññā vimuttassa upasant assa tādino.

94. රියැදුරා විසින් මනා ව හික්මවන ලද අසුන් මෙන් යමකුගේ ඉන්ද්‍රියයෝ සංසිඳුණාහු ද, මානය දුරු කළ, ආශ්‍රව නැති, නො සෙල්වෙන ගති ඇති ඔහුට දෙවියෝත් කැමැති ය.

95. යමෙක් පොළොව මෙන් හොඳ නො හොඳ දෙක්හි දී ම සම ව සිටී ද, ඉන්ද්‍ර කීලයක් මෙන් නො සෙල්වී පවතී ද, මනා ව්‍රත ඇති, මඩ නැති විලක් බඳු වූ ඒ රහතුන් වහන්සේගේ සසර හැසිරීමක් නැත.

96. චතුරාර්‍ය සත්‍යය මනා ව දැන ගෙන කෙලෙසුන් කෙරෙන් මිදුණු, උපශාන්ත වූ රහතුන් වහන්සේගේ සිත ද, වචනය ද, ක්‍රියාව ද එක සේ ශාන්ත ය.

94. He whose senses are subdued like horses well tamed by the charioteer, who is free from pride and taints, such a steadfast one even Gods hold dear.

95. He who is tolerant like the earth, who is as firm as the column (at the middle of a city gate), who is pious, resents not. To such a steady man, who is like a lake free from mud, there is no cycle of births and deaths.

96. When one has obtained freedom through right knowledge and has become tranquil and equipoised his mind is calm, his word as well as deed is calm.

97. අස්සද්ධො අකතඤ්ඤූ ච
සන්ධිච්ඡෙදො ච යො නරො,
හතාවකාසො වන්තාසො,
ස වෙ උත්තමපොරිසො.

98. ගාමෙ වා යදි වාරඤ්ඤෙ,
නින්නෙ වා යදි වා ථලෙ,
යත්ථාරහන්තො විහරන්ති,
තං භූමිං රාමණෙය්‍යකං.

99. රමණීයානි අරඤ්ඤානි,
යත්ථ න රමතී ජනො,
වීතරාගා රමෙස්සන්ති,
න තෙ කාමගවෙසිනො.

**අරහන්ත වග්ගො නිට්ඨිතො.**

---

97. Assaddho akataññū ca sandhicchedo ca yo naro,
Hatāvakāso vantāso, sa ve uttamaporiso.

98. Gāme vā yadi vāraññe, ninne vā yadi vā thale,
Yatthārahanto viharanti, taṃ bhūmiṃ rāmaṇeyyakaṃ.

99. Ramaṇīyāni araññāni, yattha na ramatī jano,
Vītarāgā ramessanti, na te kāmagavesino.

97. යමෙක් සිය නුවණින් වටහා ගන්නා තෙක් යමක් නො අදහයි ද, අනිකකුගේ මැවීමක් හෝ යෙදීමක් නො වූ නිවන ඒ අයුරින් ම අවබෝධ කර ගනී ද, සසර ඇති සියලු සන්ධි කඩයි ද, නැවත ඉපදීමට ඇති ඉඩය නැති කරයි ද, සියලු ආශා වමාරා දමයි ද ඔහු ඒකාන්තයෙන් ම උතුම් පුරුෂයෙකි.

98. ගමේ හෝ, වනයේ හෝ, වළක හෝ, ගොඩක හෝ, වෙන යම් තැනක හෝ රහතන් වහන්සේලා වෙසෙද් ද ඒ බිම රමණීය ය.

99. සාමාන්‍ය ජනයාගේ සිත් නො ගන්නා රමණීය කැලෑ ඇත. වීතරාගීහු කාම සැප නො සොයන හෙයින් එබඳු තැන්වල සිත් අලවා වාසය කරත්.

අර්හත් වර්ගය නිමි.

---

97. The man who is not credulous, who knows the uncreated, who has served all ties, who has put an end to all (good and bad) occations, who has vomitted all desires, he, indeed, is the most exalted among men.

98. Be it in village, in forest, in vale or on dry land, wherever the Arahantas (saints) dwell, that place is indeed delightful.

99. Delightful are the forests where ordinary masses find no delight. There the passionless will find delight, for they seek no sensual pleasures.

---

**සහස්ස වග්ගෝ අට්ඨමෝ.**

100. සහස්සමපි චේ වාචා
අනත්ථපදසංහිතා,
ඒකං අත්ථපදං සෙය්‍යෝ,
යං සුත්වා උපසම්මති.

101. සහස්සමපි චේ ගාථා
අනත්ථපදසංහිතා,
ඒකං ගාථාපදං සෙය්‍යෝ,
යං සුත්වා උපසම්මති.

102. යෝ චේ ගාථා සතං භාසේ
අනත්ථපදසංහිතා,
ඒකං ධම්මපදං සෙය්‍යෝ,
යං සුත්වා උපසම්මති.

## *VIII. SAHASSAVAGGO AṬṬHAMO*

100. Sahassam api ce vācā anatthapadasaṅhitā,
Ekaṃ atthapadaṃ seyyo, yaṃ sutvā upasammati.

101. Sahassam api ce gāthā anatthapadasaṅhitā,
Ekaṃ gathāpadaṃ seyyo, yaṃ sutvā upasammati.

102. Yo ce gāthāsataṃ bhāse anatthapadasaṅhitā,
Ekaṃ dhammapadaṃ seyyo, yaṃ sutvā upasammati.

## 8. සහස්‍ර වර්ගය.

100. අනර්ථ සිදු කරන පදවලින් යුත් වචන දහසක් වුවත් උසස් නැත. යමක් ඇසීමෙන් මිනිසා සංසිඳීමට පත් වේ ද එබඳු එක අර්ථවත් පදය පවා උසස් ය.

101. අනර්ථ සිදු කරන පදවලින් යුත් ගාථා දහසක් වුවත් උසස් නැත. යමක් අසා මිනිසා සංසිඳීමට පත් වේ ද එබඳු එක ගාථා පදය පවා උසස් ය.

102. යමකු අනර්ථ සිදු කරන පදවලින් යුත් ගාථා සියක් කීවත් එයින් වැඩක් නැත. යමක් අසා මිනිසා සංසිඳීමට පත් වේ ද එබඳු එක ධර්ම පදය පවා උසස් ය.

## VIII. THE THOUSANDS

100. Better than a thousand meaningless words is one sensible word on hearing which one becomes peaceful.

101. Better than a thousand meaningless verses is one single line on hearing which one becomes peaceful.

102. Though one should utter a hundred meaningless verses better is one single word of Dhamma on hearing which one becomes peaceful.

103. යො සහස්සං සහස්සේන
සංගාමේ මානුසේ ජිනේ,
ඒකං ච ජෙය්‍ය අත්තානං,
ස වේ සංගාමජුත්තමො.

104. අත්තා හවේ ජිතං සෙය්‍යො
යා චායං ඉතරා පජා,
අත්තදන්තස්ස පොසස්ස
නිච්චං සඤ්ඤතචාරිනො.

105. නේව දේවො, න ගන්ධබ්බො
න මාරො සහ බ්‍රහ්මුනා,
ජිතං අපජිතං කයිරා
තථාරූපස්ස ජන්තුනො.

103. Yo sahassaṃ sahassena saṅgāme mānuse jine,
Ekaṃ ca jeyya attānaṃ, sa ve saṅgāmajuttamo.

104. Attā have jitaṃ seyyo, yā cāyaṃ itarā pajā
Attadantassa posassa niccaṃ saṃyatacārino.

105. N' eva devo, na gandhabbo, na Māro saha Brahmunā,
Jitaṃ apajitaṃ kayirā, tathārūpassa jantuno.

103. යමකු යුද්ධයක දී මිනිසුන් ලක්ෂයක් දිනුවත් තමාගේ එක ම ආත්මය දිනා ගැනීම එයට වඩා උසස් ය. ඔහු හෙවත් ආත්මය දිනා ගන්නා පුද්ගලයා සෙසු දිනුම් කරුවන්ට වඩා උසස් ය.

104. දූ කෙළි ආදියෙන් අනුන් දිනීමට වඩා (තමා විසින්) තමා දිනා ගැනීම ඒකාන්තයෙන් ම ඉතා උසස් ය. නිතර තැන්පත් හැසිරීම් ඇති ආත්මය දමනය කර ගත් පුරුෂයාගේ ඒ දිනීම පැරදවීමක් කරන්ට කිසිවකුටත් නො පිළිවන.

105. ආත්මය දිනා ගත්තහුගේ දිනීම පැරදීමක් කරන්ට දෙවියෙක් වත්, ගන්ධර්වයෙක් වත්, බ්‍රහ්මයා සමග පැමිණි මාරයා වත් සමත් නො වේ.

103. Though one were to conquer a thousand thousand men in battle, yet he, indeed, is the greatest conquerer who would conquer himself.

104–105. Self-conquest is, indeed, better than the conquest of all others. Neither a God nor a Gandhabba, nor a Māra, along with Brahma could turn into defeat the victory of such a one who has disciplined himself and practises self-control.

106. මාසේ මාසේ සහස්සේන
යෝ යජේථ සතං සමං,
ඒකං ච භාවිතත්තානං
මුහුත්තමපි පූජයේ,
සායේව පූජනා සෙය්‍යෝ
යං චේ වස්සසතං හුතං.

107. යෝ චේ වස්සසතං ජන්තු
අග්ගිං පරිචරේ වනේ,
ඒකං ච භාවිතත්තානං
මුහුත්තමපි පූජයේ,
සායේව පූජනා සෙය්‍යෝ
යං චේ වස්සසතං හුතං.

106. Māse māse sahassena, yo yajetha sataṃ samaṃ.
Ekañ ca bhāvitattānāṃ muhuttam api pūjaye,
Sāyeva pūjanā seyyo yañ ce vassasataṃ hutaṃ.

107. Yo ce vassasataṃ jantu, aggiṃ paricare vane,
Ekañ ca bhāvitattānaṃ muhuttam api pūjaye,
Sāyeva pūjanā seyyo, yañ ce vassasataṃ hutaṃ.

106. මාස් පතා දහ බැගින් වියදම් කොට සියක් අවුරුද්දක් මුළුල්ලේ සාමාන්‍ය ලෞකික කෙනකුට දෙන දානට වඩා, වැඩූ ආත්ම භාවනා ඇත්තකුට එක් මොහොතක් තුළ කරන පූජාව ම උසස් වේ.

107. යමකු අවුරුදු සියක් වනයෙහි ගිනි පිදුවත් එය උසස් නැත. වැඩූ ආත්ම භාවනා ඇත්තකුට එක් මොහොතක් තුළ කරන පූජාව ඒ හෝමයට වඩා උසස් ය.

106. If a man month after month for a hundred years, should sacrifice with a thousand, and if he but for a moment would honour a person whose self is well developed, that honour is, indeed, better than a century of sacrifice.

107. If a man for a hundred years tend the sacrificial fire in the forest, and if he but for a moment would honour a person whose self is well developed that honour is, indeed, better than a century of sacrifice.

108. යං කිඤ්චි යිට්ඨං ව හුතං ව ලෝකේ,
සංවච්ඡරං යජේථ පුඤ්ඤපේඛෝ,
සබ්බම්පි තං න චතුභාගමේති,
අභිවාදනා උජ්ජුගතේසු සෙය්‍යෝ.

109. අභිවාදනසීලිස්ස
නිච්චං වද්ධාපචායිනෝ,
චත්තාරෝ ධම්මා වඩ්ඪන්ති:
ආයු, වණ්ණෝ, සුඛං, බලං.

108. Yaṃ kiñci yitthaṃ va hutaṃ va loke,
Saṅvaccharaṃ yajetha puññapekho,
Sabbam pi taṃ na catubhāgam eti,
Abhivādanā ujjugatesu seyyo.

109. Abhivādanasīlissa niccaṃ vaddhāpacāyino,
Cattāro dhammā vaḍḍhanti: āyu, vaṇṇo, sukhaṃ,
balaṃ.

108. ලෝකයෙහි පින් කැමැත්තකු අවුරුද්ද මුළුල්ලේ යම් කිසි යාගයක් හෝ හෝමයක් කළත් ඒ සියල්ල ආර්යයකුට කරන වැඳීමෙන් හතරෙන් පංගුවක් වත් නොවටී. ආර්යයන්ට කරන වැඳුම එ තරම් උසස් ය.

109. සීලයෙන්, ගුණයෙන් වැඩි හිටියන්ට නිතර වැඳුම් පිදුම් කරන්නහුගේ ආයුෂය, වර්ණය, සැපය හා බලය වැඩේ.

108. In this world whatever sacrifice and oblation one should offer seeking merit for a year—the whole of it is not worth a quarter of the merit received by honouring the upright, which is excellent.

109. To him who habitually honours and respects elders four things increase: age, beauty, happiness and strength.

110. යෝ චේ වස්සසතං ජීවේ
දුස්සීලෝ අසමාහිතෝ,
ඒකාහං ජීවිතං සෙය්‍යෝ
සීලවන්තස්ස ඣායිනෝ.

111. යෝ චේ වස්සසතං ජීවේ
දුප්පඤ්ඤෝ අසමාහිතෝ,
ඒකාහං ජීවිතං සෙය්‍යෝ
පඤ්ඤාවන්තස්ස ඣායිනෝ.

112. යෝ චේ වස්සසතං ජීවේ
කුසීතෝ හීනවීරියෝ,
ඒකාහං ජීවිතං සෙය්‍යෝ
විරියමාරභතෝ දළ්හං.

110. Yo ce vassasataṃ jīve dussīlo asamāhito,
Ekāhaṃ jīvitaṃ seyyo sīlavantassa jhāyino.

111. Yo ce vassasataṃ jīve duppañño asamāhito,
Ekāhaṃ jīvitam seyyo paññāvantassa jhāyino.

112. Yo ce vassasataṃ jīve kusīto hīnavīriyo,
Ekāhaṃ jīvitaṃ seyyo viriyam ārabhato daḷhaṃ.

110. එකඟ සිතක් නැති දුශ්ශීලයාගේ සියක් අවුරුදු ජීවිතයට වඩා ධ්‍යාන වඩන සිල්වතාගේ එක දවසක ජීවිතය උසස් ය.

111. එකඟ සිතක් නැති අනුවණයාගේ සියක් අවුරුදු ජීවිතයට වඩා ධ්‍යාන වඩන බුද්ධිමතාගේ එක දවසක ජීවිතය උසස් ය.

112. කම්මැළි වූ, අඩු වීර්‍ය ඇති කෙනකුගේ සියක් අවුරුදු ජීවිතයට වඩා දැඩි වීර්‍යයෙන් යුක්තයාගේ එක දවසක ජීවිතය උසස් ය.

110. Though one should live a hundred years immoral and unrestrained, yet, better, indeed, is one day's life of one who is virtuous and meditative.

111. Though one should live a hundred years wisdomless and unrestrained, yet, better, indeed, is one day's life of one who is wise and meditative.

112. Though one should live a hundred years idle and inert, yet, better, indeed, is one day's life of one who makes a strenuous effort.

113. යෝ චෙ වස්සසතං ජීවෙ
අපස්සං උදයව්‍යයං,
ඒකාහං ජීවිතං සෙය්‍යෝ
පස්සතෝ උදයව්‍යයං.

114. යෝ චෙ වස්සසතං ජීවෙ
අපස්සං අමතං පදං,
ඒකාහං ජීවිතං සෙය්‍යෝ
පස්සතෝ අමතං පදං.

115. යෝ චෙ වස්සසතං ජීවෙ
අපස්සං ධම්මමුත්තමං,
ඒකාහං ජීවිතං සෙය්‍යෝ
පස්සතෝ ධම්මමුත්තමං.

**සහස්ස වග්ගෝ නිට්ඨිතෝ.**

---

113. Yo ce vassasataṃ jīve apassaṃ udayavyayaṃ.
Ekāhaṃ jīvitaṃ seyyo passato udayavyayaṃ.

114. Yo-ce vassasataṃ jīve apassaṃ amataṃ padaṃ,
Ekāhaṃ jīvitaṃ seyyo passato amataṃ padaṃ.

115. Yo ce vassaṣataṃ jīve apassaṃ dhammamuttamaṃ,
Ekāhaṃ jīvitaṃ seyyo passato dhammamuttamaṃ.

---

113. පංචස්කන්ධයාගේ හට ගැනීම හා නැවැත්මත් පිළිබඳ නො බලන්නහුගේ සියක් අවුරුදු ජීවිතයට වඩා එය බලන්නහුගේ එක දවසක ජීවිතය උසස් ය.

114. නිවන නො දකින්නහුගේ - අවබෝධ කර නො ගන්නහුගේ - සියක් අවුරුදු ජීවිතයට වඩා එය අවබෝධ කර ගන්නහුගේ එක දවසක ජීවිතය උසස් ය.

115. උතුම් ධර්මයක් අවබෝධ කර නො ගන්නහුගේ සියක් අවුරුදු ජීවිතයට වඩා එය අවබෝධ කර ගන්නහුගේ එක දවසක ජීවිතය උසස් ය.

සහස්‍ර වර්ගය නිමි.

---

113. Though one should live a hundred years without perceiving the beginning and end, yet better, indeed, is one day's life of one who perceives the beginning and end.

114. Though one should live a hundred years without perceiving the deathless state, yet, better, indeed, is one day's life of one who perceives the deathless state.

115. Though one should live a hundred years without perceiving the deathless state, yet, better, indeed, is one day's life of one who perceives the supreme Truth.

## පාප වග්ගෝ නවමෝ.

116. අභිත්ථරේථ කල්‍යාණේ,
පාපා චිත්තං නිවාරයේ,
දන්ධං හි කරෝතෝ පුඤ්ඤං
පාපස්මිං රමතී මනෝ.

117. පාපං චේ පුරිසෝ කයිරා,
න තං කයිරා පුනප්පුනං,
න තම්හි ඡන්දං කයිරාථ,
දුක්ඛෝ පාපස්ස උච්චයෝ.

118. පුඤ්ඤං චේ පුරිසෝ කයිරා
කයිරාථේතං පුනප්පුනං,
තම්හි ඡන්දං කයිරාථ,
සුඛෝ පුඤ්ඤස්ස උච්චයෝ.

## *IX. PĀPAVAGGO NAVAMO*

116. Abhittharetha kalyāṇe, pāpā cittaṃ nivāraye,
Dandhaṃ hi karoto puññaṃ pāpasmiṃ ramatī mano.

117. Pāpañ ce puriso kayirā, na taṃ kayirā punappunaṃ,
Na tamhi chandaṃ kayirātha, dukkho pāpassa uccayo.

118. Puññañ ce puriso kayirā, kayirāth' etaṃ punappunaṃ.
Tamhi chandhaṃ kayirātha, sukho puññassa uccayo.

## 9. පාප වර්ගය.

116. පින් කිරීමෙහි හෙවත් පින්කමට ඉක්මන් විය යුතු ය. සිත පවින් වැළැක්විය යුතු ය. අත පසු කරමින් පින් කරන්නහුගේ සිත පාපයෙහි ඇලේ.

117. යමකු බැරි වීමකින් පවක් කළත් නැවත නැවත එය නො කළ යුතු ය. පවට අංශා නො කළ යුතු ය. පව් රැස් කිරීම දුකට හේතු වේ.

118. පින් කරන්නා නිතර නිතර එය කළ යුතු ය. පිනට අංශා කළ යුතු ය. පින් රැස් කිරීම සැපයට හේතු වේ.

## IX. EVIL

116. Make haste in doing good; check the mind from evil. The mind of one who is slack in doing good delights in evil.

117. If a man commits evil, let him not do it again and again. Let him not find pleasure therein. Sorrowful is the accumulation of evil.

118. If a man does what is good, let him do it again and again. Let him find pleasure therein. Blissful is the accumulation of good.

119. පාපෝපි පස්සති භද්‍රං
යාව පාපං න පච්චති,
යදා ච පච්චති පාපං
අථ පාපෝ පාපානි පස්සති.

120. භද්‍රෝපි පස්සති පාපං
යාව භද්‍රං න පච්චති,
යදා ච පච්චති භද්‍රං
අථ භද්‍රෝ භද්‍රානි පස්සති.

119. Pāpo ’ pi passati bhadraṃ yāva pāpaṃ na paccatī,
Yadā ca paccati pāpaṃ atha pāpo pāpāni passati.

120. Bhadro ‘ pi passati pāpaṃ yāva bhadraṃ na paccati,
Yadā ca paccati bhadraṃ atha bhadro bhadrānī passati.

119. පාපියාත් පව නො මේරන තෙක් යහපතක් දකී. යම් විටක පව මේරයි ද එ විට පාපියා අයහපත දකී.

120. පින් කරන්නා ද පින නො මේරන තෙක් අයහපත දකී. යම් විටක පින මේරයි ද එ විට පින් කරන්නා යහපත දකී.

119. Even an evil-doer sees happiness so long as evil does not ripen; but when evil ripens, then he sees evil (results).

120. Even a good man sees evil so long as good deed does not ripen; but when good deed ripens, then he sees the good (results).

121. මාප්පමඤ්ඤෙථ පාපස්ස
න මන්තං ආගමිස්සති,
උදබින්දු නිපාතේන
උදකුම්භෝපි පූරති,
පූරති බාලෝ පාපස්ස
ථෝකථෝකම්පි ආචිනං.

122. මාප්පමඤ්ඤෙථ පුඤ්ඤස්ස
න මන්තං ආගමිස්සති,
උදබින්දු නිපාතේන
උදකුම්භෝපි පූරති,
පූරති ධීරෝ පුඤ්ඤස්ස
ථෝකථෝකම්පි ආචිනං.

121. Māppamaññetha pāpassa na man taṃ āgamissati,
Udabindunipātena udakumbho ‘pi pūrati,
Pūrati bālo pāpassa thokathokam pi āciṇaṃ.

122. Māppamaññetha puññassa na man taṃ āgamissati,
Udabindunpātena udakumbho‘pi pūrati,
Pūrati dhīro puññassa thokathokam pi āciṇaṃ.

**121.** පවේ විපාකය තමා කරා නො එතැ යි සිතා පව සුළු කොට නො සිතිය යුතු ය. දිය බිඳු එක් වීමෙන් කළය පිරෙන්නාක් මෙන් ටිකින් ටික එක් වන පව් නිසා මෝඩයා පවින් පිරේ.

122. පිනේ විපාකය තමා කරා නො එතැ යි සිතා පින සුළු කොට නො සිතිය යුතු ය. දිය බිඳු එක් වීමෙන් කළය පිරෙන්නාක් මෙන් ටිකින් ටික එක් වන පින නිසා බුද්ධිමතා පිනින් පිරේ.

121. Do not think lightly of evil saying that 'it will not come to me.' Even a water-pot is filled by the falling of drops. Similarly the fool, gathering little by little, fills himself with evil.

122. Do not think lightly of good saying that 'it will not come to me.' Even a water-pot is filled by the falling of drops. Similarly the wise man, gathering little by little, fills himself with good.

123. වාණිජෝව භයං මග්ගං
අප්පසත්ථෝ මහද්ධනෝ,
විසං ජීවිතුකාමෝව
පාපානි පරිවජ්ජයේ.

124. පාණිම්හි චේ වණෝ නාස්ස
හරෙය්‍ය පාණිනා විසං,
නාබ්බණං විසමන්වේති,
නත්ථි පාපං අකුබ්බතෝ.

125. යෝ අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති
සුද්ධස්ස පෝසස්ස අනංගණස්ස,
තමේව බාලං පච්චේති පාපං,
සුඛුමෝ රජෝ පටිවාතංව ඛිත්තෝ.

123. Vāṇijo ‘ va bhayaṃ maggaṃ appassattho mahaddhano,
Visaṃ jīvitukāmo ‘ va pāpāni parivajjaye.

124. Pāṇimhi ce vaṇo nāssa hareyya pāṇinā visaṃ,
Nābbaṇaṃ visam anveti, n’ atthi pāpaṃ ākubbato.

125. Yo appadutthassa narassa dussati
Suddhassa posassa anaṅgaṇassa,
Tam eva bālaṃ pacceti pāpaṃ,
Sukhumo rajo pativātaṃ’va khitto.

123. කැටුව යන පිරිස අඩු වූ මහා ධනවත් වෙළෙන්ද බිය ජනක මඟක් හැර යන්නේ යම් සේ ද, ජීවත් වනු කැමැත්තා විෂ අත් හරින්නේ යම් සේ ද, එසේ ම නුවණැත්තා පව් හළ යුතු ය.

124. අතෙහි හෝ අල්ලෙහි වණයක් නැත් නම් අතින් විෂයක් ගත හැකි ය. වණයක් නැත්තහු අනුව විෂ නුදුවයි. පවක් නො කරන්නහු අනුව පව නො යන්නේත් ඒ නියායෙනි.

125. යමෙක් අනුන්ට ද්වේෂ නො කළ, නිරපරාධ වූ පිරිසිදු පුද්ගලයකුට ද්වේෂ කරයි ද, උඩු සුළඟට දූ දුවිල්ලක් මෙන් එකී පව එය කළ මෝඩයා කරා ම එයි.

123. As a merchant with a small escort and much wealth shuns a dangerous way, avoids poison, so one should avoid evil deeds.

124. If one has no wound in the hand, he may handle poison. The poison does not effect the woundless. No evil befalls him who does no evil.

125. Whoever offends an innocent, pure and guiltless person, evil recoils on that very fool as fine dust thrown against the wind.

126. ගබ්භමේකේ උප්පජ්ජන්ති,
නිරයං පාපකම්මිනෝ,
සග්ගං සුගතිනෝ යන්ති,
පරිනිබ්බන්ති අනාසවා.

127. න අන්තලික්ඛේ, න සමුද්දමජ්ඣේ,
න පබ්බතානං විවරං පවිස්ස,
න විජ්ජති සෝ ජගතිප්පදේසෝ,
යත්ථට්ඨිතෝ මුඤ්චෙය්‍ය පාපකම්මා.

128. න අන්තලික්ඛේ, න සමුද්දමජ්ඣේ,
න පබ්බතානං විවරං පවිස්ස,
න විජ්ජති සෝ ජගතිප්පදේසෝ,
යත්ථට්ඨිතං නප්පසහේථ මච්චු.

**පාප වග්ගෝ නිට්ඨිතෝ.**

---

126. Gabbham eke uppajjanti, nirayaṃ pāpakammino
Saggaṃ sugatino yanti, parinibbanti anāsavā.

127. Na antalikkhe, na samuddamajjhe,
Na pabbatānaṃ vivaraṃ pavissa,
Na vijjatī so jagatippadeso,
Yatthatthito muñceyya pāpakammā.

128. Na antalikkhe, na samuddamajjhe.
Na pabbatānaṃ vivaraṃ pavissa,
Na vijjatī so jagatippadeso,
Yatṭhatthitaṃ nappasahetha maccu.

---

126. මැරෙන අයගෙන් සමහරු මවු කුසෙහි ම උපදිත්. පව් කළාහු අපායට යත්. පින් කළාහු ස්වර්ගයට යත්. කාම ආදී ආශ්‍රව නැත්තෝ පිරිනිවෙත්.

127. යම් තැනක සිට පවේ විපාකයෙන් මිදිය හැකි ද එබඳු තැනක් අහසෙහිත් නැත. මූද මැදත් නැත. පර්වත කුහරයකත් නැත. එබඳු බිම් පෙදෙසක් කොහේ වත් ඇත්තේ නැත.

128. යම් තැනක සිටීමෙන් මරුවාට අසු නො විය හැකි ද එබඳු තැනක් අහසෙහිත් නැත; මූද මැදත් නැත; පර්වත කුහරයකත් නැත. එබඳු බිම් පෙදෙසක් කොහේ වත් ඇත්තේ නැත.

පාප වර්ගය නිමි.

---

126. Some are born in the womb; evil-doers go to hell. The pious go to heaven, the undefiled ones attain Nibbāna.

127. Neither in the sky, nor in mid-ocean, nor by entering into the clefts of mountains, is found that place on earth where stationing himself one may escape from an evil deed.

128. Neither in the sky, nor in mid-ocean, nor by entering into the clefts of mountains, is found that place on earth where stationing himself one will not overcome by death.

---

## දණ්ඩ වග්ගෝ දසමෝ.

129. සබ්බේ තසන්ති දණ්ඩස්ස,
සබ්බේ භායන්ති මච්චුනෝ;
අත්තානං උපමං කත්වා
න හනෙය්‍ය, න ඝාතයේ.

130. සබ්බේ තසන්ති දණ්ඩස්ස,
සබ්බේසං ජීවිතං පියං;
අත්තානං උපමං කත්වා
න හනෙය්‍ය, න ඝාතයේ

131. සුඛකාමානි භූතානි
යො දණ්ඩේන විහිංසති,
අත්තනෝ සුඛමේසානෝ
පෙච්ච සෝ න ලභතේ සුඛං.

## *X. DAṆḌAVAGGO DASAMO*

129. Sabbe tasanti daṇḍassa, sabbe bhāyanti maccuno
Attānaṃ upamaṃ katvā na haneyya, na ghātaye.

130. Sabbe tasanti daṇḍassa, sabbesaṃ jīvitaṃ piyaṃ,
Attānaṃ upamaṃ katvā na haneyya, na ghātaye.

131. Sukhakāmāni bhūtāni yo daṇḍena vihiṃsati,
Attano sukham esāno pecca so na labhate sukhaṃ.

## 10. දණ්ඩ වර්ගය.

129. සියල්ලෝ දඬුවමෙන් තුසත වෙත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා, තමා උපමා කොට සිතා, අනුන් නො නැසිය යුතු ය; නො නැසවිය යුතු ය.

130. සියල්ලෝ දඬුවමෙන් තුසත වෙත්. සියල්ලන්ට ම ජීවිතය ප්‍රිය ය. ඒ නිසා, තමා උපමා කොට සිතා, අනුන් නො නැසිය යුතු ය; නො නැසවිය යුතු ය.

131. යමෙක් තමාට සැප බලාපොරොත්තුවෙන් සැප කැමැති සත්වයන් දණ්ඩෙන් පෙළයි ද ඔහු පර ලොව දී සැප නො ලබයි.

## X. PUNISHMENT

129. All tremble at punishment. All fear death. Likening others to one-self, one should neither slay, nor cause to slay.

130. All tremble at punishment. Life is dear to all. Likening others to oneself, one should neither slay, nor cause to slay.

131. He who desiring happiness, molests with rod, beings desirous of happiness, does not obtain happiness hereafter.

132. සුඛකාමානි භූතානි
යෝ දණ්ඩේන න හිංසති,
අත්තනෝ සුඛමේසානෝ
පෙච්ච සෝ ලභතේ සුඛං.

133. මාවෝච ඵරුසං කංචි,
වුත්තා පටිවදෙය්‍යු තං;
දුක්ඛා හි සාරම්භකථා,
පටිදණ්ඩා ඵුසෙය්‍යු තං.

134. සචේ නේරේසි අත්තානං
කංසෝ උපහතෝ යථා,
ඒස පත්තෝසි නිබ්බාණං,
සාරම්භෝ තේ න විජ්ජති.

132. Sukhakāmāni bhūtāni yo daṇḍena na hiṃsati,
Attano sukham esāno pecca so labhate sukhaṃ.

133. Mā 'voca pharusaṃ kañci, vuttā pativadeyyu taṃ;
Dukkhā hi sārambhakathā, patidaṇḍā phuseyyu taṃ.

134. Sace neresi attānaṃ kaṃso upahato yathā,
Esa patto 'si Nibbānaṃ, sārambho te na vijjati.

132. යමෙක් තමාට සැප බලාපොරොත්තුවෙන් සැප කැමැති සත්වයන් දණ්ඩෙන් නො පෙළයි ද ඔහු පරලොව දී සැප ලබයි.

133. කිසිවකුටත් පරුෂ වචන නො කිය යුතු ය එසේ කී කල එයින් කිපෙත්තෝ ඔබට ද පරුෂ වචනයෙන් බණිත්. ඒ අනුව එකට එක කියා ගැනීම දුකකි. එසේ කරන්නාට පෙරළා එන පහර වලට ද මුහුණ පාන්නට සිදු වේ.

134. මුව බිඳුණු ලෝහ භාජනයක් මෙන් තමාට තමා නිශ්චල කර ගත හැකි නම් එබඳු වූ ඔබ නිවනට පැමිණියෙක් වන්නේ ය. එබඳු වූ ඔබ අතින් එකට එක කියා ගැනීමක් ද සිදු නො වේ.

132. He who desiring happiness, molests not with rod, beings desirous of happiness, obtains happiness hereafter.

133. Do not speak harsh words to any. Those thus spoken will retort. Vindictive speech is indeed, painful. Retaliation will come upon you.

134. If you silence yourself as a broken gong you have already attained Nibbāna, for contention is not known to you.

135. යථා දණ්ඩේන ගෝපාලෝ
ගාවෝ පාජේති ගෝචරං,
ඒවං ජරා ච මච්චූ ච
ආයුං පාජේන්ති පාණිනං.

136. අථ පාපානි කම්මානි
කරං බාලෝ න බුජ්ඣති,
සේහි කම්මේහි දුම්මේධෝ
අග්ගිදඩ්ඪෝ'ව තප්පති.

137. යෝ දණ්ඩේන අදණ්ඩේසු
අප්පදුට්ඨේසු දුස්සති,
දසන්නමඤ්ඤතරං ඨානං
ඛිප්පමේව නිගච්ඡති:-

135. Yathā daṇḍena gopālo gāvo pājeti gocaraṃ,
Evaṃ jarā ca maccu ca āyuṃ pājenti pāṇinaṃ.

136. Atha pāpāni kammāni karaṃ bālo na bujjhati,
Sehi kammehi dummedho aggidaḍḍho 'va tappati.

137. Yo daṅḍena adaṇḍesu appadutthesu dussati,
Dasannam aññataraṃ thānaṃ khippam eva nigaçchati:-

135. ගොපල්ලා දණ්ඩෙන් ගසා ගවයන් ගොදුරට දක්කන්නේ යම් සේ ද, එසේ ම, ජරාවත්, මරණයත් සත්වයන්ගේ ආයුෂය කෙළවර කරයි.

136. මෝඩයා පව්කම් කරමිනුත් එයින් වන විපාකය තේරුම් නො ගනී. අනුවණයා ස්වකීය කර්මයන් නිසා ගින්නෙන් දැවුණකු මෙන් තැවේ.

137. යමෙක් දඬුවමට නුසුදුස්සන්ට දඬුවම් කරයි ද, ද්වේෂ නො කළ යුත්තන්ට ද්වේෂ කරයි ද ඔහු පහත සඳහන් දස වැදෑරුම් දේවලින් එකකට වහා පැමිණේ:-

135. As the cowherd with his staff drives the kine into pasture, so old age and death drive forth the lives of beings.

136 When a fool commits evil deeds he does not realise (their evil nature). The stupid man burns through his own deeds, like one burnt by fire.

137. He who inflicts punishment on those who are harmless, and offends those who are unoffending, he soon comes to one of these ten states:—

138. වේදනං ඵරුසං ජානිං,
සරීරස්ස ච භේදනං,
ගරුකං වාපි ආබාධං,
චිත්තක්ඛේපං ව පාපුණේ.

139. රාජතො වා උපස්සග්ගං,
අබ්භක්ඛානං ව දාරුණං,
පරික්ඛයං ව ඤාතීනං,
භෝගානං ව පභංගුරං.

140. අථ වස්ස අගාරානි
අග්ගි ඩහති පාවකො,
කායස්ස භේදා දුප්පඤ්ඤො
නිරයං සෝපපජ්ජති.

138. Vedanaṃ pharusaṃ jāniṃ, sarīrassa ca bhedanaṃ,
Garukaṃ vā'pi ābādhaṃ, cittakkhepañ va pāpuṇe.

139. Rājato vā upassaggaṃ, abbhakkhānaṃ va dāruṇaṃ,
Parikkhayañ va ñatīnaṃ, bhogānañ va pabhaṅguraṃ.

140. Athava'ssa agārāni aggi ḍahati pāvako,
Kāyassa bhedā duppañño nirayaṃ so'papajjati.

138. (ඔහු) දරුණු වේදනාවකට හෝ, ධන හානියකට හෝ, ශරීර භේදයකට (පීඩාවකට) හෝ, බලවත් ආබාධයකට හෝ, ඔල්මාදයකට හෝ පැමිණේ.

139. (ඔහු) රජුන්ගෙන් වන උවදුරකට හෝ, දරුණු දෝෂාරෝපණයකට හෝ, නෑයන්ගේ පිරිහීමකට හෝ, සම්පත් විනාශයකට හෝ පැමිණේ.

140. එසේත් නැතොත් ඔහුගේ ගෙවල් ගිනි ගනී. එසේත් තුවූවොත්, මරණින් මතු ඒ අඥනයා නිරයෙහි උපදී.

138. He will be subject to cruel suffering, loss of wealth, injury of the body, or even grievous sickness, or loss of mind.

139. Or oppression by the king, or grave accusation, or loss of relatives, or destruction of wealth.

140. Or ravaging fire burns his houses and upon the dissolution of the body the unwise one goes to hell.

141. න නග්ගචරියා න ජටා න පංකා,
නානාසකා ථණ්ඩිලසායිකා වා,
රජො ච ජල්ලං උක්කුටිකප්පධානං.
සොධෙන්ති මච්චං අවිතිණ්ණකංඛං.

142. අලංකතො චෙපි සමං චරෙය්‍ය,
සන්තො දන්තො නියතො බ්‍රහ්මචාරී,
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං,
සො බ්‍රාහ්මණො, සො සමණො, ස භික්ඛු.

141. Na naggacariyā na jatā na paṅkā,
Nānāsakā thaṇḍilasāyikā vā,
Rajo ca jallaṃ ukkutikappadhānaṃ,
Sodhenti maccaṃ avitiṇṇakaṅkhaṃ.

142. Alaṅkato ce ' pi samaṃ careyya,
Santo danto niyato brahmacārī,
Sabbesu bhūtesu nidhāya daṇḍaṃ,
So brāhmaṇo, so samaṇo, sa bhikkhu.

141. නග්න ව විසීමේ ව්‍රතය වත්, ජටා දැරීම වත්, මඩ ගා ගැනීම වත්, ආහාර අත් හැරීම වත්, බිම වැද හෙවීම වත්, ඇඟේ දූලි ධූලි ඇති ව සිටීම වත්, උක්කුටුකයෙන් හිඳීම වත් සැක දුරු නො කළ (මිනිසාගේ සැක දුරු කොට) ඔහු පිරිසිදු නො කෙරේ.

142. යමෙක් ඇඳුම් පැළඳුම්වලින් අලංකාර ව සිටියත් ශාන්ත ව, දාන්ත ව නියත බ්‍රහ්මචාරියකු ව සම ව හැසිරේ නම්, සියලු දෙනාට ම හිංසා කිරීමෙන් වළකී නම් ඔහු නියම බ්‍රාහ්මණයෙකි; ශ්‍රමණයෙකි: භික්ෂුවකි.

141. Not wandering naked, not matted hair, not dirt (or mud), not fasting, not lying on ground, not besmearing with ashes, not squatting on the heels purify a mortal who has not overcome doubts.

142. Even though a man be gaily adorned, if he lives in peace, is calm, controlled, established, is chaste, and has ceased to injure all other beings he indeed is a Brāhmin, an ascetic, a monk.

143. හිරී නිසේධෝ පුරිසෝ
කෝචි ලෝකස්මිං විජ්ජති,
යෝ නින්දං අප්පබෝධති
අස්සෝ භද්‍රෝ කසාමිව.

144 අස්සෝ යථා භද්‍රෝ කසානිවිට්ඨෝ,
ආතාපිනෝ සංවේගිනෝ භවාථ,
සද්ධාය සීලේන ච විරියේන ච,
සමාධිනා ධම්මවිනිච්ඡයේන ච,
සම්පන්නවිජ්ජාචරණා පතිස්සතා,
පහස්සථ දුක්ඛමිදං අනප්පකං.

145. උදකං හි නයන්ති නෙත්තිකා
උසුකාරා නමයන්ති තේජනං
දාරුං නමයන්ති තච්ඡකා
අත්තානං දමයන්ති සුබ්බතා.

**දණ්ඩ වග්ගෝ නිට්ඨිතෝ.**

143. Hirīnisedho puriso koci lokasmiṃ vijjati,
Yo nindaṃ appabodhati asso bhadro kasām iva.

144. Asso yathā, bhadro kasānivittho,
Ātāpino saṃvegino bhavātha,
Saddhāya sīlena ca viriyena ca,
Samādhinā dhammavinicchayena ca,
Sampannavijjācaraṇā patissatā,
Pahassatha dukkham idaṃ anappakaṃ.

145. Udakaṃ hi nayanti nettikā,
Usukārā namayanti tejanaṃ,
Dāruṃ namayanti tacchakā,
Attānaṃ damayanti subbatā.

143. තමාට වන මදිකම ගැන සලකා කස පහරින් වළකින උසස් අසකු මෙන් යමෙක් තමාට ඇති වන නින්දාව දුරු කර ගනී ද, එබඳු වූ ලජ්ජාවෙන් කෙලෙස් දුරු කර ගන්නා වූ පුරුෂයකු ලොව ඇති වන්නේ ඉඳ හිටලා ය.

144. කස පහර ලද වත්, එ වේලේ පටන් ඒ ගැන ලජ්ජා වන අසකු මෙන් කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්ත විය යුතු ය; සංවේගවත් විය යුතු ය. ශ්‍රද්ධාව, ශීලය, වීර්‍ය්‍යය, අට වැදෑරුම් සමාධිය, ධර්ම විනිශ්චය හෙවත් විදර්ශනා ඥානය, එළඹ සිටි සිහිය යන මෙසින් යුක්ත ව මේ අනල්ප වූ දුක දුරු කළ යුතු ය.

145. දියඇලුවෝ තමන් කැමැති තැනකට ජලය ගෙන යත්. හී වඩුවෝ තමන්ට වුවමනා පරිදි හී දඬු නමත්. වඩුවෝ තමන්ට කැමැති පරිදි ලී නමත්. සුවචයෝ ආත්මය රිසි සේ දමනය කර ගනිත්.

දණ්ඩ වග්ගය නිමි.

---

143. There is in this world a certain man who restrained by modesty, avoids reproach as a well-trained horse, the whip.

144. Like a well-trained horse touched by the whip, so be strenuous and filled with religious feeling. By faith, by virtue, by effort, by concentration, by discernment of the Truth, by being endowed with knowledge and conduct and mindfulness put aside this unlimited suffering.

145. Irrigaters lead the water, Fletchers make the arrow straight. Carpenters bend the wood. The wise control themselves.

---

## ජරා වග්ගෝ ඒකාදසමෝ.

146. කෝ නු හාසෝ කිමානන්දෝ
නිච්චං පජ්ජලිතේ සති?
අන්ධකාරේන ඔනද්ධා
පදීපං න ගවෙස්සථ?

147. පස්ස චිත්තකතං බිම්බං
අරුකායං සමුස්සිතං,
ආතුරං බහුසංකප්පං
යස්ස නත්ථි ධුවං ඨිති.

148. පරිජිණ්ණමිදං රූපං,
රෝගනිඩ්ඩං පභංගුරං;
භිජ්ජති පූතිසන්දේහෝ,
මරණන්තං හි ජීවිතං.

## *XI. JARĀVAGGO EKĀDASAMO*

146. Ko nu hāso ? Kim ānando niccaṃ pajjalite sati ?
Andhakārena onaddhā padīpaṃ na gavessatha ?

147. Passa cittakataṃ bimbaṃ arukāyaṃ samussitaṃ,
Āturaṃ bahusaṅkappaṃ yassa n' atthi dhuvaṃ th ti.

148. Parijiṇṇam idaṃ rupaṃ, roganiḍḍhaṃ pabhaṅguraṃ ;
Bhijjati pūtisandeho, maraṇantaṃ hi jīvitaṃ.

## 11. ජරා වර්ගය.

146. මිනිසා රාගාදි වූ එකොළොස් ගින්නකින් නිතර ඇවිල ගෙන දිලියෙද්දී මොන සිනාවක් ද? මොන සතුටක් ද? අවිද්‍යා නමැති අඳුරෙන් වෙළුණු ඔබ එළියක් නොසොයන්නහු ද?

147. ඇම කටුවලින් සාදා ඔසවන ලද ගිලන් වූ, නොයෙක් දෙනා විසින් නොයෙක් අයුරින් කල්පනා කරන ලද, අබරණින් විසිතුරු කරන ලද, මේ සිරුර දෙස බලව.

148. දිරා ගිය මේ රූපය-කාය-ලෙඩ කූඩුවකි. එය වහා බිඳෙන සුලු ය. කුණු වැගිරෙන මේ කාය නැති වේ. ජීවිතය මරණය කෙළවර කොට ඇත්තකි.

## XI. OLD AGE

146. What laughter, what joy when the world is ever burning? Shrouded in darkness will you not seek a light?

147. Behold this painted image, this mass of wounds, diseased, full of many thoughts in which there is neither permanence nor stability.

148 This body is thoroughly worn out, a nest of diseases, and perishable. This putrid mass breaks up, life indeed ends in death.

149. යානිමානි අපත්ථානි
අලාපූනේව සාරදේ,
කාපෝතකානි අට්ඨීනි
තානි දිස්වාන කා රති?

150. අට්ඨීනං නගරං කතං,
මංසලෝහිතලේපනං,
යත්ථ ජරා ච මච්චු ච
මානෝ මක්ඛෝ ච ඕහිතෝ.

151. ජීරන්ති වේ රාජරථා සුචිත්තා,
අථෝ සරීරම්පි ජරං උපේති,
සතං ච ධම්මෝ න ජරං උපේති,
සන්තෝ හවේ සබ්භි පවේදයන්ති.

149. Yāni'māni apatthāni alāpūn'eva sārade,
Kāpotakāni atthīni, tāni disvāna kā rati ?

150. Atthīnaṃ nagaraṃ kataṃ, maṃsalohitalepanaṃ,
Yattha jarā ca maccu ca māno makkho ca ohito.

151. Jīranti ve rājarathā sucittā,
Atho sarīram pi jaraṃ upeti,
Satañ ca dhammo na jaraṃ upeti,
Santo have sabbhi pavedayanti.

149. ශරත් කාලයෙහි ඉවත ලූ ලබු කබල් වැනි වූ කොබෝසි (අළු) පාටින් යුක්ත වූ මේ ඇට දැකීමෙන් කවර ඇල්මෙක් ඇති වේ ද?

150. මේ ශරීරය ජරාවත්, මරණයත්, මානයත්, ගුණමකු බවත් ඔබ්බා මස් හා ලේ ගල්වා ඇටවලින් කරන ලද නගරයකි.

151. විසිතුරු කොට සැරසූ රජුන්ගේ මඟුල් රථ ද ඒකාන්තයෙන් ම දිරසි. ඒ හැර, සිරුර ද දිරසි. එහෙත් සත්පුරුෂයන් දෙසූ ධර්මය නම් කිසි කලෙක නො දිරසි. සත්පුරුෂයෝ මේ බව නියතයෙන් පළ කරත්.

149. These dove-hued bones are like gourds cast away in the autumn. What pleasure is there in looking at them.

150. Of bones the city is made plasted with flesh and blood, and in it dwell old age, death, pride and deceit.

151. Even the splendid royal chariots wear away; the body also reaches old age. But the Dhamma of the good never ages. Thus do the righteous reveal to each other.

152. අප්පස්සුතායං පුරිසෝ
බලිවද්දෝ ව ජීරති,
මංසානි තස්ස වඩ්ඪන්ති,
පඤ්ඤා තස්ස න වඩ්ඪති.

153. අනේකජාති සංසාරං
සන්ධාවිස්සං අනිබ්බිසං,
ගහකාරකං ගවේසන්තෝ,
දුක්ඛා ජාති පුනප්පුනං.

154. ගහකාරක! දිට්ඨෝසි,
පුන ගේහං න කාහසි,
සබ්බා තේ ඵාසුකා භග්ගා,
ගහකූටං විසංඛිතං,
විසංඛාරගතං චිත්තං,
තණ්හානං ඛයමජ්ඣගා.

152. Appassutāyaṃ puriso balivaddo' va jīrati,
maṃsāni tassa vaḍḍhanti, paññā tassa na vaḍḍhati.

153. Anekajātisaṃsāraṃ sandhāvissaṃ anibbisaṃ,
Gahakārakaṃ gavesanto, dukkhā jāti punappunaṃ.

154. Gahakāraka! diṭṭho' si, puna gehaṃ na kāhasi,
Sabbā te phāsukā bhaggā, gahakūṭaṃ visaṅkhitaṃ,
Visaṅkhāragataṃ cittaṃ, taṇhānaṃ khayam ajjhagā.

152. අල්පශ්‍රැත (=මඳක් ඇසූ, මඳ කරුණක් දත්) පුද්ගලයා වැඩෙන්නේ නිකාම් ගොනකු මෙනි. ඔහුගේ මස් නම් ලිය ලයි. එහෙත් නුවණ නො වැඩේ.

153. නැවත නැවත ඉපදීම දුකකි. ඒ නිසා මේ ආත්ම භාවය නමැති ගෙය සාදන වඩුවා සොයමින්, ඔහු සොයා ගත නො හැකි ව හෙවත් ඒ පිළිබඳ නුවණ නො ලබා, සසර නොයෙක් ජාතිවල ඔබ මොබ ඇවිද්දෙමි.

154. වඩුව! ඔබ මට පෙනිණ. ඒ නිසා ඔබට නැවතත් ගේ නො සෑදිය හැකි ය. ඔබගේ ගෙයි සියලු පරාල බිඳ දමන ලදි; එහි කැණිමඩල ද සුණු විසුණු කරන ලදි. මාගේ සිත නිවනට පිවිසියේ ය. තණ්හාව ද කෙළවර කෙළෙමි.

152. The man of little learning grows old like an ox; his flesh increases, but not his wisdom.

153. Many a birth I have wandered in this round of lives and deaths, vainly seeking the builder of this dwelling. Sorrowful is repeated birth.

154. O house-builder, you are seen. Never again you will build the house. All your rafters are broken. Your ridge-pole is destroyed. The mind is dissolved and the xtinction of desire has been achieved.

155. අචරිත්වා බ්‍රහ්මචරියං,
අලද්ධා යොබ්බනේ ධනං,
ජිණ්ණකොංචාව ඣායන්ති
ඛීණමච්ඡෙව පල්ලලේ.

156. අචරිත්වා බ්‍රහ්මචරියං,
අලද්ධා යොබ්බනේ ධනං,
සෙන්ති චාපාතිඛීණාව
පුරාණානි අනුත්ථුනං.

ජරා වග්ගෝ නිට්ඨිතෝ.

---

155. Acaritvā brahmacariyaṃ, aladdhā yobbane dhanaṃ,
Jiṇṇakoñcā va jhāyanti khīṇamacche'va pallale.

156. Acaritvā brahmacariyam, aladdhā yobbaṇe dhanaṃ,
Senti cāpātikhīṇā'va purāṅāni anutthunaṃ.

---

155. ඇතැම් හිඟි පැවිද්දෝ තරුණ කාලයෙහි ලැබ ගත හැකි ධනයත් නැත හොත් විෂය රසයත් නො ලැබ, බ්‍රහ්මචර්‍ය්‍යාවත් නො රැක, නාකි වූ පසු, මාළුවන් නැති දිය හිඳුණු විලක තැවෙන නාකි කොස් ලිහිණියන් මෙන් (අකාලයේ) තැවෙත්.

156. ඇතැම් හිඟි පැවිද්දෝ තරුණ කාලයෙහි ලැබ ගත හැකි ධනයත් නැත හොත් විෂය රසයත් නො ලැබ, බඹසරත් නො හැසිර නාකි වූ පසු, කලින් කරපු යම් යම් දේ සිහි කරමින් දුන්නෙන් මිදී ගොස් වැටුණු ඊතල මෙන් ශෝකයෙන් හොවිත්.

ජරා වග්ගය නිමි.

---

155. Those who have not practised celebacy, have not acquired wealth in youth, pine away like old cranes in a lake without fish.

156. Those who have not practised celibacy, have not aquired wealth in youth, lie like worn-out bows, sighing after the past.

---

## අත්ත වග්ගො ද්වාදසමො.

157. අත්තානං චෙ පියං ජඤ්ඤා,
රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං,
තිණ්ණමඤ්ඤතරං යාමං
පටිජග්ගෙය්‍ය පණ්ඩිතො.

158. අත්තානමෙව පඨමං
පතිරූපෙ නිවෙසයෙ,
අථඤ්ඤමනුසාසෙය්‍ය,
න කිලිස්සෙය්‍ය පණ්ඩිතො.

159. අත්තානං චෙ තථා කයිරා
යථඤ්ඤමනුසාසති,
සුදන්තො වත දම්මෙථ,
අත්තා හි කිර දුද්දමො.

## *XII. ATTAVAGGO DVĀDASAMO*

157. Attānañ ce piyaṃ jaññā, rakkheyya naṃ surakkhitaṃ,
Tiṇṇam aññataraṃ yāmaṃ patijaggeyya paṇḍito.

158. Attānam eva pathamaṃ patirūpe nivesaye,
Ath' aññam anusāseyya, na kilisseyya paṇḍito.

159. Attānañ ce tathā kayirā yath' aññam anusāsati,
Sudanto vata dammetha, attā hi kira duddamo.

## 12. ආත්ම වර්ගය.

157. තමාට තමා ප්‍රිය නම් තමා හෙවත් ආත්මය මනා ව රැක ගත යුතු ය. පණ්ඩිතයා බාල විය, මැදුම් විය, මහලු විය යන තුන් අවස්ථාවෙන් එක් අවස්ථාවක දී වත් කුසලින් තමා පෝෂණය කර ගත යුතු ය.

158. තමා ම පළමු කොට සුදුසු ගුණයෙහි පිහිටා ඊළඟට අනුන්ට ඒ ගැන අනුශාසනා කළ යුතු ය. එසේ කරන පණ්ඩිතයා නො කෙලෙසෙයි.

159. යම් පිළිවෙළකට කටයුතු කිරීම සඳහා අනුන්ට අනුශාසනා කරයි ද ඒ පිළිවෙළින් ම තමාත් ක්‍රියා කළ යුතු ය. තමා දමනය වී අනුන් දමනය කළ යුතු ය. ලෝකයේ ඉතා අමාරු කටයුත්ත ව පවත්නේ තමා විසින් තමා දමනය කර ගැනීම ය.

## XII. THE SELF

157. If one holds oneself dear let one closely watch oneself. During one of the three watches (periods of life) the wise man should be watchful.

158. First establish oneself in what is proper, then let him instruct another. Such a wise man will not be reproached.

159. If one shapes oneself according as one instructs others, thus well controlled one will have control over others. For self-control is, indeed, difficult.

160. අත්තා හි අත්තනො නාථො
කො හි නාථො පරො සියා?
අත්තනාව සුදන්තේන
නාථං ලභති දුල්ලභං.

161. අත්තනාව කතං පාපං
අත්තජං අත්තසම්භවං,
අභිමත්ථති දුම්මෙධං,
වජිරං වස්මමයං මණිං

162. යස්ස අච්චන්තදුස්සීල්‍යං
මාලුවා සාලමිවොත්තතං,
කරෝති සො තථත්තානං
යථා නං ඉච්ඡතී දිසො.

160. Attā hi attano nātho, ko hi nātho paro siyā ?
Attanā va sudantena nāthaṃ labhati dullabhaṃ.

161. Attanā'va kataṃ pāpaṃ, attajaṃ. atta sambhavaṃ,
Abhimanthati dummedhaṃ, vajiraṃ v'asmamayaṃ maṇim.

162. Yassa accantadussīlyaṃ maluvā sālam iv'otataṃ.
Karoti so tath' attānaṃ yathā naṃ icchatī diso.

160. තමාට පිහිට තමා ම ය. වෙන කවරෙක් තමාට පිහිට වේ ද? තමා මනා ව දැමුණු කල්හි දුර්ලභ වූ නිවන ලැබේ.

161. ගලෙන් ම ඇති වී ඒ ගල කා දමන දියමන්තිය මෙන් තමා විසින් කරන ලද, තමා තුළ ම උපන්, තමාගෙන් ම ඇති වූ පාපය අනුවණ වූ තමා මැඩ ලයි.

162. සල් ගසේ එතුණු මාලුවා වැල එය මුළුමනින් යට කරයි. කෙනකුගේ තද දුස්සීලකම ඔහු යට කරන්නේත් ඒ නියායෙනි. දුස්සීලයා දුස්සීලකම නිසා තමාට විපත් කර ගන්නේ සතුරා සතුරාට විපත් සලසන්නාක් මෙනි.

160. The self is the lord of self. What other lord would there be. With self well-controlled one obtains refuge which is hard to gain.

161. The evil done by oneself, born of oneself, caused by oneself grinds the fool even as a diamond breaks a hard gem.

162. He who is exceedingly corrupt, like a Maluvā creeper strangling a Sal tree, does to himself what his enemy wishes for him.

163. සුකරානි අසාධූනි,
අත්තනො අහිතානි ච,
යං වෙ හිතං ච සාධුං ච,
තං වෙ පරමදුක්කරං.

164. යො සාසනං අරහතං
අරියානං ධම්මජීවිනං
පටික්කොසති දුම්මෙධො
දිට්ඨිං නිස්සාය පාපිකං,
ඵලානි කට්ඨකස්සේව
අත්තඝඤ්ඤාය ඵල්ලති.

163. Sukarāni asādhūni, attano ahitāni ca,
Yaṃ ve hitañ ca, sādhuñ ca, taṃ ve paramadukkaraṃ.

164. Yo sāsanaṃ arahataṃ ariyānaṃ dhamma jīvinaṃ.
Patikkosati dummedho ditthiṃ nissāya pāpikaṃ
Phalāni katthakass'eva attaghaññāya phallati.

163. තමාට අහිත වූ, අයහපත් දේ ලේසියෙන් කර ගත හැකි ය. යම් දෙයක් තමාට හිත හෝ, යහපත් හෝ වේ නම් එය කිරීම ඉතා අමාරු ය.

164. යම් අනුවණයෙක් තමාගේ පාප-වැරදි-අදහසක් නිසා ධාර්මික දිවි පැවතුම් ඇති රහත් වූ ආර්යයන්ගේ අනුශාසනාවක් වළකා ලයි ද එය හුණ ගසේ පල ගැන්ම මෙන් ඔහුගේ ම විනාශය පිණිස පවතී.

163. Evil deeds that are harmful to oneself are easy to do. But what is beneficial and good is extremely difficult to do.

164. The foolish man who on account of false views, scorns the teaching of the worthy, the Noble, and the Righteous, bears the fruits to his own destruction even like the bamboo reed.

165. අත්තනාව කතං පාපං
අත්තනා සංකිලිස්සති,
අත්තනා අකතං පාපං
අත්තනාව විසුජ්ඣති,
සුද්ධි අසුද්ධි පච්චත්තං,
නාඤ්ඤමඤ්ඤෝ විසෝධයේ.

166. අත්තදත්ථං පරත්ථේන
බහුනාපි න හාපයේ,
අත්තදත්ථමභිඤ්ඤාය
සදත්ථපසුතෝ සියා.

**අත්ත වග්ගෝ නිට්ඨිතෝ.**

---

165. Attanā ' va katam̤ pāpam̤ attanā sankilissati,
Attanā akatam̤ pāpam̤ attanā va visujjhati,
Suddhi asuddhi paccattam̤. nāññamañño visodhaye.

166. Attadattham̤ paratthena bahunā' pi na hāpaye,
Attadattham abhiññāya sadatthapasuto siyā.

---

165. යමකු පව් කළොත් එයින් ඔහු ම කෙලෙසෙන්නේ ය. යමකු පව් නො කළොත් එයින් ඔහු පිරිසිදු වන්නේ ය. පිරිසිදුව හා අපිරිසිදුවත් පවතින්නේ තමා කෙරෙහි ම ය. එකෙක් අනිකකු පිරිසිදු නො කරන්නේ ය.

166. බොහෝ සෙයින් අනුන් සඳහා කරන වැඩ නිසා තමාගේ වැඩ නො පිරිහෙළා ගත යුතු ය. තමාගේ වැඩ මේ ය යි විශේෂයෙන් දැන ගෙන එහි යෙදිය යුතු ය.

ආත්ම වර්ගය නිමි.

---

165. By oneself is evil done, by oneself is one defiled. By oneself is evil left undone, by oneself alone is one purified. Purity and impurity depend on oneself. No one purifies another.

166. Let no one neglect one's own welfare for the sake of another's however great. Clearly perceiving one's own welfare let one devote himself to his task.

---

## ලෝක වග්ගෝ තේරසමෝ.

167. හීනං ධම්මං න සේවෙය්‍ය,
පමාදේන න සංවසේ,
මිච්ඡාදිට්ඨිං න සේවෙය්‍ය,
න සියා ලෝකවඩ්ඪනෝ.

168. උත්තිට්ඨෙ, නප්පමජ්ජෙය්‍ය,
ධම්මං සුචරිතං චරේ,
ධම්මචාරී සුඛං සේති
අස්මිං ලෝකේ පරම්හි ච.

169. ධම්මං චරේ සුචරිතං,
න තං දුච්චරිතං චරේ,
ධම්මචාරී සුඛං සේති
අස්මිං ලෝකේ පරම්හි ච.

## *XIII. LOKAVAGGO TERASAMO*

167. Hīnaṃ dhammaṃ na seveyya, pamādena na saṃvase,
Micchāditthiṃ na seveyya, na siyā lokavaddhano.

168. Uttitthe, nappamajjeyya, dhammaṃ sucaritaṃ care,
Dhammacārī sukhaṃ seti asmiṃ loke paramhi ca.

169. Dhammaṃ care sucaritaṃ, Na taṃ duccaritaṃ care,
Dhammacārī sukhaṃ seti asmiṃ loke paramhi ca.

## 13. ලෝක වර්ගය.

167. හීන වූ පස්කම් සැප නො සෙවිය යුතු ය. පමාවෙන් නො විසිය යුතු ය. මිසදිටුව නො සෙවිය යුතු ය. සසර වඩන්නකු - දික් කරන්නකු - නො විය යුතු ය.

168. නිතර ම නැඟී සිටිය යුතු ය. (හෙවත් පිණ්ඩපාතයෙහි) පමා නො විය යුතු ය. සුචරිතයෙහි යෙදිය යුතු ය. ධර්මයෙහි හැසිරෙන්නා මෙ ලොව පරලොව දෙක්හි ම සුව සේ වෙසේ.

169. සුචරිතයෙහි හැසිරිය යුතු ය. දුශ්චරිතයෙහි නො හැසිරිය යුතු ය. ධර්මයෙහි හැසිරෙන්නා මෙ ලොව පරලොව දෙක්හි ම සුව සේ වෙසේ.

## XIII. THE WORLD

167. Do not follow mean sensual pleasure. Do not live in negligence. Do not follow false doctrine. Do not be a world-upholder.

168. Arise! Be not negligent! Lead a righteous life. The righteous man lives happily both in this world and in the next.

169. Lead a righteous life, but not one that is corrupt. The righteous man lives happily both in this world and in the next.

170. යථා බුබ්බුලකං පස්සේ,
යථා පස්සේ මරීචිකං,
ඒවං ලෝකං අවෙක්ඛන්තං
මච්චුරාජා න පස්සති.

171. ඒථ පස්සථිමං ලෝකං
චිත්තං රාජරථූපමං,
යත්ථ බාලා විසීදන්ති,
නත්ථි සංගෝ විජානතං.

172. යෝ ච පුබ්බේ පමජ්ජිත්වා
පච්ඡා සෝ නප්පමජ්ජති,
සෝ ඉමං ලෝකං පභාසේති
අබ්භා මුත්තෝ'ව චන්දිමා.

170. Yathā bubbulakaṃ passe, yathā passe marīcikaṃ,
Evaṃ lokaṃ avekkhantaṃ maccurājā na passati.

171. Etha, passath' imaṃ lokaṃ cittaṃ rājarathûpamaṃ.
Yattha bālā visīdanti n'atthi saṅgo vijānataṃ.

172 Yo ca pubbe pamajjitvā pacchā so nappamajjatī,
So imaṃ lokaṃ pabhāseti abbhā mutto'va candimā.

170. ලෝකය දිය බුබුලක් සේත්, මිරිඟුවක් සේත් දක්නා තැනැත්තා මරුවාට නො පෙනේ; හෙවත් මරුවා එබඳු තැනැත්තා නො දකී.

171. මෙහි එව්! විසිතුරු රාජ - මංගල - රථයක් බඳු වූ මේ ලෝකය බලව්! මෝඩයෝ යම් ලෝකයක ඇලී ගැලී වෙසෙද් ද, තතු දන්නවුන්ට එහි ඇලෙන්ට දෙයක් නැත.

172. යමෙක් මුල දී පමා වුවත් පසු ව නො පමා වේ ද, ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි.

170. Look upon the world as a bubble; look upon it as a mirage. The king of death does not see him who thus looks upon the world.

171. Come, look at this world resembling an ornamented royal chariot. Herein fools are sunk, but for the wise there is no attachment.

172. He who formerly was negligent and afterwards becomes vigilant illumines this world like the moon when freed from a cloud.

173. යස්ස පාපං කතං කම්මං
කුසලේන පිථියති,
සෝ ඉමං ලෝකං පභාසේති
අබ්භා මුත්තෝව චන්දිමා.

174. අන්ධභූතෝ අයං ලෝකෝ,
තනුකෙත්ථ විපස්සති,
සකුන්තෝ ජාලමුත්තෝව
අප්පෝ සග්ගාය ගච්ඡති.

175. හංසාදිච්චපථෙ යන්ති,
ආකාසේ යන්ති ඉද්ධියා,
නීයන්ති ධීරා ලෝකම්හා
ජේත්වා මාරං සවාහිනිං.

173. Yassa pāpaṃ kataṃ kammaṃ kusalena pithīyati
So imaṃ lokaṃ pabhāseti abbhā mutto ‘ va candimā.

174. Andhabhuto ayaṃ loko, tanuk’ ettha vipassati,
Sakunto jālamutto ‘ va appo saggāya gacchati.

175 Haṃsādiccapathe yanti, ākāse yanti iddhiyā,
Nīyanti dhīrā lokamhā jetvā māraṃ savāhiniṃ.

173. යමකු කළ පව ඔහුගේ ම කුසලින් වැසේ ද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි.

174. මේ ලෝකය අන්ධ ය. මෙහි ටික දෙනෙක් පමණක් යමක් හරි අංකාර දකිත්. දැලෙන් මිදුණු කුරුල්ලකු මෙන් ටික දෙනෙක් ම ස්වර්ගයට ද යත්.

175. හංසයෝ අහසෙහි යත්. සෘද්ධිමත්හු සෘද්ධි බලයෙන් අහසෙහි යත්. පණ්ඩිතයෝ සේනාව සහිත මාරයා දිනා ලෝකයෙන් නිකුත් ව යත්.

---

173. He who covers the evil done by good deed lights up this world like the moon when freed from a cloud.

174. This world is blind. Here there are few who clearly see. As birds escaped from the nest a few go to heaven.

175. The swans fly on the path of the Sun. (Men) go through the air by psychic power. The wise are led out of the world having conquered Māra and his hosts.

176. ඒකං ධම්මං අතීතස්ස
මුසාවාදිස්ස ජන්තුනෝ,
විතිණ්ණපරලෝකස්ස
නත්ථි පාපං අකාරියං.

177. න වේ කදරියා දේවලෝකං වජන්ති,
බාලා හවේ නප්පසංසන්ති දානං,
ධීරෝ ච දානං අනුමෝදමානෝ,
තේනේව සෝ හෝති සුඛී පරත්ථ.

178. පඨව්‍යා ඒකරජ්ජේන
සග්ගස්ස ගමනේන වා,
සබ්බලෝකාධිපච්චේන
සෝතාපත්තිඵලං වරං.

**ලෝක වග්ගෝ නිට්ඨිතෝ.**

---

176. Ekaṃ dhammaṃ atītassa musāvādissa jantuno,
Vitiṇṇaparalokassa n' atthi pāpaṃ akāriyaṃ.

177. Na ve kadariyā devalokaṃ vajanti,
Bālā have nappasaṃsanti dānaṃ,
Dhīro ca dānaṃ anumodamāno,
Ten'eva so hoti sukhī parattha.

178. Pathavyā ekarajjena saggassa gamanena vā,
Sabbalokādhipaccena sotāpattiphalaṃ varaṃ.

176. ඇත්ත කීම වැනි එක ම ධර්මයක් ඉක්මවූ නැත හොත් බොරු කියන්නා වූ, පරලොව ගැන තැකීමක් නැත්තා වූ පුද්ගලයාට නො කළ හැකි පවක් නැත.

177. මසුරෝ කිසි කලෙකත් දෙව් ලොව නො යත්. මෝඩයෝ කවදා වත් දන් දීම නො පසසත්. පණ්ඩිතයා දානයෙහි පින ද අනුමෝදන් ව එයින් ම පරලොව සැප විඳින්නෙක් වේ.

178. මුළු පොළොවට ම රජ වීමටත්, දෙව් ලොව යෑමටත්, මුළු ලොවේ අධිපතිකම ලැබීමටත් වඩා සෝවාන් ඵලයෙහි පිහිටීම උතුම් ය.

ලෝක වර්ගය නිමි.

---

176. There is no evil that cannot be done by a lying one, who has transgressed the one precept, and who scoffs at another world.

177. Verily, the misers do not go to heaven. Fools, indeed, do not praise charity. The wise man rejoices in giving, and thereby becomes happy hereafter.

178. Better than sole sovereignty on earth, better than going to heaven, better than lordship over all the worlds, is the reward of a stream-winner.

---

## බුද්ධ වග්ගෝ චුද්දසමෝ.

179. යස්ස ජිතං නාවජීයති,
ජිතමස්ස නෝ යාති කෝචි ලෝකේ,
තං බුද්ධමනන්තගෝචරං
අපදං කේන පදේන නෙස්සථ?

180. යස්ස ජාලිනී විසත්තිකා
තණ්හා නත්ථි කුහිංචි නේතවේ,
තං බුද්ධමනන්තගෝචරං
අපදං කේන පදේන නෙස්සථ?

181. යේ ඣානපසුතා ධීරා
නෙක්ඛම්මූපසමේ රතා,
දේවාපි තේසං පිහයන්ති
සම්බුද්ධානං සතීමතං.

## *XIV. BUDDHAVAGGO CUDDASAMO*

179. Yassa jitaṃ nāvajīyati, jitam' assa no yāti koci loke,
Taṃ Buddhaṃ anantagocaraṃ apadaṃ kena padena nessatha ?

180. Yassa jālinī visattikā taṇhā n'atthi kuhiñci netave,
Taṃ Buddhaṃ anantagocaraṃ apadaṃ kena padena nessatha ?

181. Ye jhānapasutā dhīrā nekkhammupasame ratā,
Devā'pi tesaṃ pihayanti sambuddhānaṃ satīmataṃ.

## 14. බුද්ධ වර්ගය.

179. යමකුගේ ජය නැවත කිසි විටක පරාජය කළ නො හැකි ද, යමකු විසින් පරදවන ලද කෙලෙස් වලින් එකක් වත් නැවත ඔහු ලුහු නො බඳී ද, අනන්ත දේ අරමුණු කොට ඇති, කෙලෙස් පද නැති ඒ බුදු රජු මොන පදයකින් (=දෙයකින්, පිළිවෙළකින්) මාරයා කරා ගෙන ගිය හැකි ද?

180- යමකුට අරමුණු වැලඳ ගෙන සිටින්නා වූත්, අරමුණුවල ඇලී සිටින්නා වූත්, තණ්හාව නැද් ද, අනන්ත දේ අරමුණු කොට ඇති, කෙලෙස් පද නැති ඒ බුදු රජු මොන පදයකින් (=දෙයකින්, පිළිවෙළකින්) මාරයා කරා ගෙන ගිය හැකි ද?

181. යම් පණ්ඩිත කෙනෙක් ධ්‍යාන භාවනායෙහි යෙදුණාහු ද, නිවනෙහි ඇලුණාහු ද මනා සිහිය ඇති ඒ බුදුවරුන්ට දෙවියෝ ද කැමැති වෙත්.

## XIV. THE ENLIGHTENED ONE

179. Whose conquest is not conquered again, whom not even a bit of those conquered passions follows, that pathless, Awakened One of infinite range, by what way will you lead ?

180. In whom there is no net-like poisonous craving to lead to any life, that pathless, Awakened One of infinite range, by what way will you lead ?

181. Even the gods hold dear those Enlightened, thoughtful wise ones, who are given to meditation, who delight in the peace of emancipation.

182. කිච්ඡෝ මනුස්සපටිලාභෝ,
කිච්ඡං මච්චාන ජීවිතං,
කිච්ඡං සද්ධම්මසවණං,
කිච්ඡෝ බුද්ධානං උප්පාදෝ.

183. සබ්බපාපස්ස අකරණං,
කුසලස්ස උපසම්පදා,
සචිත්තපරියෝදපනං,
ඒතං බුද්ධාන සාසනං.

184. ඛන්ති පරමං තපෝ තිතික්ඛා
නිබ්බාණං පරමං වදන්ති බුද්ධා,
න හි පබ්බජිතෝ පරූපඝාති,
සමණෝ හෝති පරං විහේඨයන්තෝ.

182. Kiccho manussapatilābho, kiccham maccāna jīvitaṃ,
Kicchaṃ saddhammasavanaṃ kiccho Buddhānaṃ uppādo.

183. Sabbapāpassa akaraṇaṃ, kusalassa upasampadā,
Sacittapariyodapanaṃ, etaṃ Buddhāna sāsanaṃ.

184. Khantī paramaṃ tapo titikkhā Nibbānaṃ paramaṃ vadanti Buddhā,
Na hi pabbajito parūpaghāti, samaṇo hoti paraṃ vihethayanto.

182. මිනිසත් බව ලැබීම අපහසු ය. මිනිසුන්ගේ දිවි පැවැත්ම අපහසු ය. බණ ඇසීම දුලබ ය. බුදුවරුන්ගේ ඉපදීම දුලබ ය.

183. සියලු පව් නො කළ යුතු ය, කුසල් රැස් කළ යුතු ය, සිය සිත පිරිසිදු කර ගත යුතු ය, යනු සියලු බුදුවරුන්ගේ අනුශාසනා යි.

184. ඉවසීම උතුම් වූ තපස් ගුණයකි. බුදුවරු නිවන උසස් කොට කියත්. අනුන් නසන්නා පැවිද්දෙක් නො වේ. අනුන් පෙළන්නා මහණෙක් නො වේ.

182. It is difficult to be born as a human being; difficult is the hearing of the sublime doctrine; difficult is the rise of the Buddhas.

183. Not to do all evil, to cultivate good, to purify one's mind,—this is the admonition of the Buddhas.

184. Forbearing patience is the highest asceticism. The Buddhas declare Nibbāna to be supreme. He is not a monk who harms another; nor is he an ascetic who molests another.

185. අනූපවාදෝ, අනූපඝාතෝ,
පාතිමොක්ඛෙ ච සංවරෝ,
මත්තඤ්ඤුතා ච භත්තස්මිං,
පන්තං ච සයනාසනං,
අධිචිත්තේ ච ආයෝගෝ,
ඒතං බුද්ධාන සාසනං.

186. න කහාපණවස්සේන
තිත්ති කාමේසු විජ්ජති,
අප්පස්සාදා දුඛා කාමා
ඉති විඤ්ඤාය පණ්ඩිතෝ-

185. Anūpavādo, anūpaghāto, pātimokkhe ca saṃvaro,
Mattaññutā ca bhattasmiṃ, panthañ ca sayanāsanaṃ,
Adhicitte ca āyogo, etaṃ Buddhāna sāsanaṃ.

186. Na kahāpaṇavassena titti kāmesu vijjati,
Appassādā dukhā kāmā iti viññāya paṇḍito—

185. අනුන්ට හෙළා තලා කථා නො කළ යුතු ය, අනුන්ට හිංසා නො කළ යුතු ය, ප්‍රාතිමෝක්ෂ සංවරය ඇති කර ගත යුතු ය, ආහාරයෙහි පමණ දත යුතු ය, විවේක සේනාසනයෙහි ඇලුම් කළ යුතු ය, සමවත් වැඩිය යුතු ය, යනු සියලු බුදුවරුන්ගේ අනුශාසනා යි.

186. කහවණු වැස්සකිනුත් මිනිසාට කාමයන්හි (ආශාවෙහි) තෘප්තියක් ඇති නො වේ. මේ නිසා පණ්ඩිතයා කාමය මඳ ආස්වාද (සැප) ඇත්තක් බවත්, දුක් බහුල දෙයක් බවත් නුවණින් දැන–

185. Not reviling, not harming, restraint according the fundamental precepts, moderate in eating, dwelling in solitude, diligence in higher thought,—this is the admonition of the Buddhas.

186. There is no satisfaction of one's desires or sensual pleasures by a shower of gold coins. The wise man, having known that sensual pleasures are of little sweetness, but painful—

187. අපි දිබ්බෙසු කාමෙසු
රතිං සො නාධිගච්ඡති,
තණ්හක්ඛයරතො හොති
සම්මාසම්බුද්ධ සාවකො.

188. බහුං වෙ සරණං යන්ති
පබ්බතානි වනානි ච,
ආරාමරුක්ඛචෙත්‍යානි
මනුස්සා භයතජ්ජිතා.

189. නෙතං ඛො සරණං ඛෙමං,
නෙතං සරණමුත්තමං,
නෙතං සරණමාගම්ම
සබ්බදුක්ඛා පමුච්චති.

187. Api dibbesu kāmesu ratiṃ so nādhigacchati,
Taṇhakkhayarato hoti sammāsambuddhasāvako.

188. Bahuṃ ve saraṇaṃ yanti pabbatāni vanāni ca,
Ārāma-rukka-cetyāni manussā bhayatajjitā.

189. N'etaṃ kho saraṇaṃ khemaṃ, n'etaṃ saraṇam uttamaṃ,
N'etaṃ saraṇam āgamma sabba dukkhā pamuccati.

187. දිව්‍ය කාම සම්පත්වල පවා නො ඇලෙසි. සම්බුද්ධ ශ්‍රාවකයා (ආශාවෙන් බැදෙනු වෙනුවට) තණ්හාව නැති කිරීම් සංඛ්‍යාත නිවනෙහි ඇලුණෙක් වේ.

188. බියෙන් තැති ගත් මිනිස්සු පර්වත, කැලෑ, ආරාම, ගස්, චෛත්‍ය යන මේ දේ බොහෝ සෙයින් සරණ කොට යත්.

189. මේ කිසිවක් හෙවත් කිසි සරණයක් බිය රහිත නො වේ. උතුම් ද නො වේ. මේ කිසි සරණයකට පැමිණ සියලු දුකින් මිදෙන්ට ද නො පිළිවන.

187. Finds no delight even in heavenly pleasures. The desciple of the fully Awakened One delights in the destruction of desire.

188. Verily, many fear stricken men resort to refuge to hills, woods, groves, trees and shrines.

189. But that is no safe refuge, that is no supreme refuge. Resorting to such a refuge one is not released from all suffering.

190. යෝ ච බුද්ධං ච ධම්මං ච
සංඝං ච සරණං ගතෝ,
චත්තාරි අරියසච්චානි
සම්මප්පඤ්ඤාය පස්සති.

191. දුක්ඛං, දුක්ඛසමුප්පාදං,
දුක්ඛස්ස ච අතික්කමං,
අරියං චට්ඨංගිකං මග්ගං
දුක්ඛූපසමගාමිනං.

192. ඒතං ඛෝ සරණං ඛේමං,
ඒතං සරණ මුත්තමං,
ඒතං සරණමාගම්ම
සබ්බදුක්ඛා පමුච්චති.

190. Yo ca Buddhañ ca Dhammañ ca Sanghañ ca saraṇaṃ gato,
Cattāri ariyasaccāni sammappaññāya passati.

191. Dukkhaṃ, dukkhasamuppādam, dukkhassa ca atikkamaṃ,
Ariyañ c' atthaṇgikaṃ maggaṃ dukkhūpasamagāminaṃ.

192. Etaṃ kho saraṇaṃ khemaṃ, etaṃ saraṇam uttamaṃ,
Etaṃ saraṇam āgamma sabbadukkhā pamuccati.

190. යමෙක් බුදුන්, දහම් හා සඟුන් සරණ යයි ද, චතුරාර්ය සත්‍යය මනා නුවණින් දකී ද (ඔහු ම දුකින් මිදේ.)

191. දුක, දුක ඇති වීම, දුක නැති කිරීම, දුක නැති කිරීමේ මඟ වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය යන චතුරාර්ය සත්‍යය යමෙක් දකී ද (ඔහු ම දුක නැති කර ගනී.)

192. නිර්භය සේ සැලකිය යුත්තේත්, උතුම් කොට සැලකිය යුත්තේත් ඒ (ත්‍රිවිධ රත්නයේ) සරණ ම ය. ඒ නිසා මිනිසා ඒ සරණයට පැමිණ හෙවත් ඒ සරණ ලබා සියලු දුකින් මිදේ.

190. He who takes refuge in the Buddha, the Dhamma, and the Sangha perceives with clear wisdom the four Noble Truths—

191. Suffering, the cause of suffering, the cessation of suffering, and the Noble Eightfold Path which leads to the cessation of suffering.—

192. This, indeed, is the safe refuge, this is the supreme refuge. Resorting to such a refuge one is released from all suffering.

193. දුල්ලභො පුරිසාජඤ්ඤො
න සො සබ්බත්ථ ජායති,
යත්ථ සො ජායති ධීරො
තං කුලං සුඛමෙධති.

194. සුඛො බුද්ධානං උප්පාදො,
සුඛා සද්ධම්මදේසනා,
සුඛා සංඝස්ස සාමග්ගි,
සමග්ගානං තපො සුඛො.

193. Dullabho purisājañño na so sabbattha jāyati,
Yattha so jāyati dhīro taṃ kulaṃ sukham edhati.

194. Sukho Buddhānaṃ uppādo, sukhā saddhammadesanā,
Sukhā sanghassa sāmaggi, samaggānaṃ tapo sukho.

193. පුරුෂ ශ්‍රේෂ්ඨයා දුර්ලභ කෙනෙකි. ඔහු හැම තැන ම නූපදී. ඒ වීරයා යම් කුලයක උපදී නම් එය සැපයට පැමිණේ.

194. බුදුවරුන්ගේ ඉපදීම සැපයකි. සදහම් දෙසීම සැපයකි. සංඝයාගේ සමගිය සැපයකි. සමගියෙන් කල් යවන්නන්ගේ තපස සැපයකි.

193. It is difficult to be found a thorough-bread man. He is not born everywhere. Wherever such a wise man is born that household thrives happily.

194. Blessed is the birth ot the Buddhas. Blessed is the preaching of the Noble Doctrine. Blessed is the unity of the Sangha. Blessed is the asceticism of the united.

195. පූජාරහේ පූජයතෝ
බුද්ධේ යදි ව සාවකේ,
පපංචසමතික්කන්තේ
තිණ්ණසෝක පරිද්දවේ,-

196. තේ තාදිසේ පූජයතෝ
නිබ්බුතේ අකුතෝභයේ,
න සක්කා පුඤ්ඤං සංඛාතුං
ඉමෙත්තමිති කේනචි.

බුද්ධ වග්ගෝ නිට්ඨිතෝ.

---

පඨමක භාණවාරං.

---

195 Pūjārahe pūjayato Buddhe yadi va sāvake,
Papañcasamatikkante tiṇṇasokapariddave,—

196. Te tādise pūjayato nibbute akutobhaye,
Na sakkā puññaṃ saṃkhātuṃ im' ettam iti kena ci.

---

195. සියලු පූජාවන්ට සුදුසු වූ, තෘෂ්ණා මාන ඉක්ම වූ, ශෝක, වැලපීම් නැති කළා වූ බුදුන්ට හෝ බුදු සව්වන්ට යමෙක් පුදයි ද,-

196. කෙලෙස් ගිනි නිවා ගත්, කිසි ලෙසකිනුත් බියක් නැති එබඳු උතුමන්ට පූජා කරන්නාහුට ලැබෙන පින මෙ පමණ ය යි ගණන් කොට කියන්ට කිසිවකු වත් නො හැකි ය.

බුද්ධ වර්ගය නිමි.

---

පළමු වන බණ වර නිමි.

---

195. He who reverences those who are worthy of reverence, whether the Buddhas or their disciples, who have transcended all obstacles, crossed beyond the reach of distress and lamentation,—

196. He who reverences such peaceful and fearless ones, his merit cannot be measured by anyone as such and such.

---

## සුඛ වග්ගෝ පණ්ණරසමෝ.

197. සුසුඛං වත ජීවාම
වෙරිනේසු අවෙරිනෝ,
වෙරිනේසු මනුස්සේසු
විහරාම අවෙරිනෝ.

198. සුසුඛං වත ජීවාම
ආතුරේසු අනාතුරා,
ආතුරේසු මනුස්සේසු
විහරාම අනාතුරා.

199. සුසුඛං වත ජීවාම
උස්සුකේසු අනුස්සුකා,
උස්සුකේසු මනුස්සේසු
විහරාම අනුස්සුකා.

## *XV. SUKHAVAGGO PAṆṆARASAMO*

197. Susukhaṃ vata jīvāma verinesu averino,
Verinesu manussesu viharāma averino.

198. Susukhaṃ vata jīvāma āturesu anāturā,
Āturesu manussesu viharāma anāturā.

199. Susukhaṃ vata jīvāma ussukesu anussukā,
Ussukesu manussesu viharāma anussukā.

## 15. සුඛ වග්ගය.

197. වෛර සහිත ව ජීවත් වන මිනිසුන් අතුරෙහි අපි වෛර රහිත ව ඒකාන්තයෙන් ම ඉතා සුව සේ ජීවත් වෙමු. අපි වෛරීන් මැද අවෛරී ව වෙසෙමු.

198. කෙලෙස්වලින් ආතුර ව - ලෙඩ ව - ජීවත් වන මිනිසුන් අතුරෙහි අපි කෙලෙස්වලින් අනාතුර ව - ලෙඩ නො වී - ඒකාන්තයෙන් ම ඉතා සුව සේ ජීවත් වෙමු. අපි ආතුරයන් මැද අනාතුර ව වෙසෙමු.

199. කම් සැප සෙවීමෙහි උත්සාහවත් වූ මිනිසුන් අතුරෙහි අපි එබඳු උත්සාහයක් නැති ව ඒකාන්තයෙන් ම ඉතා සුව සේ ජීවත් වෙමු. අපි උත්සුකයන් මැද අනුත්සුක ව වෙසෙමු.

## XV. HAPPINESS

197. Happily, indeed, we live, without hate among the hateful. We live free from hate amidst hateful men.

198. Happily, indeed, we live in good health among the ailing. We live free from disease amidst diseased men.

199. Happily, indeed, we live unanxious among the anxious. We live free from anxiety amidst anxious men.

200. සුසුඛං වත ජීවාම
යේසං නෝ නත්ථි කිංචනං.
පීතිභක්ඛා භවිස්සාම
දේවා ආභස්සරා යථා.

201. ජයං වේරං පසවති,
දුක්ඛං සේති පරාජිතෝ,
උපසන්තෝ සුඛං සේති
හිත්වා ජය පරාජයං.

202. නත්ථි රාගසමෝ අග්ගි,
නත්ථි දෝසසමෝ කලි,
නත්ථි ඛන්ධාදිසා දුක්ඛා,
නත්ථි සන්ති පරං සුඛං.

200. Susukhaṃ vata jīvāma yesaṃ no n'atthi kiñcanaṃ.
Pītibhakkhā bhavissāma devā ābhassarā yathā.

201. Jayaṃ veraṃ pasavati, dukkhaṃ seti parājito,
Upasanto sukhaṃ seti hitvā jaya parājayaṃ

202. N'atthi rāgasamo aggi, n'atthi dosasamo kali,
N'atthi khandhādisā dukkhā, n'atthi santiparaṃ sukhaṃ

200. යම් කෙනකුන්ට රාගාදි වූ කිසි ම පලිබෝධයක් නැද් ද, එබඳු වූ අපි ඒකාන්තයෙන් ම ඉතා සුව සේ ජීවත් වෙමු. අපි ආභස්සර බඹ ලොවේ දෙවියන් හෙවත් බ්‍රහ්මයන් සේ සමවත් සුවෙන් ඇති වන ප්‍රීතිය වළඳන්නෝ වන්නෙමු.

201. දිනන්නා පරදින්නා තුළ වෛරය ඇති කරයි. පරදින්නා දුක සේ වෙසේ. උපශාන්තයා ජයත්, පරාජයත් හැර සුව සේ වෙසේ.

202. රාගය සමාන ගින්නක් නැත. ද්වේෂය සමාන අපරාධයක් නැත. ස්කන්ධයන්ගේ පැවැත්ම හා සමාන දුකක් නැත. ශාන්තියට හෙවත් නිවනට වැඩි සැපයක් නැත.

200. We who possess nothing, do live happily, indeed. We will be feeding on happiness like the Radiant Gods.

201. Victory breeds hatred; the defeated lies in sorrow. He who is peaceful lies in happiness by giving up victory and defeat.

202. There is no fire like lust, no crime like hatred. There is no sorrow like the constituents of existence, no happiness higher than tranquility.

203. ජිඝච්ඡාපරමා රෝගා
සංඛාරපරමා දුඛා,
ඒතං ඤත්වා යථාභූතං
නිබ්බානං පරමං සුඛං.

204. ආරෝග්‍යපරමා ලාභා,
සන්තුට්ඨී පරමං ධනං,
විස්සාසපරමා ඤාති,
නිබ්බානං පරමං සුඛං.

205. පවිවේකරසං පීත්වා
රසං උපසමස්ස ච,
නිද්දරෝ හෝති නිප්පාපෝ
ධම්මපීතිරසං පිබං.

203. Jighacchā paramā rogā sankhāra paramā dukhā,
Etaṃ ñatvā yathābhūtaṃ nibbānaṃ paramaṃ sukhaṃ

204. Ārogyaparamā lābhā, santutthi paramaṃ dhanaṃ.
Vissāsaparamā ñāti, nibbānaṃ paramaṃ sukhaṃ.

205. Pavivekarasaṃ pītvā rasaṃ upasamassa ca,
Niddaro hoti nippāpo dhammapītirasaṃ, pibaṃ.

203. සියලු රෝග බඩ ගින්නට යට ය. සියලු දුක් සංස්කාරයන්ගේ පැවතීම් සංඛ්‍යාත දුකට යට ය. මෙය ඇති පරිද්දෙන් දැන ගෙන අනික් සැප ද නිවනට යට බව වටහා ගත යුතු ය.

204. සියලු ලාභ නිරෝගී බවට යට ය. සියලු ධනය සතුටට යට ය. නෑයා විශ්වාසයට යට ය. (විශ්වාසයට වැඩි නෑයෙක් නැත ) සියලු සැප නිවනට යට ය.

205. විවේක සැපයේ රසයත්, දහම් ඇසීමෙන් හෝ දැනීමෙන් ලබන ප්‍රීති රසයත්, නිවන් සැපයේ රසයත් බී, කරදරත්, පවුත් නැති කර ගත යුතු ය.

203. Hunger is the worst of diseases; component existence is the worst of sorrows. To him who knows this really Nibbāna is the highest bliss.

204 Health is the highest gift; contentment is the greatest wealth; the trustful is the best kinsman; Nibbāna is the supreme bliss

205. Having tasted the sweetness of solitude and the sweetness of tranquility one becomes woeless and stainless while imbibing the flavour of Dhamma.

206. සාහු දස්සනමරියානං
සන්නිවාසෝ සදා සුඛෝ,
අදස්සනේන බාලානං
නිච්චමේව සුඛී සියා.

207. බාලසංගතචාරී හි
දීඝමද්ධාන සෝචති.
දුක්ඛෝ බාලේහි සංවාසෝ
අමිත්තේනේව සබ්බදා,
ධීරෝ ච සුඛසංවාසෝ
ඤාතීනංව සමාගමෝ.

208. තස්මා හි—
ධීරං ච පඤ්ඤං ච බහුස්සුතං ච,
ධෝරය්හසීලං වතවන්තමාරියං,
තං තාදිසං සප්පුරිසං සුමේධං.
භජේථ නක්ඛත්තපථංව චන්දිමා.

සුඛ වග්ගෝ නිට්ඨිතෝ.

---

206. Sāhu dassanam ariyānaṃ sannivāso sadā sukho,
Adassanena bālānaṃ niccam eva sukhī siyā.

207. Bālasangatacārī hi dīgham addhāna socati,
Dukkho bālehi saṃvāso amitten eva sabbadā
Dhīro ca sukhasamvāso ñātīnaṃ va samāgamo.

208. Tasmā hi—
Dhīraṃ ca paññañ ca bahussutañ ca,
Dhorayhasīlaṃ vatavantam āriyaṃ,
Taṃ tādisaṃ sappurisaṃ sumedhaṃ,
Bhajetha nakkhattapathaṃ'va candimā.

---

206. ආර්‍ය්‍යයන් දැක්ම යහපත් ය. ඔවුන් හා එක් වීම හැම දා ම සැප දායක ය. මෝඩයන්ගේ නො දැකීමෙන් ද නිතර ම සැප ඇත්තකු විය හැකි ය.

207. මෝඩයන් හා එක් ව හැසිරෙන්නා බොහෝ කලක් ශෝක කරයි. මෝඩයන් හා එක් ව විසීම සතුරකු හා එක් ව විසීමක් මෙන් හැම දා ම දුකකි. පණ්ඩිතයාට නෑයන් හා එක් වීමක් මෙන් සුචරිතය දියුණු කරන්නන් හා එක් වීම සැපයකි

208. ඒ නිසා අහසෙහි චන්ද්‍රයා වැජඹෙන්නාක් මෙන් එබඳු වූ නැණවත්, ප්‍රඥාවත්, බහුශ්‍රැත වූ, ප්‍රතිපත්ති ධුර දරන, ව්‍රත සම්පන්න වූ, බුද්ධිමත් සත්පුරුෂයා ඇසුරු කළ යුතු ය.

සුඛ වර්ගය නිමි.

---

206. Good is the sight of the Noble Ones; their company is always happiness; one will ever be happy who does not see fools.

207. Verily, he who moves in the company of fools grieves for long. Association with fools as with a foe is ever painful. Happy is the association with the wise, as meeting with one's kinsfolk.

208. Therefore verily—as the moon follows the starry path one should follow the intelligent, the wise, the learned, the devout, the dutiful and the noble.

---

## පිය වග්ගෝ සොළසමෝ.

209. අයෝගේ යුංජමත්තානං
යෝගස්මිං ච අයෝජයං,
අත්ථං හිත්වා පියග්ගාහී
පිහේතත්තානුයෝගිනං.

210. මා පියේහි සමාගංඡි,
අප්පියේහි කුදාචනං,
පියානං අදස්සනං දුක්ඛං,
අප්පියානං ච දස්සනං.

211. තස්මා පියං න කයිරාථ,
පියාපායෝ හි පාපකෝ,
ගන්ථා තේසං න විජ්ජන්ති
යේසං නත්ථි පියාප්පියං.

## *XVI. PIYAVAGGO SOḶASAMO*

209. Ayoge yuñjam attānaṃ yogasmiñ ca ayojayaṃ,
Atthaṃ hitvā piyaggāhi pibet' attānuyoginaṃ.

210. Mā piyehi samāgañchi appiyehi kudācanaṃ,
Piyānaṃ adassanaṃ dukkhaṃ, appiyānañ ca dassanaṃ.

211. Tasmā piyaṃ na kayirātha, piyāpāyo hi pāpako,
Ganthā tesaṃ na vijjanti yesaṃ n' atthi piyāppiyaṃ

## 16. ප්‍රිය වර්ගය

209. තමා නො යෙදිය යුත්තෙහි යොදනා, යෙදිය යුත්තෙහි නො යොදනා, වැඩ ඇති තුන් ශික්‍ෂා පිරීම හැර දමා පස්කම් සුව ම ප්‍රිය කොට ගන්නා වූ පුද්ගලයා තමාට වැඩක් සිදු කර ගන්නා වූ ආත්මානුයෝගියා දැක ඔහුට කැමැති වෙයි.

210. ප්‍රියයන් සමඟ එක් නො වව්! අප්‍රියයන් සමඟ නම් කිසි කලෙකත් එක් නො වව්! ප්‍රියයන්ගේ නො දැක්ම දුකකි. එසේ ම අප්‍රියයන්ගේ දැක්මත් දුකකි.

211. කිසි කෙනකු හෝ කිසි දෙයක් ප්‍රිය කොට නො ගත යුතු ය. ප්‍රියයන්ගෙන් වෙන් වීම දුරිය නො හැකි (ලාමක) කරුණකි. යම් කෙනකුන්ට ප්‍රිය, අප්‍රිය යන දෙක ම නැද් ද, ඔවුන්ට කෙලෙස් ගැට ද නැත.

## XVI. AFFECTIONS

209. Devoting oneself to that which should be avoided, and not devoting to that which should be adhered, giving up one's own welfare, and grasping at pleasure, one envies him who exerts himself.

210. Seek no intimacy with the dear, and never with the unbeloved. Not to see these who are dear and to see those who are not dear is painful

211. Therefore hold nothing dear, for separation from the loved object is evil. No bonds are there for those to whom nothing is pleasant or unpleasant.

212. පියතෝ ජායති සෝකෝ,
පියතෝ ජායති භයං,
පියතෝ විප්පමුත්තස්ස
නත්ථි සෝකෝ, කුතෝ භයං?

213. පේමතෝ ජායති සෝකෝ,
පේමතෝ ජායති භයං,
පේමතෝ විප්පමුත්තස්ස
නත්ථි සෝකෝ, කුතෝ භයං?

214. රතියා ජායති සෝකෝ,
රතියා ජායති භයං,
රතියා විප්පමුත්තස්ස
නත්ථි සෝකෝ, කුතෝ භයං?

212. Piyato jāyatī soko, piyato jāyatī bhayaṃ,
Piyato vippamuttassa n' atthi soko, kuto bhayaṃ ?

213. Pemato jāyatī soko, pemato jāyatī bhayaṃ ?
Pemato vippamuttassa n'atthi soko, kuto bhayaṃ ?

214. Ratiyā jāyatī soko, ratiyā jāyatī bhayaṃ,
Ratiyā vippamuttassa n' atthi soko, kuto bhayaṃ ?

212. ප්‍රිය බව නිසා නැත හොත් ප්‍රියයා නිසා ශෝකය හට ගනී; ප්‍රියයා නිසා බිය හට ගනී: ප්‍රියයාගෙන් වෙන් වූවහුට ශෝකයක් නැත. (එසේ නම්) බියක් කොයින් ද?

213. ප්‍රේමය නිසා ශෝකය හට ගනී. ප්‍රේමය නිසා බිය හට ගනී. ප්‍රේමයෙන් වෙන් වූවහුට ශෝකයක් නැත. (එසේ නම්) බියක් කොයින් ද?

214. ඇල්ම නිසා ශෝකය හට ගනී. ඇල්ම නිසා බිය හට ගනී. ඇල්මෙන් වෙන් වූවහුට ශෝකයක් නැත. (එසේ නම්) බියක් කොයින් ද?

212. From endearment arises grief, from endearment arises fear. To one who is free from endearment there is no grief, whence fear ?

213. From affection arises grief, from affection arises fear. To one who is free from affection there is no grief, whence fear ?

214. From attachment arises grief, from attachment arises fear. To one who is free from attachment there is no grief, whence fear ?

215. කාමතො ජායති සොකො,
කාමතො ජායති භයං,
කාමතො විප්පමුත්තස්ස
නත්ථි සොකො, කුතො භයං?

216. තණ්හාය ජායති සොකො,
තණ්හාය ජායති භයං,
තණ්හාය විප්පමුත්තස්ස
නත්ථි සොකො, කුතො භයං?

217. සීලදස්සනසම්පන්නං
ධම්මට්ඨං සච්චවේදිනං,
අත්තනො කම්ම කුබ්බානං
තං ජනො කුරුතේ පියං?

215. Kāmato jāyatī soko, kāmato jāyatī bhayaṃ,
Kāmato vippamuttassa n'atthi soko, kuto bhayaṃ ?

216. Taṇhāya jāyatī soko, taṇhāya jāyatī bhayaṃ,
Taṇhāya vippamuttassa n'atthi soko, kuto bhayaṃ ?

217. Sīladassanasampannaṃ dhammatthaṃ saccavedinaṃ,
Attano kamma kubbānaṃ taṃ jano kurute piyaṃ.

215. වස්තු කාම, ක්ලේශ කාම දෙක නිසා ශෝකය හට ගනී. ඒ නිසා බිය ද හට ගනී. එයින් වෙන් වූවහුට ශෝකයක් නැත. (එසේ නම්) බියක් කොයින් ද?

216. අංශාව නිසා ශෝකය හට ගනී. අශාව නිසා බිය හට ගනී. අාශාංවෙන් වෙන් වූවහුට ශෝකයක් නැත. (එසේ නම්) බියක් කොයින් ද?

217. සිවු පිරිසිදු සීලයෙන් හා සම්‍යක් දෘෂ්ටියෙන් යුක්ත වූ, ධර්මයෙහි පිහිටි, සත්‍යාවබෝධය කළ, තමාගේ කටයුතු (ත්‍රිවිධ ශික්‍ෂා පිරීම) කරන පුද්ගලයාට ජනයා ප්‍රිය කරත්.

215 From lust arises grief, from lust arises fear. To him who is free from lust there is no grief, whence fear ?

216. From craving arises grief, from craving arises fear. To him who is free from craving there is no grief, whence fear ?

217. Whoso is endowed with virtue and insight, is established in the Dhamma, realises Truths, and fulfils his own duties, him the people hold dear.

218. ඡන්දජාතො අනක්ඛාතෙ
මනසා ච ඵුටො සියා,
කාමෙසු ච අප්පටිබද්ධචිත්තො
උද්ධං සොතොති වුච්චති.

219. චිරප්පවාසිං පුරිසං
දූරතො සොත්ථිමාගතං,
ඤාතිමිත්තා සුහජ්ජා ච
අභිනන්දන්ති ආගතං.

220. තථෙව කතපුඤ්ඤම්පි
අස්මා ලොකා පරං ගතං,
පුඤ්ඤානි පතිගණ්හන්ති
පියං ඤාතිංව ආගතං;

**පිය වග්ගො නිට්ඨිතො.**

---

218. Chandajāto anakkhāte manasā ca phuto siyā,
Kāmesu ca appatibaddhacitto uddhaṃsoto'ti vuccati

219. Cirappavāsiṃ purisaṃ dūrato sotthim āgatam;
Ñātimittā suhajjā ca abhinandanti āgataṃ;

220. Tath'eva katapuññam pi asmā lokā paraṃ gataṃ,
Puññāni patigaṇhanti piyaṃ ñātim'va āgataṃ.

218. යමකුට නිවනෙහි හට ගත්-යෙදුණු-ඡන්දය ඇද්ද, යමෙක් සිතිනුත් එය ස්පර්ශ කරසි ද, කාමයන්හි නො බැඳුණේ ද එබඳු පුද්ගලයා උද්ධංසෝතයෙකැ (=ජල පහරේ ඉහළට යන්නෙකැ) සි කියනු ලැබේ.

219. නෑදෑ මිත්‍රයෝත්, හිතවත්තුත් කලක් වෙන් ව සිට, දුර සිට පැමිණි පුද්ගලයාට ආයුබෝවන් කියා පිළිගෙන යම් සේ තුටු වෙද් ද,

220. එසේ ම පුණ්‍ය විපාකයෝ කළ පින් ඇත්තා මෙ ලොවින් පරලොවට ගිය කල ප්‍රිය නෑයකු මෙන් පිළිගනිත්.

ප්‍රිය වර්ගය නිමි.

---

218. He who has an inspiration for the undeclared (Nibbāna), whose mind is thrilled, whose thought is freed from desires, he is called 'One bound Upstream.'

219 When a man after a long absence returns safe from afar, kinsmen, friends and well-wishers receive him gladly.

220. Likewise his good deeds receive the doer who has gone from this world to the next, as kinsmen receive a friend on his return.

---

## කෝධ වග්ගෝ සත්තරසමෝ.

221. කෝධං ජහේ, විප්පජහෙය්‍ය මානං,
සංයෝජනං සබ්බමතික්කමෙය්‍ය,
තං නාමරූපස්මිං අසජ්ජමානං
අකිංචනං නානුපතන්ති දුක්ඛා.

222. යෝ වේ උප්පතිතං කෝධං
රථං භන්තංව ධාරයේ,
තමහං සාරථිං බ්‍රෑමි,
රස්මිග්ගාහෝ ඉතරෝ ජනෝ.

## *XVII. KODHAVAGGO SATTARASAMO*

221. Kodaṃ jahe, vippajaheyya mānaṃ,
Saññojanaṃ sabbam atikkameyya,
Taṃ nāmarūpasmiṃ asajjamānaṃ,
Akiñcanaṃ nānupatanti dukkhā.

222. Yo ve uppatitaṃ kodhaṃ rathaṃ bhantaṃ 'va dhāraye,
Taṃ ahaṃ sārathiṃ brūmi, rasmiggāho itaro jano.

## 17. ක්‍රෝධ වර්‍ගය.

221. යමෙක් ක්‍රෝධය දුරු කරයි ද, මානය පහ කරයි ද, සියලු සංයෝජන (බැඳුම්) ඉක්මවයි ද, නාම රූප දෙක්හි නො ලැඟෙන, රාගාදි පළිබෝධ රහිත වූ ඒ විරාගියා මතු පිට දුකක් නො වැටේ.

222. යමෙක් සිතේ හට ගත් ක්‍රෝධය නො මඟ ගිය රථයක් හසුරුවා ගන්නා වූ රියැදුරකු මෙන් මනා ව හසුරුවා ගනී ද, ඔහු නියම රියැදුරෙකැ යි මම කියමි. සාමාන්‍ය රථ වාහන දක්කන සෙසු ජනයා නිකම් තෝන් ලනුව අල්ලන්නෝ ය.

## XVII. ANGER

221. One should give up anger, renounce pride, and go beyond all fetters No sufferings befall him who is unattached to mind and body, and who owns nothing.

222. Whoso checks rising anger as a chariot gone astray, him I call a real charioteer; others only hold the reins.

223. අක්කෝධේන ජිනේ කෝධං,
අසාධුං සාධුනා ජිනේ,
ජිනේ කදරියං දානේන,
සච්චේන අලිකවාදිනං.

224. සච්චං භණේ, න කුජ්ඣෙය්‍ය,
දජ්ජාප්පස්මිම්පි යාචිතෝ,
එතේහි තීහි ඨානේහි
ගච්ඡේ දේවාන සන්තිකේ.

225. අහිංසකා යේ මුනයෝ
නිච්චං කායේන සංවුතා,
තේ යන්ති අච්චුතං ඨානං
යත්ථ ගන්ත්වා න සෝචරේ.

223 Akkodhena jine kodhaṃ, asādhuṃ sādhunā jine,
Jine kadariyaṃ dānena, saccena alikavādinaṃ.

224. Saccaṃ bhaṇe, na kujjheyya, dajjā 'ppasmim pi yācito,
Etehi tīhi thānehi gacche devāna santike.

225 Ahiṃsakā ye munayo, niccaṃ kāyena saṃvutā,
Te yanti accutaṃ thānaṃ yattha gantvā na socare.

223. අක්‍රෝධයෙන් ක්‍රෝධ කරන්නා දිනිය යුතු ය; අසත්පුරුෂයා සත්පුරුෂකමින් දිනිය යුතු ය; මසුරා දීමෙන් - ත්‍යාගයෙන් - දිනිය යුතු ය; බොරු කියන්නා සත්‍යයෙන් දිනිය යුතු ය.

224. ඇත්ත කිය යුතු ය; නො කිපිය යුතු ය; අනිකකු යමක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතු ය; මේ තුන් කරුණින් කෙනකුට දෙවියන් වෙත යත හැකි ය.

225. නිතර කයින් සංවර වූ යම් අහිංසක මුනිවරු වෙද් ද, ඔවුහු යම් තැනකට ගොස් ශෝක නො කරද් ද ඒ තැන වූ නිවනට යත්.

223. Overcome anger by non-anger, evil by good stingy by liberality, and liar by truth.

224. Speak the truth; do not yield to anger; give even a little to him who asks. By these three means one may go to the presence of Gods.

225 Those sages who are harmless, who always control their body, go to the imperishable state, whither gone they do not grieve.

226. සදා ජාගරමානානං,
අහෝරත්තානුසික්ඛිනං,
නිබ්බානං අධිමුත්තානං,
අත්ථං ගච්ඡන්ති ආසවා.

227. පෝරාණමෙතං අතුල,
නේතං අජ්ජතනාමිව
නින්දන්ති තුණ්හිමාසීනං,
නින්දන්ති බහුභාණිනං,
මිතභාණිනම්පි නින්දන්ති,
නත්ථි ලෝකේ අනින්දිතෝ.

226. Sadā jāgaramānānaṃ, ahorattānusikkhinaṃ,
Nibbānaṃ adhimuttānaṃ, atthaṃ gacchanti āsavā.

227. Porānaṃ etaṃ, Atula! n' etaṃ ajjatanām iva:
Nindanti tuṇhim āsīnaṃ, nindanti bahubhāninaṃ,
Mitabhāṇinam pi nindanti, n' atthi loke anindito

226. හැම විට ම අවදි ව සිටින, රෑ දවල් දෙක්හි ත්‍රිවිධ ශික්‍ෂා පුරන, නිවනෙහි ඇලුණු පුද්ගලයන්ගේ ආශ්‍රවයෝ නැති වෙත්.

227. අතුලය, ලෝකයා නිශ්ශබ්ද ව සිටින්නාට ද නින්දා කරත්; බොහෝ සේ කථා කරන්නාට ද නින්දා කරත්; පමණට කථා කරන්නාට ද නින්දා කරත්; ලෝකයෙහි නින්දා නො ලබන්නෙක් නැත. මෙය අදක ඊයෙක ගතියකුත් නො වේ. මෙය පැරණි ගතියකි.

226 Those who are ever vigilant, train themselves by day and by night, ever bent on Nibbāna, their defilements fade away.

227 This is an old saying, O Atula, this is not only of today. They blame him who remains silent, they blame him who talks much, they blame him who speaks in moderation. There is none in the world who is not blamed.

228. න චාහු, න ච භවිස්සති,
න චෙතරහි විජ්ජති,
ඒකන්තං නින්දිතො පොසො,
ඒකන්තං වා පසංසිතො.

229. යං චෙ විඤ්ඤූ පසංසන්ති
අනුවිච්ච සුවෙ සුවෙ,
අච්ඡිද්දවුත්තිං මෙධාවිං
පඤ්ඤාසීලසමාහිතං—

230. නෙක්ඛං ජම්බොනදස්සේව
කො තං නින්දිතුමරහති?
දේවාපි නං පසංසන්ති,
බ්‍රහ්මුනාපි පසංසිතො.

228. Na cāhu, na ca bhavissati, na c' etarahi vijjati,
Ekantaṃ nindito poso, ekantaṃ vā pasamsito.

229. Yañ ce viññu pasaṃsanti anuvicca suve suve,
Acchiddavuttiṃ medhāviṃ paññāsīlasamāhitaṃ—

230. Nekkhaṃ jambonadass'eva ko taṃ ninditum arahati?
Devā 'pi naṃ pasaṃsanti, Brahmunā 'pi pasaṃsito.

228. තනිකර ම නින්දා ලැබූ හෝ, ප්‍රශංසා ලැබූ හෝ පුද්ගලයෙක් පෙර ද නො වී ය; මතු ද නො වන්නේ ය; දැනුදු නැත.

229. පණ්ඩිතයෝ සිදුරු සහිත පැවතුම් ඇති, බුද්ධිමත් වූ, නුවණින් හා ශීලයෙන් යුක්ත වූ යම් පුද්ගලයකුට දින පතා සොයා බලා - කරුණු විමසා - ප්‍රශංසා කෙරෙද් ද,—

230. දඹ රනින් කළ ආභරණයක් බඳු වූ ඔහුට නින්දා කිරීමට කවරෙක් සුදුසු වේ ද? දෙවියෝත් එ බඳු පුද්ගලයාට පසසත්. ඔහු බ්‍රහ්මයා විසින් ද පසස්නා ලද්දෙකි.

228. There never was, nor will be, nor is there now any one who is wholly blamed or wholly praised.

229. By observing day after day the wise praise him who is of flawless character, wise, and endowed with knowledge and virtue.

230. Who is worthy to blame him who is like a refined gold coin? Even gods praise him, he is praised by Brahma too.

231. කායප්පකෝපං රක්ඛෙය්‍ය,
කායේන සංවුතෝ සියා,
කායදුච්චරිතං හිත්වා
කායේන සුචරිතං චරේ.

232. වචීපකෝපං රක්ඛෙය්‍ය,
වාචාය සංවුතෝ සියා,
වචීදුච්චරිතං හිත්වා
වාචාය සුචරිතං චරේ.

233. මනෝපකෝපං රක්ඛෙය්‍ය,
මනසා සංවුතෝ සියා.
මනෝදුච්චරිතං හිත්වා
මනසා සුචරිතං චරේ.

234. කායේන සංවුතා ධීරා,
අථෝ වාචාය සංවුතා,
මනසා සංවුතා ධීරා,
තේ වේ සුපරිසංවුතා.

**කෝධ වග්ගෝ නිට්ඨිතෝ.**

---

231. Kāyappakopaṃ rakkheyya. kāyena saṃvuto siyā,
Kāyaduccaritaṃ hitvā kāyena sucaritaṃ care.

232. Vacīpakopaṃ rakkheyya, vācāya saṃvuto siyā,
Vacīduccaritaṃ hitvā vācāya sucaritaṃ care.

233. Manopakopaṃ rakkheyya, manasā saṃvuto siyā,
Manoduccaritaṃ hitvā manasā sucaritaṃ care

234. Kāyena saṃvutā dhirā, atho vācāya saṃvutā,
Manasā saṃvutā dhīrā, te ve suparisaṃvutā

---

231. කාය කිපීම වළක්වා (රැක) ගත යුතු ය. කයින් සංවර විය යුතුය. කයින් සිදු වන දුසිරිත් හැර කයින් සුචරිතයෙහි හැසිරිය යුතු ය.

232. වචන කිපීම වළක්වා (රැක) ගත යුතු ය. වචනයෙන් සංවර විය යුතු ය. වචනයෙන් සිදු වන දුසිරිත් හැර වචනයෙන් සුචරිතයෙහි හැසිරිය යුතු ය.

233. සිත කිපීම වළක්වා (රැක) ගත යුතු ය; සිතින් සංවර විය යුතු ය. සිතින් සිදු වන දුසිරිත් හැර සිතින් සුචරිතයෙහි හැසිරිය යුතු ය.

234. පණ්ඩිතයෝ කයින් සංවර වෙත්; වචනයෙන් සංවර වෙත්; සිතින් සංවර වෙත්. එසේ වූවෝ ඒකාන්තයෙන් මනා ව සංවර වූවෝ වෙත්.

ක්‍රෝධ වර්‍ගය නිමි.

---

231. Be watchful of bodily irritation, be restrained in body; having given up the evil ways of the body, be of good bodily conduct.

232. Be watchful of speech-irritation, be restrained in speech; having given up evil ways of the speech be of good conduct in speech.

233. Be watchfull of mind-irritation, be restrained in mind: having given up the evil ways of mind, be of good conduct in mind.

234. The wise who control their body, who control their speech, who control their mind are indeed well controlled.

## මල වග්ගෝ අට්ඨාරසමෝ.

235. පණ්ඩුපලාසෝව දානිසි,
යමපුරිසාපි ච තං උපට්ඨිතා,
උය්‍යෝගමුඛේ ච තිට්ඨසි,
පාථෙය්‍යම්පි ච තේ න විජ්ජති.

236. සෝ කරෝහි දීපමත්තනෝ,
ඛිප්පං වායම, පණ්ඩිතෝ භව,
නිද්ධන්තමලෝ අනංගණෝ
දිබ්බං අරියභූමිමෙහිසි.

## *XVIII. MALAVAGGO AṬṬHĀRASAMO*

235. Paṇḍupalāso va' dāni' si, yamapurisā 'pi ca taṃ upatthitā,
Uyyogamukhe ca titthasi, pātheyyam pi ca te na vijjati.

236. So karohi dīpam attano, khippaṃ vāyama, paṇḍito bhava,
Niddhantamalo anangaṇo dibbaṃ ariyabhūmim ehisi.

## 18. මල වර්ගය

235. ඔබ දැන් ඉදී පඬුවන් ව ගිය කොළයක් බඳු ය. යම දූතයෝත් දැන් ඔබ වෙතට අවුත් ය. ඔබ ඉන්නේ පිරිහීම් දොරටුවේ ය. ඔබට කුසල් නමැති මාර්ගෝපකරණ ද නැත.

236. ඔබ දැන් ආත්මයට එළියක් දිය යුතු ය, හෙවත් පිහිටක් ඇති කර ගත යුතු ය. වහා වෑයම් කරව. තමාට වුවමනා පිහිට සාදා ගැනීමට තරම් සමත් වව. කෙලෙස් මල හැර ගෙන නිකෙලෙස් වූ දිව්‍ය ආර්ය බිමට පැමිණෙව.

## XVIII. IMPURITIES.

235. You are now like a withered leaf, the massengers of death have come near you. You stand at the gate of death, you have no provision for your journey.

236. Make an island (refuge) for yourself, strive hard and be wise. Rid of stain, and passionless, you will reach the celestial plane of the Nobles.

237. උපනීතවයෝ ච දානිසි,
සම්පයාතෝසි යමස්ස සන්තිකේ,
වාසෝපි ච තේ නත්ථි අන්තරා,
පාථෙය්‍යම්පි ච තේ න විජ්ජති.

238. සෝ කරෝහි දීපමත්තනෝ,
ඛිප්පං වායම, පණ්ඩිතෝ භව,
නිද්ධන්තමලෝ අනංගණෝ
න පුන ජාතිජරං උපේහිසි.

237. Upanītavayo ca' dāni' si, sampayāto' si Yamassa santike,
Vāso 'pi ca te n' atthi antarā, pātheyyam pi ca te na vijjati.

238. So karohi dīpam attano, khippaṃ vāyama, paṇḍto bhava,
Niddhantamalo anaṅgaṇo na puna jāti-jaraṃ upehisi

237. ඔබ දැන් ඉක්මුණු වයස ඇත්තෙහි. යමයා ළඟට පැමිණියෙහි. ඔබට අතරතුර නවතින්ට තැනකුත් නැත. ඔබට මාර්ගෝපකරණ ද නැත.

238. ඔබ දැන් ආත්මයට එළියක් දිය යුතු ය, හෙවත් පිහිටක් ඇති කර ගත යුතු ය. වහා වෑයම් කරව. තමාට වුවමනා පිහිට සාදා ගැනීමට තරම් සමත් වව. කෙලෙස් මල හැර ගෙන නිකෙලෙස් ව නැවත ජාති ජරා දුකට නො පැමිණීමට උත්සාහ කරව.

237. Your life has come to an end now ; you are in the presence of Yama (death). There is no resting place for you on the way. You have no provision for your journey.

238. Make an island (refuge) for yourself, strive hard and be wise. Rid of stain, and passionless, you will not come again to birth and decay.

239\. අනුපුබ්බෙන මේධාවී
ථෝකථෝකං ඛණේ ඛණේ.
කම්මාරෝ රජතස්සේව,
නිද්ධමේ මලමත්තනෝ.

240\. අයසාව මලං සමුට්ඨිතං
තදුට්ඨාය තමේව ඛාදති,
ඒවං අතිධෝනචාරිණං
සකකම්මානි නයන්ති දුග්ගතිං.

241\. අසජ්ඣායමලා මන්තා,
අනුට්ඨානමලා ඝරා,
මලං වණ්ණස්ස කෝසජ්ජං,
පමාදෝ රක්ඛතෝ මලං.

239\. Anupubbena medhāvī thokathokaṃ khaṇe khaṇe,
Kammāro rajatass' eva, niddhame malam attano.

240\. Ayasā va malaṃ samutthitaṃ tadutthāya tam eva khādati,
Evaṃ atidhonacārinaṃ sakakammāni nayanati duggatim.

241\. Asajjhāyamalā mantā, anutthānamalā gharā,
Malaṃ vaṇṇassa kosajjaṃ, pamādo rakkhato malam.

239. පණ්ඩිතයා රන් කරුවං රිදියෙහි මල හරින්
නාක් මෙන්, මොහොතක් පාසා ටිකින් ටික පිළිවෙළින්
තමාගේ කෙලෙස් මල ඉවත් කර ගනී.

240. යකඩින් නැඟුණු මලය එයින් නැගී එය ම කා
දමයි. එසේ ම නුවණින් තොර ව වසන භික්‍ෂුවගේ
අකුශල කර්‍මයෝ ඔහු දුගතියට යවත්.

241. මන්ත්‍රවලට නො හැදෑරීම මලයකි, ගෙවත්
බිලුවකි; ගෙවලට නැගී සිටි වීර්‍යය නැතිකම මලයකි;
ශරීර වර්‍ණයට කුසීතකම මලයකි; යමක් රකින්නහුට
පමා වීම මලයකි.

239. As a smith removes the dross of silver, even so a
wise man should remove his impurities by degrees, little by
little, and from time to time.

240. The rust arising from iron eats itself away
though born from it. Even so evil deeds of the transgressor
lead him to the evil state.

241. Non-resitation is the rust of scriptures; non-exertion is the rust of homes; sloth is the taint of beauty;
negligence is the taint of a watcher.

242. මලිත්ථියා දුච්චරිතං,
මච්ඡෙරං දදතෝ මලං,
මලා වේ පාපකා ධම්මා
අස්මිං ලෝකේ පරම්හි ච.

243. තතෝ මලා මලතරං
අවිජ්ජා පරමං මලං,
ඒතං මලං පහත්වාන
නිම්මලා හෝථ භික්ඛවෝ.

244. සුජීවං අහිරිකේන,
කාකසූරේන, ධංසිනා,
පක්ඛන්දිනා, පගබ්භේන,
සංකිලිට්ඨේන ජීවිතං.

242. Mal'itthiyā duccaritaṃ, maccheraṃ dadato malaṃ,
Malā ve pāpakā dhammā asmiṃ loke paramhi ca.

243. Tato malā malataraṃ avijjā paramaṃ malaṃ,
Etaṃ malaṃ pahatvāna nimmalā hotha bhikkhavo.

244. Sujīvaṃ ahirīkena, kākasūrena, dhaṃsinā,
Pakkhandinā, pagabbhena, sankilitthena, jīvitaṃ.

242. ස්ත්‍රියට නරක චරිතය මලයකි; දෙන්නාට මසුරුකම මලයකි; මෙ ලොව පරලොව දෙක්හි ම අකුසල ධර්මයෝ මලයෝ ය.

243. ඒ හැම මලයට ම වඩා විශාල මලය අවිද්‍යාව ය. මහණෙනි, ඒ මලය දුරලා නිර්මල වව්.

244. කවුඩකු මෙන් ගසා කෑමෙහි ශූර වූ, බුහුටි වූ, ලජ්ජා නැති, අනුන්ගේ ගුණ මකන, ගෙන් ගෙට දුවන, කිලිටි දිවි පැවැත්මක් ඇති නිලජ්ජුවට ජීවත් වීම ඉතා ලේසි ය.

242. Bad conduct is the taint of a woman; stinginess is the taint of a giver; all evil things are taints in this world and in the next.

243. A greater taint than these is ignorance, the greatest of all taints. Abandoning this taint be taintless, O Monks!

244. Life is easy for the shameless one who is as impudent as a crow, back-biting, forward, arrogant, and corrupt.

245. හිරීමතා ච දුජ්ජීවං
නිච්චං සුචිගවේසිනා,
අලීනේනප්පගබ්භේන
සුද්ධාජීවේන පස්සතා.

246. යෝ පාණමතිපාතේති,
මුසාවාදං ච භාසති,
ලෝකේ අදින්නං ආදියති,
පරදාරං ච ගච්ඡති,—

247. සුරාමේරය පානං ච
යෝ නරෝ අනුයුඤ්ජති,
ඉධෙවමෙසෝ ලෝකස්මිං
මූලං ඛණති අත්තනෝ.

245. Hirīmatā ca dujjīvaṃ niccaṃ sucigavesinā,
Alīnen' appagabbhena suddhājīvena passatā.

246. Yo pāṇam atipāteti, musāvādañ ca bhāsati,
Loke addinnaṃ ādiyati, paradārañ ca gacchati,–

247. Surāmerayapānañ ca yo naro anuyuñjati ;
Idh' evameso lokasmiṃ mūlaṃ khanati attano.

245. නිතර පිරිසිදු ක්‍රියා කිරීමට සොයන බලන, ලජ්ජා ඇති, බුහුටි නො වූ, වැරදි දිවි පැවැත්මෙහි නො ඇලුණු, පිරිසිදු දිවි පැවැත්ම ගැන ම වෙහෙසෙන සිසුවට ජීවත් වීම දුෂ්කර ය.

246. යමෙක් සතුන් මරයි ද, සොරකම් කරයි ද, පරදූරාවන් කරා යයි ද, බොරු කියයි ද,—

247. (යමෙක්) මත් පැන් බොයි ද ඔහු මෙ ලොව දී ම තමා ගේ මුල හාරා ගනී, හෙවත් වළ කපා ගනී.

245. Life is hard for a modest one who always seeks purity, who is disinterested, humble, clean in life, and intelligent.

246. He who in this world destroys life, speaks untruth, takes what is not given, goes to another's wife,—

247. And he who is addicted to intoxicating drinks, such a one digs up his own root in this very world.

248. ඒවං භෝ පුරිස! ජානාහි:
පාපධම්මා අසඤ්ඤතා,
මා තං ලෝභෝ අධම්මෝ ච,
චිරං දුක්ඛාය රන්ධයුං.

249. දදාති වේ යථා සද්ධං
යථා පසාදනං ජනෝ,
තත්ථ වේ මංකු යෝ හෝති
පරේසං පාන භෝජනේ,
න සෝ දිවා වා රත්තිං වා
සමාධිං අධිගච්ඡති.

250. යස්ස චේතං සමුච්ඡින්නං
මූලඝච්චං සමූහතං
ස වේ දිවා වා රත්තිං වා
සමාධිං අධිගච්ඡති.

248. Evaṃ bho purisa ! jānāhi: pāpadhammā asāṃyatā,
Mā taṃ lobho adhammo ca, ciraṃ dukkhāya randhayuṃ.

249. Dadāti ve yathā saddhaṃ yathā pasādanaṃ jano,
Tattha ce manku yo hoti paresaṃ pānabhojane,
Na so divā vā rattiṃ vā samādhiṃ adhigacchati.

250. Yassa c' etaṃ samucchinnaṃ mūlaghaccaṃ samūhataṃ,
Sa ve divā vā rattiṃ vā samādhiṃ adhigacchati.

248. එම්බා පුරුෂය, මෙසේ දැන ගනුව; පාප ස්වභාව ඇත්තෝ සංයමය නැත්තෝ ය. ලෝභයත්, ද්වේෂයත් ඔබ බොහෝ කලක් දුකට නො පමුණුවත්වා!

249. ජනයා ශ්‍රද්ධාවේ හා පැහැදීමේ පමණට දන් දෙත්. යමෙක් අනුන්ගේ ඒ කෑම් පීම්හි දොම්නස් උපදවයි නම්, ඔහු දවල් වත්, රෑ වත් සිතේ එකඟකම නො ලබයි.

250. යමකු විසින් අනික් කෙලෙස් මුලුන් සමඟ මේ මකු බව මුලින් ම උපුටා නසන ලද ද, ඔහු දවල් හෝ, රෑ හෝ සිතේ එකඟකම ලබයි.

248. Know thus, O man, evil things are uncontrollable. Let not greed and wickedness drag you to misery for a long time.

249. People give according to their faith or pleasure. He who, frets about others' food and drink does not attain concentration either by day or by night.

250. He in whom this feeling is destroyed, completely uprooted, attains concentration either by day or by night.

251. නත්ථි රාගසමෝ අග්ගි.
නත්ථි දෝසසමෝ ගහෝ,
නත්ථි මෝහසමං ජාලං,
නත්ථි තණ්හාසමා නදී.

252. සුදස්සං වජ්ජං අඤ්ඤේසං,
අත්තනෝ පන දුද්දසං,
පරේසං හි සෝ වජ්ජානි
ඔපුණාති යථා භුසං,
අත්තනෝ පන ඡාදේති
කලිංව කිතවා සඨෝ.

253. පරවජ්ජානුපස්සිස්ස
නිච්චං උජ්ඣානසඤ්ඤිනෝ.
ආසවා තස්ස වඩ්ඪන්ති,
ආරා සෝ ආසවක්ඛයා.

251. N'atthi rāgasamo aggi, n'atthi dosasamo gaho,
N'atthi mohasamaṃ jālaṃ, n'atthi taṇhāsamā nadī.

252. Sudassaṃ vajjaṃ aññesaṃ, attano pana duddasaṃ,
Paresaṃ hi so vajjāni opuṇāti yathā bhusaṃ,
Attano pana chādeti kaliṃ ' va kitavā satho.

253. Paravajjānupassissa niccaṃ ujjhānasaññino,
Āsavā tassa vaḍḍhanti, ārā so āsavakkhayā.

251. රාගය සමාන ගින්නක් නැත; ද්වේෂය සමාන ගැන්මක් නැත; මෝහය සමාන දැලක් නැත; තෘෂ්ණාව සමාන නදියක් නැත.

252. අනුන්ගේ වරද ලේසියෙන් දක්ක හැකි ය. තමාගේ වරද දැකීම එ තරම් ලේසි නැත. අනුන්ගේ වැරදි සොයන්නා ඒවා දහසියා මෙන් පොළා පෙන්වයි. ඔහු කොළ අතුවලින් සිරුර මුවා කර ගන්නා ලිහිණි වැද්දකු මෙන් තමාගේ වරද වසා ලයි.

253. නිතර අනුන්ගේ දෙස් සොයන්නා වූ, අනුන් හෙළා තළා කථා කරන්නා වූ පුද්ගලයාගේ ආශ්‍රවයෝ වැඩෙත්. ඔහු රහත් ඵලයෙන් ඉතා ඈත් ය.

251. There is no fire like lust, no capturer like hate, no net like delusion, no river like craving.

252. Easy to see the fault of others; one's own is difficult to see. One winnows others' faults like chaff; but one's own one hides, as a crafty fowler covers himself.

253. He who is observant of others' faults, and is always irritable, his own defilements increase. He is far from the destruction of defilements.

254. ආකාසෙ පදං නත්ථි,
සමණො නත්ථි බාහිරෙ,
පපඤ්චාභිරතා පජා,
නිප්පපඤ්චා තථාගතා.

255. ආකාසෙ පදං නත්ථි,
සමණො නත්ථි බාහිරෙ,
සංඛාරා සස්සතා නත්ථි,
නත්ථි බුද්ධානමිඤ්ජිතං.

**මල වග්ගො නිට්ඨිතො**

---

254. Ākāse padaṃ n' atthi, samaṇo n'atthi bāhire,
Papañcābhiratā pajā, nippapañcā Tathāgatā.

255. Ākāse padaṃ n'atthi, samaṇo n'atthi bāhire,
Sankhārā sassatā n'atthi n'atthi Buddhānaṃ iñjitaṃ.

254. අහසෙහි පා සටහන් නැත. බුදු සසුනෙන් පිටත භික්ෂුවක් නැත. සත්ත්වයෝ තණ්හා, මාන සංඛ්‍යාත ප්‍රපංචයෙහි ඇලුණෝ ය. බුදුවරු ප්‍රපංච නැත්තෝ ය.

255. අහසෙහි පා සටහන් නැත. බුදු සස්නෙන් පිටත භික්ෂුවක් නැත. ශාශ්වත - නිත්‍ය වූ - සංස්කාරයෝ නැත. බුදුවරුන්ට තණ්හා, මාන ආදි ඉංජිත නැත.

මල වර්ගය නිමි.

---

254. There is no track in the sky. Outside there is no recluse. Men delight in worldliness. The Buddhas are free from worldliness.

255. There is no track in the sky. Outside there is no recluse. No conditioned things are eternal. There is no instability in the Buddhas.

---

## ධම්මට්ඨ වග්ගෝ ඒකූනවීසතිමෝ.

256. න තේන හෝති ධම්මට්ඨෝ
යේනත්ථං සහසා නයේ,
යෝ ච අත්ථං අනත්ථං ච
උභෝ නිච්ඡෙය්‍ය පණ්ඩිතෝ.

257. අසාහසේන ධම්මේන
සමේන නයතී පරේ,
ධම්මස්ස ගුත්තෝ මේධාවී
ධම්මට්ඨෝති පවුච්චති.

258. න තේන පණ්ඩිතෝ හෝති
යාවතා බහු භාසති,
ඛේමී අවේරී අභයෝ
පණ්ඩිතෝති පවුච්චති.

## *XIX. DHAMMAṬṬHAVAGGO EKŪNAVĪSATIMO*

256. Na tena hoti dhammattho yen'attham sahasā naye,
Yo ca attham anatthañ ca ubho niccheyya paṇḍito.

257. Asāhasena dhammena samena nayatī pare,
Dhammassa gutto medhāvi dhammattho'ti pavuccati.

258. Na tena paṇḍito hoti yāvatā bahu bhāsati,
Khemī, averī, abhayo paṇḍito'ti pavuccati.

## 19. ධම්මට්ඨ වග්ගය.

256. යමකු බොරුවෙන් - හිමියන් අහිමියන් කරමින් - නඩුවක් විසඳූ පමණින් ධාර්මික විනිශ්චය කාරයෙක් නො වේ. පණ්ඩිතයා හෙවත් බුද්ධිමත් විනිශ්චය කාරයා කාරණ. අකාරණ විමසා, අගතියට නො ගොස් තීරණය දෙන්නෙකි.

257. යමෙක් නිබොරුවෙන් හෙවත් අගතියට නො ගොස්, නීතිය අනුව, දැහැමෙන් සෙමෙන් අනුන් ජය පරාජයට පමුණුවයි ද ඒ බුද්ධිමතා විනිශ්චය ධර්මයෙන් රැකුණු ධාර්මිකයෙකැ යි කියනු ලැබේ.

258. බොහෝ සේ කථා කළ පමණින් යමෙක් පණ්ඩිතයෙක් නො වේ. උවදුරු හා වෛරීන් ද නැති, නිර්භය වූ පුද්ගලයා පමණක් පණ්ඩිතයෙකැ යි කියනු ලැබේ.

## XIX. THE RIGHTEOUS

256. One is not thereby righteous because one arbitrates hastily. He who is wise investigates both right and wrong.

257. The wise man who guides others with due deliberation, with righteous and just judgment is called guardian of the law, wise and righteous.

258. One is not wise simply because one speaks much. He who is tranquil, free from hatred, free from fear, is called wise.

259. න තාවතා ධම්මධරෝ
යාවතා බහු භාසති,
යෝ ච අප්පම්පි සුත්වාන
ධම්මං කායේන පස්සති,
ස වේ ධම්මධරෝ හෝති
යෝ ධම්මං නප්පමජ්ජති.

260. න තේන ථේරෝ හෝති
යේනස්ස පලිතං සිරෝ,
පරිපක්කෝ වයෝ තස්ස
මෝඝජිණ්ණෝති වුච්චති.

261. යම්හි සච්චං ච, ධම්මෝ ච,
අහිංසා, සංයමෝ, දමෝ,
ස වේ වන්තමලෝ ධීරෝ
ථේරෝ ඉති පවුච්චති.

259. Na tāvatā dhammadharo yāvatā bahu bhāsati,
Yo ca appam pi sutvāna, dhammaṃ kāyena passati,
Sa ve dhammadharo hoti yo dhammaṃ nappamajjati.

260. Na tena thero hoti yen' assa palitaṃ siro,
Paripakko vayo tassa moghajinno ' ti vuccati.

261. Yamhi saccañ ca, dhammō ca, ahiṃsā, saṃyamo, damo,
Sa ve vantamalo dhīro thero iti pavuccati.

259. බොහෝ සේ කථා කළ පමණිනුත් යමෙක් ධර්ම ධරයෙක් නො වේ. යමෙක් ටිකක් වුවත් අසා තමාගේ කය වෙහෙසවා චතුරාර්‍ය සත්‍යය වටහා ගනී ද, ධර්මය ගැන මනා සැලකිල්ල දක්වන එබඳු පුද්ගලයා ම ඒකාන්තයෙන් ධර්ම ධරයෙක් වේ.

260. හිස කෙස් පැසුණු පමණිනුත් යමෙක් ස්ථවිර නො වේ. වයසින් පමණක් මේරූ ඔහුට හිස් මහල්ලා යි කියනු ලැබේ.

261. යමකු තුළ සත්‍යයත්, ධර්මයත්, අහිංසාවත්, තැන්පත්කමත්, ඉන්ද්‍රිය දමනයත් ඇද් ද, පහ කරන ලද කෙලෙස් මල ඇති එබඳු බුද්ධිමතා ස්ථවිරයෙකැ යි කියනු ලැබේ.

259. One is not versed in the Dhamma merely because one speaks much He who hears little and sees the Truth mentally, and who does not neglect the Dhamma is, indeed, versed in the Dhamma.

260. One is not an Elder merely because one's head is grey. His age is ripe, and he is called 'old-in-vain.'

261. In whom there are truth, virtue, non-violence, restraint and control, that wise man who is free from taint is called an Elder.

262. න වාක්කරණමත්තේන
වණ්ණපොක්ඛරතාය වා,
සාධුරූපො නරො හොති
ඉස්සුකී මච්ඡරී සඨො.

263. යස්ස චේතං සමුච්ඡින්නං
මූලඝච්චං සමූහතං,
ස වන්තදෝසො මේධාවී
සාධුරූපොති වුච්චති.

264. න මුණ්ඩකේන සමණො,
අබ්බතො අලිකම්භණං,
ඉච්ඡාලොභසමාපන්නො
සමණො කිං භවිස්සති?

265. යො ච සමේති පාපානි
අණුං ථූලානි සබ්බසො,
සමිතත්තා හි පාපානං
සමණොති පවුච්චති.

262. Na vākkaraṇamattena vaṇṇapokkharatāya vā,
Sādhurūpo naro hoti issukī maccharī satho.

263. Yassa c' etaṃ samucchinnaṃ mūlaghaccaṃ samū hataṃ
Sa vantadoso medhāvī sādhurūpo 'ti vuccati.

264. Na muṇḍakena samaṇo, abbato alikaṃ bhaṇaṃ,
Icchālobhasamāpanno samaṇo kiṃ bhavissati ?

265. Yo ca sameti pāpāni aṇuṃ thūlāni sabbaso,
Samitattā hi pāpānaṃ samaṇo'ti pavuccati.

262. ඊෂ්‍යා කරන, මසුරුකම් කරන, කපටියා ලක්ෂණ වචන කථා කළ පමණින් වත්, හැඩ වැඩ ඇති පමණින් වත් යහපත් සවභාව ඇති මිනිසෙක් නො වේ.

263. යමකු විසින් ඊෂ්‍යා ආදී අකුසල් ගති මුලින් ම උදුරා දමන ලද ද, පහ කර ගත් කෙලෙස් මල ඇති ඔහු යහපත් සවභාව ඇත්තෙකැ යි කියනු ලැබේ.

264. ශීල වෘත නැති, බොරු කියන පුද්ගලයා හිස කෙස් කැපූ පමණින් මහණෙක් නො වේ. ඉච්ඡාවෙන් හා ලෝභයෙන් යුත් තැනැත්තා කෙසේ නම් මහණෙක් වන්නේ ද?

265. යමෙක් ලොකු කුඩා පව් මුළුමනින් ම සංසිඳුවා ගනී ද, ඔහු පව් සංසිඳවූ බැවින් මහණෙකැ යි කියනු ලැබේ.

262. Not by mere eloquence, nor by beauty of complexion, does a man who is jealous, greedy and wicked become of good disposition.

263. But in whom these (evils) are wholly cut off, uprooted and extinct, that wise man who is free from hatred is said to be of good disposition.

264. Not by shaven head does one who is undutiful and untruthful become a monk. How can one who is full of desire and greed be a monk ?

265. He who wholly subdues evils small and large, is called a monk, because he has quieted all evil.

266. න තේන භික්ඛු හෝති
යාවතා භික්ඛතේ පරේ,
විස්සං ධම්මං සමාදාය
භික්ඛු හෝති න තාවතා.

267. යෝධ පුඤ්ඤං ච පාපං ච
බාහෙත්වා බ්‍රහ්මචරියවා,
සංඛාය ලෝකේ චරති,
ස වේ භික්ඛූති වුච්චති.

268. න මෝනේන මුනී හෝති
මූළ්හරූපෝ අවිද්දසු,
යෝ ච තුලංව පග්ගය්හ
වරමාදාය පණ්ඩිතෝ,—

269. පාපානි පරිවජ්ජේති
ස මුනී, තේන සෝ මුනී,
යෝ මුනාති උභෝ ලෝකේ,
මුනී තේන පවුච්චති.

266. Na tena bhikkhu hoti yāvatā bhikkhate pare,
Vissaṃ dhammaṃ samādāya bhikkhu hoti na tāvatā.

267. Yo'dha puññañ ca pāpañ ca bāhetvā brahmacariyavā,
Sankhāya loke carati, sa ve bhikkhū'ti vuccati.

268. Na monena munī hoti mūḷharūpo aviddasu,
Yo ca tulaṃ'va paggayha varam ādāya paṇḍito,—

269. Pāpāni parivajjeti sa munī, tena so munī,
Yo muṇāti ubho loke, munī tena pavuccati.

266. විෂම වූ පාප ධර්ම සමාදන් වූ තැනැත්තා අනුන්ගෙන් පිඬු සිඟා ගත් තරමින් ම භික්ෂුවක් නො වේ.

267. යමෙක් මේ ශාසනයෙහි නියමිත පරිදි පින් පව් දෙක ම දුරු කොට, බඹසරින් යුක්ත ව, සියලු දේ නුවණින් සලකා - විමසා - හැසිරෙයි ද ඔහු ම නිශ්චය වශයෙන් භික්ෂුවකැ යි කියනු ලැබේ.

268. මෝඩ ස්වභාව ඇති අඥානයා කථා නො කර සිටි පමණින් මුනිවරයෙක් නො වේ. තරාදියක් අතට ගත්තකු මෙන් ලෝකයේ ඇති හොඳ - කුසල් - කිරා බලා තෝරා ගත හැකි පණ්ඩිතයා ම මුනිවරයෙක් වේ.

269. යමෙක් පව් දුරු කරයි ද ඔහු එයින් ම මුනිවරයෙක් වේ. යමෙක් ලෝකයෙහි අධ්‍යාත්මික, බාහිර සංස්කාරයන් වෙන් වශයෙන් බෙදා දැන ගනී ද ඔහුට ඒ නිසා මුනිවරයෙකැ යි කියනු ලැබේ.

266. One is not a Bhikkhu simply because he begs from others. By adopting offensive manners one does not become a Bhikkhu.

267. He who is above merit and demerit and chaste, who lives with understanding in the world, he, indeed, is called a Bhikkhu.

268. By observing silence one does not become a sage, if he be foolish and ignorant ; but the wise man, who, as if holding a pair of scales, takes the best,—

269. And avoids the evils, he is the sage. For that reason he is a sage. He who understands both worlds is, therefore, called a sage on that account.

270. න තේන අරියෝ හෝති
යේන පාණානි හිංසති,
අහිංසා සබ්බපාණානං
අරියෝති පවුච්චති.

271. න සීලබ්බතමත්තේන,
බාහුසච්චේන වා පුන,
අථ වා සමාධිලාභේන,
විවිච්චසයනේන වා,—

272. ඵුසාමි නෙක්ඛම්මසුඛං
අපුථුජ්ජනසේවිතං,
භික්ඛු විස්සාසමාපාදි
අප්පත්තෝ ආසවක්ඛයං.

**ධම්මට්ඨවග්ගෝ නිට්ඨිතෝ.**

---

270. Na tena ariyo hoti yena pāṇāni hiṃsati,
Ahiṃsā sabbapāṇānaṃ ariyo'ti pavuccati.

271. Na sīlabbatamattena, bāhusaccena vā puna,
Atha vā samādhilābhena, vivicca sayanena vā,—

272. Phusāmi nekkhammasukhaṃ aputhujjanasevitaṃ.
Bhikkhu vissāsamāpādi appatto āsavakkhayaṃ.

---

270. ප්‍රාණීන්ට හිංසා කරන්නා 'ආර්ය' යි නමක් තිබුණු පමණින් ආර්යයෙක් නො වේ. සියලු ප්‍රාණීන්ට හිංසා නො කරන්නහුට පමණක් ආර්යයෙකැ යි කියනු ලැබේ.

271. ශීල ව්‍රත මාත්‍රයකින් හෝ, බහුශ්‍රැතකමකින් හෝ, සමාධියක් ලැබීමෙන් හෝ, විවේක සේනාසනයක විසීමෙන් හෝ,-

272. ආර්යයන් විසින් ලබනා ලද නෙක්ඛම්ම (පැවිදි) සැපය ලැබීමෙන් හෝ, ආශ්‍රවයන් කෙළවර කර නො ගත් භික්ෂුවක්, තමා දුක් කෙළවර කර ගත්තේ ය යි වැරදි විශ්වාසයක් ඇති කර නො ගත යුතු ය.

ධර්මස්ථ වර්ගය නිමි.

---

270. One is not noble in that he harms living beings. He is called noble because he does not injure living beings.

271. By morality and duty, again by much learning, moreover, by attainment of meditation, by solitary lodging,—

272. (By thinking) 'I enjoy the bliss of renunciation unknown to the worlding,' O Monk, do not be confident without reaching the extinction of passions.

---

## මග්ග වග්ගෝ වීසතිමෝ.

273. මග්ගානට්ඨංගිකෝ සෙට්ඨෝ,
සච්චානං චතුරෝ පදා,
විරාගෝ සෙට්ඨෝ ධම්මානං,
දිපදානං ච චක්ඛුමා.

274. ඒසෝ'ව මග්ගෝ, නත්ථඤ්ඤෝ
දස්සනස්ස විසුද්ධියා,
ඒතම්හි තුම්හේ පටිපජ්ජථ,
මාරස්සේතං පමෝහනං.

275. ඒතම්හි තුම්හේ පටිපන්නා
දුක්ඛස්සන්තං කරිස්සථ,
අක්ඛාතෝ වේ මයා මග්ගෝ
අඤ්ඤාය සල්ලසන්ථනං.

## *XX. MAGGAVAGGO VĪSATIMO*

273. Maggān' atthaṅgiko settho, saccānaṃ caturo padā,
Virāgo settho dhammānaṃ, dipadānañ ca cakkhumā.

274. Eso'va maggo, n'atth' añño dassanassa visuddhiyā,
Etamhi tumhe patipajjatha, mārass' etaṃ pamohanaṃ.

275. Etamhi tumhe patipannā dukkhass' antaṃ karissatha,
Akkhāto ve mayā maggo aññāya sallasanthanaṃ.

## 20. මාර්ග වර්ගය.

273. සියලු මාර්ග අතුරෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගය ශ්‍රේෂ්ඨ ය. සියලු සත්‍ය අතුරෙන් දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග යන චතුරාර්ය සත්‍යය ශ්‍රේෂ්ඨ ය. සියලු ධර්ම අතුරෙන් නිවන ශ්‍රේෂ්ඨ ය. ද්විපාද සතුන් අතුරෙන් බුදුනු ශ්‍රේෂ්ඨ ය.

274. නුවණ පිරිසිදු කර ගැනීමට මේ මිස අනික් මඟක් නැත. ඔබ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිපදිව්. මෙය මාරයා මුළා කරන්නකි.

275. ඔබ මේ ආර්ය මාර්ගයට පිළිපන්නොත් දුක් කෙළවර කර ගත හැකි ය. මා විසින් රාගාදි මුල් උදුරා ලන ක්‍රමය දැන මේ මාර්ගය නිශ්චය වශයෙන් ප්‍රකාශ කරන ලදි.

## XX. THE PATH

273. Of paths the Eightfold is the best. Of truths the four sayings are the best. Of virtues unattachment is the best. Of bypeds the Seeing One is the best.

274. This is the only path; there is none other to purify the insight. You follow this. This will be to confuse Māra (death).

275. Walking on this path you will end suffering. Having learnt to remove the thorns surely this path was delivered by me.

276. තුම්හේහි කිච්චං ආතප්පං,
අක්ඛාතාරෝ තථාගතා,
පටිපන්නා පමොක්ඛන්ති
ඣායිනෝ මාරබන්ධනා.

277. 'සබ්බේ සංඛාරා අනිච්චා'ති
යදා පඤ්ඤාය පස්සති,
අථ නිබ්බින්දති දුක්ඛේ
ඒස මග්ගෝ විසුද්ධියා.

278. 'සබ්බේ සංඛාරා දුක්ඛා'ති
යදා පඤ්ඤාය පස්සති,
අථ නිබ්බින්දති දුක්ඛේ
ඒස මග්ගෝ විසුද්ධියා.

276. Tumhehi kiccaṃ ātappaṃ, akkhātāro Tathāgatā,
Patipannā pamokkhanti jhāyino Mārabandhanā.

277. 'Sabbe saṅkhārā aniccā' ti yadā paññāya passati,
Atha nibbindati dukkhe esa maggo visuddhiyā.

278. 'Sabbe sankhārā dukkhā, ti yadā paññāya passati,
Atha nibbindati dukkhe esa maggo visuddhiyā.

276. ඔබ විසින් කෙලෙස් තවන වීර්යය කළ යුතු ය. බුදුවරු එයට මඟ කියන්නෝ ය. ඒ මඟට බැස ධ්‍යාන වඩන්නෝ මාර බන්ධනයෙන් මිදෙන්නෝ ය.

277. යමෙක් යම් විටක සියලු සංස්කාර වෙනස් වෙතැ යි නුවණින් දැන ගනී ද, එ විට දුක ගැන කලකිරේ. එය ම පිරිසිදු වීමට - නිවන් ලැබීමට - මඟ ය.

278. යමෙක් යම් විටක සියලු සංස්කාර දුක් ය යි නුවණින් දැන ගනී ද, එ විට දුක ගැන කලකිරේ. එය ම පිරිසිදු වීමට - නිවන් ලැබීමට - මඟ ය.

276. You yourselves must strive. The Buddhas are only teachers. Those meditative ones who enter the path are released from the bondage of Māra (death.)

277. 'All conditioned things are impermanent,' when one realises this with wisdom then he is disgusted of sorrow. This is the path to purity.

278, 'All conditioned things are sorrowful,' when one realises this with wisdom then he is disgusted of sorrow. This is the path to purity.

279. 'සබ්බෙ ධම්මා අනත්තා'ති
යදා පඤ්ඤාය පස්සති,
අථ නිබ්බින්දති දුක්ඛෙ
ඒස මග්ගෝ විසුද්ධියා.

280. උට්ඨානකාලම්හි අනුට්ඨහානෝ,
යුවා බලී ආලසියං උපේතෝ,
සංසන්නසංකප්පමනෝ කුසීතෝ,
පඤ්ඤාය මග්ගං අලසෝ න වින්දති.

281. වාචානුරක්ඛී, මනසා සුසංවුතෝ,
කායේන ච අකුසලං න කයිරා,
ඒතේ තයෝ කම්මපථෙ විසෝධයේ,
ආරාධයේ මග්ගං ඉසිප්පවේදිතං.

279. 'Sabbe dhammā anattā' ti yadā paññāya passati,
Atha nibbindati dukkhe, esa maggo visuddhiyā,

280. Utthānakālamhi anutthahāno,
Yuvā balī ālasiyaṃ upeto,
Saṃsannasaṅkappamano, kusīto,
Paññāya maggaṃ alaso na vindati.

281. Vācānurakkhī, manasā, susaṃvuto,
Kāyena ca akusalaṃ na kayirā,
Ete tayo kammapathe visodhaye,
Ārādhaye maggaṃ isippaveditaṃ.

279. යමෙක් යම් විටක සියලු ධර්ම අනාත්මය (=වෙනස් වන සුලු ය, අස්ථිර ය හෙවත් සියලු ධර්මයන්ගේ ඇති තත්වය මෙසේ ය) යි නුවණින් දැන ගනී ද එ විට දුක ගැන කලකිරේ. එය ම පිරිසිදු වීමට – නිවන් ලැබීමට – මඟ ය.

280. යමෙක් තරුණ වුවත්, බලවත් වුවත්, අලස කමින් යුක්ත නම්, වීර්යයෙන් කටයුතු කළ යුතු වේලෙහි නො නැඟිට සිටී නම්, බොරු විතර්ක නිසා යටපත් වූ යහපත් කල්පනා හා සිත් ඇති ඒ අලසයා නුවණින් දක්ක යුතු වූ මඟ නො දකියි, හෙවත් නො ලබයි.

281. වචනය රැක ගත යුතු ය; සිත තැන්පත් කර ගත යුතු ය; කයින් අකුසල් නො කළ යුතු ය. මේ තුන් කර්ම පථය පිරිසිදු කර ගත් තැනැත්තාට ඍෂීන් විසින් අනුදත් මාර්ගය වූ නිවන් මග ගමන් කළ හැකි ය.

279. 'All things are soulless,' when one realises this with wisdom then he is disgusted of sorrow. This is the path to purity.

280. He who does not strive when he should strive, who, though young and strong, is stothful, who is weak in resolution and thought, that lazy man will not find the way to wisdom.

281. Watchful of speech, well restrained in mind, let one not commit evil with body. He who purifies these three ways of action wins the path realised by the sages.

282. යෝගා වේ ජායතී භූරි,
අයෝගා භූරිසංඛයෝ,
ඒතං ද්වේධාපථං ඤත්වා
භවාය විභවාය ච,
තථත්තානං නිවේසෙය්‍ය
යථා භූරි පවඩ්ඪති.

283. වනං ඡින්දථ, මා රුක්ඛං,
වනතෝ ජායතී භයං,
ඡේත්වා වනං ච වනථං ච,
නිබ්බනා හෝථ භික්ඛවෝ.

284. යාවං හි වනථෝ න ඡිජ්ජති
අනුමත්තෝපි නරස්ස නාරිසු,
පටිබද්ධමනෝව තාව සෝ
වච්ඡෝ ඛීරපකෝව මාතරි.

282 Yogā ve jāyatī bhūri, ayogā bhūri saṅkhayo,
Etaṃ dvedhāpathaṃ ñatvā bhavāya vibhavāya ca,
Tath' attānaṃ niveseyya yathā bhūri pavaḍḍhati.

283. Vanaṃ chindatha, mā rukkhaṃ, vanato jāyātī bhayaṃ
Chetvā vanañ ca vanathañ ca, nibbanā hotha bhikkhavo

284. Yāvaṃ hi vanatho na chijjati anumatto'pi narassa nārisu,

Patibaddhamano'va tāva so vaccho khīrapako 'va mātari.

282. භාවනාවෙන් පුළුල් නුවණ ඇති වේ. භාවනා නො කිරීමෙන් එය වැනසේ. දියුණුවට හා නො දියුණුවට කරුණු වන මේ මාර්ග දෙක ගැන දැන ගෙන, යම් පරිද්දකින් නුවණ පුළුල් වේ ද ඒ පරිද්දෙන් ජීවිතය සකස් කර ගත යුතු ය.

283. ගස නො ව, කෙලෙස් වනය කපව්. කෙලෙස් වනයෙන් භය ඇති වේ. ලොකු කුඩා කෙලෙස් නමැති වනයත්, වනථයත් කපා දමා කෙලෙස් නැත්තන් විය යුතු ය.

284. යම් තාක් කල් පුරුෂයාගේ කෙලෙස් වනථය (=ගතිය) ස්ත්‍රීන් කෙරෙහි සුළු වශයෙන් නමුත් නො සිඳී පවතී ද, ඔහු කිරි වස්සා එළ දෙන කෙරෙහි ඇලෙන්නාක් මෙන්, ස්ත්‍රීන් කෙරෙහි ඇලේ.

282. From meditation arises wisdom; and without meditation wisdom wanes. Knowing this twofold path of progress and decline let one conduct in such a way that his wisdom increases.

283. Cut down the forest (of lust) but not the tree. Fear arises from the forest. Cutting down forest and brushwood (of lust), be 'forestless,' O Bhikkhus!

284. So long as the brushwood (of lust), however small, of a man towards women is not cut down, so long is his mind attached like the sucking calf to its mother.

285. උච්ඡින්ද සිනේහමත්තනෝ,
කුමුදං සාරදිකංව පාණිනා,
සන්තිමග්ගමේව බෲහය
නිබ්බානං සුගතේන දේසිතං.

286. ඉධ වස්සං වසිස්සාමි,
ඉධ හේමන්තගිම්හිසු,
ඉති බාලෝ විචින්තේති,
අන්තරායං න බුජ්ඣති.

287. තං පුත්තපසුසම්මත්තං,
බ්‍යාසත්තමනසං නරං,
සුත්තං ගාමං මහෝඝෝව
මච්චු ආදාය ගච්ඡති.

285. Ucchinda sineham attano, kumudaṃ sāradikaṃva, pāṇinā
Santimaggam eva brūhaya nībbānaṃ sugatena desitaṃ.

286. Idha vassaṃ vasissāmi, idha hemantagimhisu,
Iti bālo vicinteti, antarāyaṃ na bujjhati.

287. Taṃ puttapasusammattaṃ, byāsattamanasaṃ naraṃ,
Suttaṃ gāmaṃ mah'ogho' va maccu ādāya gacchati.

285. ශරත් කාලයෙහි හට ගත් කුමුදක් අතින් කඩා දමන්නාක් මෙන් තමා ගැන ඇති ආශාව සිඳ දමව. නිවනට මඟ වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය ම සිත්හි වඩව. නිවන බුදුන් විසින් දෙසා ඇත.

286. මෝඩයා, 'මෙහි වැසි කාලයෙහි වසන්නෙමි, මෙහි හේමන්ත, ග්‍රීෂ්ම කාලවල වසන්නෙමි' යනුවෙන් කල්පනා කරයි. තමාට වන අන්තරාය ගැන තේරුම් නො ගනී.

287. මහ වතුර නිදි ගත් ගමක් ගෙන යන්නාක් මෙන්, මරුවා, දූ දරුවන් හා ගව මහිෂාදීන් නිසා මත් වූ, ගිජු සිත් ඇති මිනිසා ගෙන යයි.

285. Cut off your affection of self as, with the hand, an autumn lily. Cherish the path of peace. Nibbāna has been expounded by the Buddha.

286. 'Here shall I dwell in the rain, here in winter and summer' thus the fool thinks. He does not realise the danger.

287. As a big flood carries off a sleeping village, death takes off and goes with the doting man whose mind is set on children and herds.

288. න සන්ති පුත්තා තාණාය,
න පිතා නාපි බන්ධවා,
අන්තකේනාධිපන්නස්ස
නත්ථි ඤාතිසු තාණතා.

289. ඒතමත්ථවසං ඤත්වා
පණ්ඩිතෝ සීලසංවුතෝ,
නිබ්බානගමනං මග්ගං
ඛිප්පමේව විසෝධයේ.

**මග්ග වග්ගෝ නිට්ඨිතෝ.**

---

288. Na santi puttā tāṇāya, na pitā n'api bandhavā,
Antakenādhipannassa n'atthi ñātisu tāṇatā.

289. Etaṃ atthavasaṃ ñatvā paṇḍito sīlasaṃvuto,
Nibbānagamanaṃ maggaṃ khīppam eva visodhaye.

---

288. මරුවාගෙන් පහර ලද්දහුගේ රක්ෂාවරණය පිණිස, එන දරුවෝත් නැත; මවු පියෝත් නැත; නෑයෝත් නැත. නෑයන්ට ඔහු රැක ගත නොහැකි ය.

289. මේ අයුරින් මරණයෙහි දී තමාට පිහිට වන්නකු නැතැයි දැන ගෙන, බුද්ධිමතා ශීල සංවරයෙන් යුක්ත ව නිවනට යන මඟ වහා පිරිසිදු කර ගත යුතු ය.

මාර්ග වර්ගය නිමි.

---

288. There are no sons for protection, neither father, nor relations. For one who is seized by death there is no protection in kinsmen.

289. Thoroughly realising this, the wise man, morally restrained, should quickly clear the way that leads to Nibbāna.

---

## පකිණ්ණක වග්ගො ඒකවීසතිමො.

290. මත්තාසුඛපරිච්චාගා
පස්සේ චේ විපුලං සුඛං,
චජේ මත්තාසුඛං ධීරෝ
සම්පස්සං විපුලං සුඛං.

291. පරදුක්ඛූපදානේන
අත්තනෝ සුඛමිච්ඡති,
වේරසංසග්ගසංසට්ඨෝ
වේරා සෝ න පරිමුච්චති.

292. යං හි කිච්චං තදපවිද්ධං
අකිච්චං පන කයිරති,
උන්නළානං පමත්තානං
තේසං වඩ්ඪන්ති ආසවා.

## *XXI. PAKIṆṆAKAVAGGO EKAVĪSATIMO*

290. Mattāsukhapariccāgā passe ce vipulaṃ sukhaṃ,
Caje mattāsukhaṃ dhīro sampassaṃ vipulaṃ sukhaṃ.

291. Paradukkhūpadānena attano sukham icchati,
Verasaṃsaggasaṃsattho verā so na parimuccati.

292. Yaṃ hi kiccaṃ tad'apaviddhaṃ akiccaṃ pana kayirati,
Unnalānaṃ pamattānaṃ tesaṃ vaḍḍhanti āsavā.

## 21. ප්‍රකීර්ණක වර්ගය

290. මද සැපයක් හැර දැමීමෙන් මහත් සැපයක් ලැබෙන බව පෙනේ නම් බුද්ධිමතා ඒ විපුල සැපය බලාපොරොත්තුවෙන් සුළු සැපය අත් හරී.

291. යමෙක් අනුන්ට දුක් දී තමන්ට සැප ලබන්ට කැමැති වේ ද වෛරයෙන් බැඳුණු සිත් ඇති ඔහු වෛරයෙන් නො මිදේ.

292. යමකු විසින් කටයුතු දේ හැර දමා නො කටයුතු දේ කරනු ලැබේ ද උඩඟු වූ, පමා වූ එබඳු පුද්ගලයන්ගේ ආශ්‍රවයෝ වැඩෙත්.

## XXI. MISCELLANEOUS

290. If by giving up a lesser happiness, one may behold a greater one, let the wise man give up the lesser and look to the greater one.

291 Whoso desires his own happiness by inflicting suffering on others, is not released from hatred, being him, self entangled in the bonds of hatred.

292. What ought to be done is left undone, what ought not to be done is done; in those unrestrained and negligent the defilements increase.

293. යේසං ච සුසමාරද්ධා
නිච්චං කායගතාසති,
අකිච්චං තේ න සේවන්ති
කිච්චේ සාතච්චකාරිනෝ,
සතානං සම්පජානානං
අත්ථං ගච්ඡන්ති ආසවා.

294. මාතරං පිතරං හන්ත්වා,
රාජානෝ ද්වේ ච ඛත්තියේ,
රට්ඨං සානුචරං හන්ත්වා,
අනීඝෝ යාති බ්‍රාහ්මණෝ.

293. Yesañ ca susamāraddhā niccaṃ kāyagatā sati,
Akiccaṃ te na sevanti kicce sātaccakārino,
Satānaṃ sampajānānaṃ atthaṃ gacchanti āsavā.

294. Mātaraṃ pitaraṃ hantvā, rājāno dve ca khattiye,
Ratthaṃ sānucaraṃ hantvā, anīgho yāti brāhmaṇo.

293. යම් කෙනකුන් විසින් නිතර කායගතාගති භාවනාව වඩන ලද ද ඔවුහු නො කටයුත්ත නො කරත්; කටයුත්තෙහි නිතර යෙදෙත්. මනා සිහියෙන් හා නුවණින් යුත් එබඳු පුද්ගලයන්ගේ ආශ්‍රවයෝ නැති වෙත්.

294. නියම බ්‍රාහ්මණයා තණ්හා නමැති මව ද, මානය නමැති පියා ද, ශාශ්වත උච්ඡේද දෘෂ්ටි නමැති ක්ෂත්‍රිය රජුන් දෙ දෙනා ද, නන්දිරාග නමැති අනුචරයා සහිත වූ දොළොස් ආයතන නමැති රට ද නසා නිදුක් ව තිවනට යයි.

293. Those who always earnestly practise the meditation of the nature of the body, who do not follow what should not be done, who do perseveringly what should be done, the defilements of these mindful and reflective ones come to end

294. Having killed mother (craving), father (conciet), two warrior kings (eternalism and nihilism), and having destroyed a country (sense-avenues and sense-objects) together with its revenue officer (attachment), ungrieving goes the Brahmin (the arahant).

295. මාතරං පිතරං හන්ත්වා,
රාජානෝ ද්වේ ච සොත්ථියේ,
වෙයග්ඝපඤ්චමං හන්ත්වා.
අනීඝෝ යාති බ්‍රාහ්මණෝ.

296. සුප්පබුද්ධං පබුජ්ඣන්ති
සදා ගෝතමසාවකා,
යේසං දිවා ච රත්තෝ ච
නිච්චං බුද්ධගතාසති.

297. සුප්පබුද්ධං පබුජ්ඣන්ති
සදා ගෝතමසාවකා,
යේසං දිවා ච රත්තෝ ච
නිච්චං ධම්මගතාසති.

295. Mātaraṃ pitaraṃ hantvā, rājāno dve ca sotthiye,
Veyyagghapañcamaṃ hantvā, anīgho yāti brāhmano.

296. Suppabuddhaṃ pabujjhanti sadā Gotamasāvakā,
Yesaṃ divā ca ratto ca niccaṃ Buddhagatā sati.

297. Suppabuddhaṃ pabujjhanti sadā Gotamasāvakā,
Yesaṃ divā ca ratto ca niccaṃ Dhammagatā sati.

295. නියම බ්‍රාහ්මණයා තණ්හා නමැති මව ද, මාන නමැති පියා ද, ශාශ්වත උච්ඡේද දෘෂ්ටි නමැති බමුණු රජුන් දෙ දෙනා ද, විචිකිච්ඡාව පස් වනු කොට ඇති පංච නීවරණ නමැති ව්‍යාඝ්‍රයන් ද නසා නිදුක් ව නිවනට යයි.

296. යම් කෙනකුට දිවා රෑ දෙක්හි නිතර බුද්ධගතානුස්සතිය (=බුදු ගුණ අරමුණු කොට ගත් සිහිය) ඇද් ද ඒ ගෞතම ශ්‍රාවකයෝ හැම දා ම මනා පිබිදීමෙන් පුබුදිත්.

297. යම් කෙනකුන්ට දිවා රෑ දෙක්හි නිතර ධම්මගතානුස්සතිය (=ධර්මය අරමුණු කොට ගත් සිහිය) ඇද් ද ඒ ගෞතම ශ්‍රාවකයෝ හැම දා ම මනා පිබිදීමෙන් පුබුදිත්.

295. Having killed mother, father and two Brahmin kings, and having destroyed tiger as the fifth (five Hindrances, viz. sensuality, ill will, torpor of mind or body, worry and wavering) ungrieving goes the Brahmin (the Arahant.)

296. Well awake always arise Gotama's disciples, who by day and night constantly concentrate on the Buddha's virtues.

297. Well awake always arise Gotama's disciples, who by day and night constantly concentrate on the virtues of the Dhamma.

298\. සුප්පබුද්ධං පබුජ්ඣන්ති
සදා ගෝතමසාවකා,
යේසං දිවා ච රත්තෝ ච
නිච්චං සංඝගතාසති.

299\. සුප්පබුද්ධං පබුජ්ඣන්ති
සදා ගෝතමසාවකා,
යේසං දිවා ච රත්තෝ ච
නිච්චං කායගතාසති.

300\. සුප්පබුද්ධං පබුජ්ඣන්ති
සදා ගෝතමසාවකා,
යේසං දිවා ච රත්තෝ ච
අහිංසාය රතෝ මනෝ.

298\. Suppabuddhaṃ pabujjhanti sadā Gotamasāvakā,
Yesaṃ divā ca ratto ca niccaṃ Sanghagatā sati.

299\. Suppabuddhaṃ pabujjhanti sadā Gotamasāvakā,
Yesaṃ divā ca ratto ca niccaṃ kāyagatā sati.

300\. Suppabuddhaṃ pabujjhanti sadā Gotamasāvakā,
Yesaṃ divā ca ratto ca ahiṃsāya rato mano.

298. යම් කෙනකුන්ට දිවා රෑ දෙක්හි නිතර සංඝගතාසතිය (=සංඝයා අරමුණු කොට ගත් සිහිය) ඇද්ද ද ඒ ගෞතම ශ්‍රාවකයෝ හැම දා ම මනා පිබිදීමෙන් පුබුදිත්.

299. යම් කෙනකුන්ට දිවා රෑ දෙක්හි නිතර කායගතාසතිය (=කය අරමුණු කොට ගත් සිහිය) ඇද්ද ද ඒ ගෞතම ශ්‍රාවකයෝ හැම දා ම මනා පිබිදීමෙන් පුබුදිත්.

300. යම් කෙනකුන්ගේ සිත දිවා රෑ දෙක්හි නිතර අහිංසාවෙහි ඇලුණේ ද ඒ ගෞතම ශ්‍රාවකයෝ හැම දා ම මනා පිබිදීමෙන් පුබුදිත්.

298. Well awake always arise Gotama's disciples, who by day and night, constantly concentrate on the virtues of the Sangha.

299. Well awake always arise Gotama's disciples, who by day and night, constantly concentrate on the nature of the body.

300. Well awake always arise Gotama's disciples, whose mind by day and night delights in harmlessness.

301. සුප්පබුද්ධං පබුජ්ඣන්ති
සදා ගෝතමසාවකා,
යේසං දිවා ච රත්තෝ ච
භාවනාය රතෝ මනෝ.

302. දුප්පබ්බජ්ජං දුරභිරමං,
දුරාවාසා ඝරා දුඛා,
දුක්ඛෝ සමාන සංවාසෝ,
දුක්ඛානුපතිතද්ධගූ,
තස්මා න චද්ධගූ සියා,
දුක්ඛානුපතිතෝ සියා.

301. Suppabuddhaṃ pabujjhanti sadā Gotamasāvakā,
Yesaṃ divā ca ratto ca bhāvanāya rato mano

302. Duppabbajjaṃ durabhiramaṃ, durāvāsā, gharā dukhā,
Dukkho ' samānasaṃvāso, dukkhānupatit' addhagū,
Tasmā na c' addhagū siyā, dukkhānupatito siyā

301. යම් කෙනකුන්ගේ සිත දිවා රෑ දෙක්හි භාවනාවෙහි ඇලුණේ ද ඒ ගෞතම ශ්‍රාවකයෝ හැම දා ම මනා පිබිදීමෙන් පුබුදිත්.

302. පැවිද්ද දුෂ්කර ය; එහි සිත් ඇලවීමත් දුෂ්කර ය. ගිහි ගෙයි වාසයත් දුක් සහිත ය. අසමාන අදහස් ඇත්තන් හා විසීමත් දුකකි. සසර ද ඉතා දිග හෙයින් දුක් සහිත ය. මේ නිසා සසර මගට පිළිපන්නකු නො විය යුතු ය. දුකින් ලුහු බඳනා ලද්දකුත් නො විය යුතු ය.

301. Well awake always arise Gotama's disciples, whose mind by day and night delights in meditation.

302. Renunciation is difficult, difficult is to delight therein. Hard and sorrowful is household life. Sorrowful is the association with unequals. To transmigrate in Saṃsāra also is sorrowful. Therefore let none be a wanderer, be not a pursuer of suffering.

303. සද්ධෝ සීලේන සම්පන්නෝ
යසෝ භෝගසමප්පිතෝ,
යං යං පදේසං භජති,
තත්ථ තත්ථේව පූජිතෝ.

304. දූරේ සන්තෝ පකාසෙන්ති
හිමවන්තෝව පබ්බතෝ,
අසන්තෙත්ථ න දිස්සන්ති
රත්තිඛිත්තා යථා සරා.

305. ඒකාසනං ඒකසෙය්‍යං
ඒකෝ චරමතන්දිතෝ,
ඒකෝ දමයමත්තානං
වනන්තේ රමිතෝ සියා.

පකිණ්ණක වග්ගෝ නිට්ඨිතෝ.

---

303. Saddho sīlena sampanno yaso bhogasamappito,
Yaṃ yaṃ padesaṃ bhajati, tattha tatth' eva pūjito.

304. Dūre santo pakāsenti Himavanto'va pabbato,
Asant' ettha na dissanti ratti khittā yathā sarā.

305. Ekāsanaṃ ekaseyyaṃ eko caram atandito,
Eko damayam attānaṃ vanante ramito siyā.

303. ශ්‍රද්ධාවත්, සිල්වත්, කීර්තිමත්, භෝග සම්පත් බහුල පුද්ගලයා යම් යම් පෙදෙසකට යයි ද ඒ හැම තැන දී ම පුදනු ලැබේ.

304. ශාන්ත සත්පුරුෂයෝ කොතරම් දුර සිටියත් හිමාලය පර්වතය මෙන් ප්‍රකාශ ව පෙනෙත්. අශාන්ත අසත්පුරුෂයෝ ළඟ සිටියත් රෑ විදපු ඊතල මෙන් නො පෙනෙත්.

305. තනි ව ආත්ම දමනය කරන්නා තනි ව ම විසිය යුතු ය; තනි ව ම නිදිය යුතු ය; තනි ව ම හැසිරිය යුතු ය; නො මැලි ව කැලෑ කෙළවර සිත් අලවා විසිය යුතු ය.

ප්‍රකීර්ණක වර්ගය නිමි.

---

303. He who is full of faith and virtue, possessed of fame and prosperity, in whatever land he travels there he is revered.

304. The righteous shine from afar like the Himalaya mountain; but the unrighteous are not seen like arrows shot in the night.

305. He who sits alone, sleeps alone, walks alone without being indolent, he who subdues self alone, will find delight in forest depths.

## නිරය වග්ගෝ ද්වාවීසතිමෝ.

306. අභූතවාදී නිරයං උපේති
යෝ චාපි කත්වා න කරෝමි චාහ,
උභෝපි තේ පෙච්ච සමා භවන්ති
නිහීනකම්මා මනුජා පරත්ථ.

307. කාසාවකණ්ඨා බහවෝ
පාපධම්මා අසඤ්ඤතා,
පාපා පාපේහි කම්මේහි
නිරයං තේ උපපජ්ජරේ.

## *XXII. NIRAYAVAGGO DVĀVĪSATIMO*

306. Abhūtavādī nirayaṃ upeti yo cā'pi katvā, na karomi c'āha,
Ubho 'pi te pecca samā bhavanti nihīnakammā manujā parattha.

307. Kāsāvakaṇṭhā bahavo pāpadhammā asaññatā,
Pāpā pāpehi kammehi nirayaṃ te upapajjare.

## 22. නිරය වර්ගය.

306. බොරු කියන්නා මෙන් ම යමක් කොට එය නො කෙළේ ය යි කියන්නාත් අපායට යයි. පහත් ක්‍රියා ඇති ඒ මිනිස්සු දෙ දෙනා පරලොව දී ද සමාන වෙත්.

307. බෙල්ලෙහි කහ කඩ ඔතා ගත් පාප ස්වභාව ඇති, නො තැන්පත් පුද්ගලයෝ බොහෝ ය. ඒ පාපීහු සිය පාප ක්‍රියා නිසා අපායෙහි උපදිත්.

## XXII. WOEFUL STATE

306. The liar goes to hell, also he, who having done a thing says that he has not done it. Both these become equal after death, being men of base actions in the next world.

307. There are many ill natured, unrestrained, impostors who wear yellow robes. They, because of their evil deeds, are born in hell.

308. සෙය්‍යො අයොගුළො භුත්තො
තත්තො අග්ගිසිඛූපමො,
යං චෙ භුඤ්ජෙය්‍ය දුස්සීලො
රට්ඨපිණ්ඩං අසඤ්ඤතො.

309. චත්තාරි ඨානානි නරො පමත්තො
ආපජ්ජති පරදාරූපසෙවී,
අපුඤ්ඤලාභං, න නිකාමසෙය්‍යං,
නින්දං තතියං, නිරයං චතුත්ථං.

310. අපුඤ්ඤලාභො ච ගතී ච පාපිකා,
භීතස්ස භීතාය රතී ච ථොකිකා,
රාජා ච දණ්ඩං ගරුකං පණෙති,
තස්මා නරො පරදාරං න සෙවෙ.

308. Seyyo ayogulo bhutto tatto aggisikhūpamo,
Yañ ce bhuñjeyya dussīlo ratthapindaṃ asaññato.

309. Cattāri thānāni, naro pamatto āpajjatī paradārûpasevī,
Apuññalābhaṃ, na nikāmaseyyaṃ, nindaṃ tatiyaṃ,
nirayaṃ catutthaṃ.

310. Apuññalābho ca gatī ca pāpikā, bhītassa bhītāya ratī
ca thokikā,
Rājā ca daṇḍaṃ garukaṃ paṇeti, tasmā naro paradā-
raṃ na seve.

308. තැන්පත්කමක් නැති දුශ්ශීලයා රට වැසියා විසින් දෙන අංහාරය වළඳනවාට වඩා රත් වූ ගිනි සිළුවක් වැනි යකඩ ගුළියක් ගිලීම හොඳ ය.

309. පරදාරාවන් සේවනය කරන්නා වූ නො සැලකිලිමත් මිනිසා අකුසල් සිදු කර ගැනීම ය, සිතේ හැටියට නිදන්ට නො ලැබීම ය, මෙ ලොව නින්දාව ය, පරලොව අපායට යැම ය යන කරුණු සතරකට මූණ පාසි.

310. පරදාර සේවනයෙන් අකුසල් ද සිදු වේ. ලාමක ගතියට ද පත් වේ. ඒ හැර, බිය වූවකු සමග බිය වූවකුගේ කාම අංස්වාදය ද සුළු ය. මේ පිළිබඳ රජුගේ දඬුවමත් බර ය. මේ නිසා මිනිසා පරදාරාවන් නො සෙවිය යුතු ය.

308. Better to eat a red-hot iron ball issuing flames than to eat alms given by the people as an immoral, unrestrained man.

309. A negligent one who commits adultery gains four things—acquisition of demerit, broken sleep, thirdly blame, and fourthly hell.

310. There is acquisition of demerit, and unhappy birth in future; brief is the pleasure of the frightened man and woman: the King imposes heavy punishment. Hence no man should run after another's wife.

311. කුසො යථා දුග්ගහිතො
හත්ථමෙවානුකන්තති,
සාමඤ්ඤං දුප්පරාමට්ඨං
නිරයායුපකඩ්ඪති.

312. යං කිංචි සිථිලං කම්මං,
සංකිලිට්ඨං ච යං වතං,
සංකස්සරං බ්‍රහ්මචරියං,
න තං හොති මහප්ඵලං.

313. කයිරා චෙ කයිරාථෙනං,
දළ්හමෙනං පරක්කමෙ,
සිථිලො හි පරිබ්බාජො
භීයො ආකිරතෙ රජං.

311. Kuso yathā duggahito hattham evānukantati,
Sāmaññaṃ dupparāmatthaṃ nirayāy 'upakaḍḍhati.

312. Yaṃ kiñci sithilaṃ kammaṃ, saṅkiliṭṭhañ ca yaṃ vataṃ,
Saṅkassaraṃ brahmacariyaṃ, na taṃ hoti mahapphalaṃ.

313. Kayirā ce kayirāth'enaṃ, daḷham enaṃ parakkame,
Sathilo hi paribbājo bhīyo ākirate rajaṃ.

311. වැරදි විධියට අල්ලා ගත් කුස තණය එය අැල්ලුවහුගේ අත කපන්නාක් මෙන් වරදවා ගත් මහණකම පුද්ගලයා අපායට අදී.

312. පසුබට වෙමින් ලිහිල් ව කළ කුශලයත්, කිලිටි වූ ව්‍රතයත්, සැක කටයුතු සේ පවත්වන බ්‍රහ්මචර්‍ය්‍යාව හෙවත් මහණ දමත් මහත් ඵල දෙයක නො වේ.

313. කුශලයක් කරතොත් එය මැනවින් ම කළ යුතු ය; දැඩි ව ම කළ යුතු ය. ලිහිල් ව - අාවාට ගියාට කරන මහණකම වඩ වඩාත් කෙලෙස් වගුරුවයි.

311. As kusa grass wrongly handled cuts the very hand, so also asceticism wrongly tried, leads to hell.

312. Any loose act, any corrupt observance, a dubious code of chastity brings no great reward.

313. If anything is to be done let one do it vigorously. A half-hearted asceticism scatters dust all the more.

314. අකතං දුක්කතං සෙය්‍යෝ,
පච්ඡා තපති දුක්කතං,
කතං ච සුකතං සෙය්‍යෝ,
යං කත්වා නානුතප්පති.

315. නගරං යථා පච්චන්තං
ගුත්තං සන්තරබාහිරං,
ඒවං ගෝපේථ අත්තානං,
ඛණෝ වේ මා උපච්චගා,
ඛණාතීතා හි සෝචන්ති
නිරයම්හි සමප්පිතා.

316. අලජ්ජිතායේ ලජ්ජන්ති,
ලජ්ජිතායේ න ලජ්ජරේ,
මිච්ඡාදිට්ඨිසමාදානා
සත්තා ගච්ඡන්ති දුග්ගතිං.

314. Akataṃ dukkataṃ seyyo, pacchā tapati dukkataṃ,
Katañ ca sukataṃ seyyo, yaṃ katvā nānutappati.

315. Nagaraṃ yathā paccantaṃ guttaṃ santarabāhiraṃ,
Evaṃ gopetha attānaṃ, khaṇo ve mā upaccagā,
Khaṇātītā hi socanti nirayamhi samappitā.

316. Alajjitāye lajjanti, lajjitāye na lajjare.
Micchāditthisamādānā sattā gacchanti duggatiṃ.

314. දුෂ්කෘතය හෙවත් අකුසලය කිරීමෙන් පසු තැවෙන්ට වන නිසා එය නො කිරීම හොඳ ය. සුකෘතය හෙවත් කුශලය කිරීමෙන් පසු තැවීමක් නො වන නිසා එය ම කළ යුතු ය.

315. ඇතුළතිනුත්, පිටතිනුත් රැකවරණය කළ පිටිසර නුවරක් මෙන් තමා රැක ගත යුතු ය. තමා ලත් උතුම් මොහොත ඉක්මවන්නෝ අපායට වැටී ශෝක කරත්. (ඒ නිසා බුදුන් උපන් කාලය නමැති උතුම්) මොහොත ඔබ ඉක්ම නො යේවා!

316. ඇතැම් සත්ත්වයෝ ලජ්ජා නො කටයුත්තෙහි ලජ්ජා කොට, ලජ්ජා කටයුත්තෙහි ලජ්ජා නො කොට මිසදිටු ගැනීමෙන් අපායට යත්.

314. An evil deed is better left undone, for an evil deed torments one later; a good deed is better done, which, being done, causes no repentance later.

315. Like a frontier town, guarded within and without, so guard yourself. Surely, do not let a moment glide by, for they who allow the moments to pass by lament when born in hell.

316. They who are ashamed of what is unshamful, and unashamed of what is shamful, embracing false views go to the woeful state.

317. අභයේ ච භයදස්සිනෝ,
භයේ චාභයදස්සිනෝ,
මිච්ඡාදිට්ඨිසමාදානා,
සත්තා ගච්ඡන්ති දුග්ගතිං.

318. අවජ්ජේ වජ්ජමතිනෝ,
වජ්ජේ චාවජ්ජදස්සිනෝ,
මිච්ඡාදිට්ඨිසමාදානා
සත්තා ගච්ඡන්ති දුග්ගතිං.

319. වජ්ජං ච වජ්ජතෝ ඤත්වා,
අවජ්ජං ච අවජ්ජතෝ,
සම්මාදිට්ඨිසමාදානා
සත්තා ගච්ඡන්ති සුග්ගතිං.

**නිරය වග්ගෝ නිට්ඨිතෝ.**

---

317. Abhaye ca bhayadassino, bhaye cābhayadassino,
Micchādiṭṭhisamādānā, sattā gacchanti duggatiṃ.

318. Avajje vajjamatino, vajje cāvajjadassino,
Micchādiṭṭhisamādānā sattā gacchanti duggatiṃ.

319. Vajjañ ca vajjato ñatvā, avajjañ ca avajjato,
Sammādiṭṭhisamādānā sattā gacchanti suggatiṃ.

---

317. ඇතැම් සත්වයෝ බිය නො විය යුත්තට බිය වී, බිය විය යුත්තට බිය නො වී මිසදිටු ගැනීමෙන් අපායට යත්.

318. ඇතැම් සත්වයෝ නිවැරැදි දෙය වැරදි ය සි ද, වැරදි දෙය නිවැරදි ය සි ද දකිමින් මිසදිටු ගෙන අපායට යත්.

319. ඇතැම් සත්වයෝ වරද වරද වශයෙනුත්, නිවරද නිවරද වශයෙනුත් දකිමින් සම්‍යග් දෘෂ්ටි ගෙන සුගතියට යත්.

නිරය වර්ගය නිමි

---

317 They who see fear in the non-fearsome, and do not see fear in the fearsome, embracing false views go to the woeful state.

318. They who discern evil where there is none, and do not see evil where evil is, embracing false views go to the woeful state.

319. They who know wrong as wrong and right as right, embracing right views go to the happy state.

---

## නාග වග්ගෝ තේවීසතිමෝ.

320. අහං නාගෝ'ව සංගාමේ
චාපාතෝ පතිතං සරං,
අතිවාක්‍යං තිතික්ඛිස්සං,
දුස්සීලෝ හි බහුජ්ජනෝ

321. දන්තං නයන්ති සමිතිං,
දන්තං රාජාභිරූහති,
දන්තෝ සෙට්ඨෝ මනුස්සේසු,
යෝතිවාක්‍යං තිතික්ඛති.

322. වරමස්සතරා දන්තා,
ආජානීයා ච සින්ධවා,
කුඤ්ජරා ච මහානාගා,
අත්තදන්තෝ තතෝ වරං.

## *XXIII. NĀGAVAGGO TEVĪSATIMO*

320. Ahaṃ nāgo ' va saṅgāme cāpāto patitaṃ saraṃ,
Ativākyaṃ titikkhissaṃ, dussīlo hi bahujjano.

321. Dantaṃ nayanti samitiṃ, dantaṃ rājābhirūhati,
Danto seṭṭho manussesu, yo 'tivākyaṃ titikkhati.

322. Varam assatarā dantā, ājānīyā ca sindhavā,
Kuñjarā ca mahānāgā, attadanto tato varaṃ.

## 23. නාග වර්ගය.

320. ලෝකයෙහි බොහෝ දෙනා දුස්සීල ය, හෙවත් නරක ය. ඒ නිසා යුද බිමෙහි දී දුන්නෙන් අං ඊ පහර විඳින ඇතකු මෙන් මම ද නොයෙක් දෙනාගේ පරුෂ වචන හා ඇනුම් බැනුම් ඉවසන්නෙමි.

321. දමුණු - හික්මුණු - ඇතා සමිතියට (=ජනයා රැස් වන තැනට) ගෙන යත්. රජු ද හික්මුණු ඇතු පිට නගී. මිනිසුන් අතරත් අනුන්ගේ පරුෂ වචන ඉවසීමෙහි සමත් හික්මුණු පුද්ගලයා ම ශ්‍රේෂ්ඨ වේ.

322. දමුණා වූ අශ්වතරයෝත්, ආජානීය අශ්වයෝත්, සෛන්ධවයෝත්, මහා ඇත්තුත් උතුම් ය. එහෙත් ඒ සියල්ලන්ට ම වඩා ආත්මය දමනය කර ගත්තා වූ පුද්ගලයා උතුම් ය.

## XXIII. THE ELEPHANT

320. I will endure abuse even as the elephant in battle withstands the arrows shot from a bow. Verily, most people are ill natured.

321. They lead the tamed elephant into the crowd. The king mounts the tamed. The best among men is the tamed who endures abuse.

322. Excellent are tamed mules, so are the thorough-bred Sindhu horses and the noble fighting elephants. But better than these is he who has tamed himself.

323. න හි ඒතේහි යානේහි
ගච්ඡෙය්‍ය අගතං දිසං,
යථාත්තනා සුදන්තේන
දන්තො දන්තේන ගච්ඡති.

324. ධනපාලකො නාම කුඤ්ජරො
කටුකප්පභේදනො දුන්නිවාරයො,
බද්ධො කබලං න භුඤ්ජති,
සුමරති නාගවනස්ස කුඤ්ජරො.

325. මිද්ධී යදා හොති මහග්ඝසො ච,
නිද්දායිතා සම්පරිවත්තසායී,
මහාවරාහොව නිවාපපුට්ඨො,
පුනප්පුනං ගබ්භමුපේති මන්දො.

323. Na hi etehi yānehi gaccheyya agataṃ disaṃ,
Yathā 'ttanā sudantena danto dantena gacchati.

324. Dhanapālako nāma kuñjaro,
Katukappabhedano dunnivārayo,
Baddho kabalaṃ na bhuñjati,
Sumarati nāgavanassa kunjaro.

325. Middhī yadā hoti mahagghaso ca,
Niddāyitā samparivattasāyī,
Mahāvarāho'va nivāpaputtho,
Punappunaṃ gabbham upeti mando.

323. යමෙක් මනා ව දමනය කර ගත් ආත්මය උදව් කොට ගෙන කලින් නො ගිය දිශාව වූ නිවන දෙසට යම් සේ යයි ද, කොතරම් දමුණු කෙනකුට, කොතරම් හොඳින් හික්මවා ගත් ඇත් අස් ආදි යානා වලින් වුවත් එහි නො යා හැකි ය.

324. ධනපාලක නම් වූ තියුණු, මද වැහෙන, මේච්චල් කළ නො හැකි, මාතු පෝසක ඇතා බඳින ලද නමුත් ඔහුට දුන් ප්‍රණීත කෑම නො කයි. ඔහු තමාගේ මව විඩූ වනය ම සිහි කරයි.

325. යමෙක් යම් විටක තිනේ කයේ මැළි ගතියෙන් යුක්ත වේ ද, බොහෝ කොට කයි ද, කාලං පෙරළි පෙරළී නිදයි ද උඟුරු අහරින් තර වූ මහ උඟුරකු බඳු වූ ඒ අඥයා නැවත නැවත උපදියි.

323. Never by these vehicles would one go to the untrodden region, as does a tamed one through his subdued and well tamed self.

324. The great elephant called Dhanapālaka, with pungent rut flowing is uncontrollable; and being in chains he refuses food. He thinks longingly of the elephant grove.

325. When one is torpid, gluttonous, sleepy, rolls over and over, like a big hog nourished on wash, such a fool comes to birth again and again.

326. ඉදං පුරේ චිත්තමචාරි චාරිකං,
යේනිච්ඡකං යත්ථ කාමං යථාසුඛං,
තදජ්ජහං නිග්ගහෙස්සාමි යෝනිසෝ,
හත්ථිප්පභින්නං විය අංකුසග්ගහෝ.

327. අප්පමාදරතා හෝථ,
සචිත්තමනුරක්ඛථ,
දුග්ගා උද්ධරථත්තානං,
පංකේ සත්තෝව කුංජරෝ.

328. සචේ ලභෙථ නිපකං සහායං
සද්ධිං චරං සාධුවිහාරි ධීරං,
අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි
චරෙය්‍ය තේනත්තමනෝ සතීමා.

326. Idaṃ pure cittam acāri cārikaṃ,
Yenicchakaṃ yatthakāmaṃ yathāsukhaṃ,
Tadajj'ahaṃ niggahessāmi yoniso,
Hatthippabhinnaṃ viya aṅkusaggaho.

327. Appamādaratā hotha, sacittam anurakkhatha,
Duggā uddharath' attānaṃ, paṅke satto 'va kuñjaro.

328. Sace labhetha nipakaṃ sahāyaṃ,
Saddhiṃ caraṃ sādhuvihāri dhīraṃ,
Abhibhuyya sabbāni parissayāni,
Careyya ten' attamano satīmā.

326. පෙර මේ සිත තමාට රිසි සේ, කැමැති සේ, සුව සේ සැරිසරා ඇවිද්දේ ය. මම අද එය, ඇත් ගොව්වා මද බිඳුණු ඇතකු අල්ලා ගන්නා මෙන්, නුවණින් අල්ලා ගනිමි.

327. නොපමා බවෙහි ඇලිය යුතු ය. සිය සිත රැක ගත යුතු ය. මඩෙහි එරුණු ඇතකු ගොඩ ගන්නා මෙන් ආත්මය කෙලෙස් දුගීයෙන් ගොඩ ගත යුතු ය.

328. යම් විධියකින් බුද්ධිමත් වූ, සමග හැසිරෙන්නා වූ, මනා පැවතුම් ඇති, ඵෛර්‍ය සම්පන්න වූ යහළුවකු ලැබ ගත හැකි නම් සියලු උවදුරු මැඩ ගෙන ඔහු සමග සතුටින් හා හොඳ සිහියෙන් යුක්ත ව විසිය යුතු ය.

326. Formarly this mind went wandering as it liked, where it desired, as it pleased To-day, with attentiveness, I will thoroughly control it as a mahout, a rut-elephant.

327. Be delighted in vigilance. Guard your mind Draw your self out of the slough of evil like an elephant sunk in the mud.

328 If you find a prudent companion who is fit to keep company with you, who behaves well, and is wise, you should live with him delightfully and mindfully overcoming all dangers.

329. නෝ චෙ ලභේථ නිපකං සහායං
සද්ධිං චරං සාධුවිහාරි ධීරං,
රාජාව රට්ඨං විජිතං පහාය
ඒකෝ චරේ මාතංගරඤ්ඤේව නාගෝ.

330. ඒකස්ස චරිතං සෙය්‍යෝ
නත්ථි බාලේ සහායතා,
ඒකෝ චරේ න ච පාපානි කයිරා,
අප්පොස්සුක්කෝ මාතංගරඤ්ඤේව නාගෝ.

331. අත්ථම්හි ජාතම්හි සුඛා සහායා,
තුට්ඨී සුඛා යා ඉතරීතරේන,
පුඤ්ඤං සුඛං ජීවිතසංඛයම්හි,
සබ්බස්ස දුක්ඛස්ස සුඛං පහාණං.

329. No ce labhetha nipakaṃ sahāyaṃ
Saddhiṃ caraṃ sādhuvihāri dhīraṃ,
Rājā'va raṭṭhaṃ vijitaṃ pahāya,
Eko care, mātaṅg' araññe ' va nāgo.

330. Ekassa caritaṃ seyyo, n'atthi bāle sahāyatā,
Eko care na ca pāpāni kayirā, appossukko mātaṅg'
araññe ' va nāgo.

331. Atthamhi jātamhi sukkhā sahāyā,
Tuṭṭhī sukhā yā itarītarena,
Puññaṃ sukhaṃ jīvitasaṅkhayamhi,
Sabbassa dukkhassa sukhaṃ pahānaṃ.

329. යම් විධියකින් බුද්ධිමත් වූ, සමඟ හැසිරෙන්නා වූ, මනා පැවතුම් ඇති, ධෛර්‍ය සම්පන්න වූ යහළුවකු ලැබ ගත නො හැකි නම් දිනා ගත් රට හැර ගිය රජු මෙන් ද, කැලෑවේ තනි ව වසන මාතංග හස්තියා මෙන් ද තනිව විසිය යුතු ය.

330. මෝඩයන් හා එක් වීමක් නැති ව තනි ව හැසිරීම යහපත් ය. කැලෑවේ තනි ව වසන මාතංග හස්තියා මෙන් තනි ව හැසිරෙන විට පව් ද නො කෙරේ.

331. වැඩක් ඇති කල්හි යහළුවෝ සැප ය. හෙවත් හොඳ ය; තමා වෙත ඇති දෙයකින් සතුටු වීමත් සැපයකි; මරණ අවස්ථායෙහි පින ද සැපයකි; මේ සියල්ලට ම වඩා සියලු දුක් නැති කර ගැනීම සැපයකි.

329. If you do not find a companion who is fit to keep company with you, who behaves well, and is wise, then like a King who gives up a conquered kingdom or like an elephant in the forest, go alone.

330. It is better to live alone, there is no companionship with the foolish. Living alone one avoids evils and is carefree like an elephant in the forest.

331. Companions are pleasant when need arises. Contentment is pleasant when mutual. Merit is pleasant at the end of life. It is pleasant to give up all sorrow.

332. සුඛා මත්තෙය්‍යතා ලෝකේ,
අථෝ පෙත්තෙය්‍යතා සුඛා,
සුඛා සාමඤ්ඤතා ලෝකේ,
අථෝ බ්‍රහ්මඤ්ඤතා සුඛා.

333. සුඛං යාව ජරා සීලං,
සුඛා සද්ධා පතිට්ඨිතා,
සුඛෝ පඤ්ඤාය පටිලාභෝ,
පාපානං අකරණං සුඛං.

**නාග වග්ගෝ නිට්ඨිතෝ.**

---

332. Sukhā matteyyatā loke, atho petteyyatā sukhā,
Sukhā sāmaññatā loke, atho brahmaññatā sukhā.

333. Sukhaṃ yāva jarā sīlaṃ, sukhā saddhā patitthitā,
Sukho paññāya patilābho pāpānaṃ akaraṇaṃ sukhaṃ.

---

332. ලෝකයෙහි මවුට උපස්ථාන කිරීම සැපයකි; පියාට උපස්ථාන කිරීම ද සැපයකි; භික්ෂූන්ට සත්කාර කිරීම ද සැපයකි; බුද්ධාදි උතුමන්ට සත්කාර කිරීම ද සැපයකි.

333. ජරාව තෙක් සිල් රැකීම සැපයකි; මනා ව පිහිටි ශ්‍රද්ධාව ද සැපයකි; නුවණ ලැබීම ද සැපයකි; පව් නො කිරීම ද සැපයකි.

නාග වර්ගය නිමි.

---

332. It is happy in this world to serve mother; happy is to serve father; happy is to serve ascetics; happy, too, is to serve Noble Ones.

333. Happy is virtue till old age; happy is confidence established; happy is the attainment of wisdom, happy is the avoidence of evils.

## තණ්හා වග්ගෝ චතුවීසතිමෝ.

334. මනුජස්ස පමත්තචාරිනෝ
තණ්හා වඩ්ඪති මාලුවා විය,
සෝ ප්ලවති හුරාහුරං
ඵලමිච්ඡංව වනස්මිං වානරෝ.

335. යං එසා සහතී ජම්මී
තණ්හා ලෝකේ විසත්තිකා,
සෝකා තස්ස පවඩ්ඪන්ති
අභිවට්ඨංව බීරණං.

336. යෝ චේතං සහතී ජම්මිං
තණ්හං ලෝකේ දුරච්චයං,
සෝකා තම්හා පපතන්ති
උදබින්දූව පොක්ඛරා.

## *XXIV. TAṆHĀVAGGO CATUVĪSATIMO*

334. Manujassa pamattacārino
Taṇhā vaḍḍhati māluvā viya,
So plavati hurāhuraṃ
Phalam icchaṃ'va vanasmiṃ vānaro.

335. Yaṃ esā sahatī jammī taṇhā loke visattikā,
Sokā tassa pavaḍḍhanti abhivatthaṃ 'va bīranaṃ.

336. Yo c' etaṃ sahatī jammiṃ taṇhaṃ loke duraccayaṃ,
Sokā tamhā papatanti udabindū ' va pokkharā.

## 24. තෘෂ්ණා වර්ගය.

334. නො සැලකිලිමත් මිනිසාගේ ආශාව මාලුවා වැලක් මෙන් වැඩෙයි. වඳුරා වනයෙහි ඵල ආශාවෙන් පැන ඇවිදින්නාක් මෙන් ඔහු භවයෙන් භවයට පනී.

335. ලාමක වූ, අතිශයින් ම ඇලීම ස්වභාව කොට ඇති මේ තණ්හාව ලෝකයෙහි යමකු මැඩ ලයි ද, මහා වැස්සකින් තෙමුණු බීරණ තණ කොළ මෙන් ඔහුගේ ශෝකයෝ වැඩෙත්.

336. යමෙක් ලෝකයෙහි දුක සේ ඉක්ම විය යුතු වූ ලාමක වූ මේ තණ්හාව මැඩ ලයි ද, නෙළුම් පතින් ගිලිහෙන දිය බින්දු මෙන්, ඔහු වෙතින් ශෝකයෝ ගිලිහෙත්.

## XXIV. CRAVING

334. The craving of a person of negligent living grows like a Maluvā creeper. Like a fruit-loving monkey in the forest he jumps from life to life.

335. Whomso in the world this wretched clinging thirst overcomes, his sorrows flourish like Bīrana grass after rain.

336. Whoso in the world overcomes this wretched, uncontrollable craving, sorrows fall from him like water drops from a lotus leaf.

337. තං වො වදාමි භද්දං වො
යාවන්තෙත්ථ සමාගතා:
තණ්හාය මූලං ඛණථ
උසීරත්ථොව බීරණං,
මා වො නළංව සොතොව
මාරො භඤ්ජි පුනප්පුනං!

338. යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ
ඡින්නොපි රුක්ඛො පුනරෙව රූහති,
එවම්පි තණ්හානුසයෙ අනූහතෙ
නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං.

339. යස්ස ඡත්තිංසති සොතා
මනාපස්සවණා භුසා,
වාහා වහන්ති දුද්දිට්ඨිං
සංකප්පා රාගනිස්සිතා.

337. Taṃ vo vadāmi bhaddaṃ vo yāvant ‘ettha samāgatā;
Tanhāya mūlaṃ khaṇatha usīrattho‘va bīraṇaṃ,
Mā vo naḷaṃ ‘va soto‘va Māro bhañji punappunaṃ.

338. Yathā pi mūle anupaddave daḷhe,
Chinno‘pi rukkho punar eva rūhati,
Evam pi tanhānusaye anūhate
Nibbattati dukkhami’daṃ punappunaṃ.

339. Yassa chattiṃsatī sotā manāpassavanā bhusā,
Vāhā vahanti duddiṭṭhiṃ saṅkappā rāganissitā.

337. මෙහි රැස්වූ යම් පමණ දෙනා ඇද්ද, ඒ හැමට යහපත පතමින් කරුණක් ද කියමි: සුවඳ හොට ලැබිය යුතු කල බොරැ තණ හාරන්නාක් මෙන් තණ්හාවේ මුල වූ අවිද්‍යාව උදුරා දමව්. දිය පහර බට පඳුර පෙළන්නාක් මෙන් මාරයා නැවත නැවත ඔබ නො පෙළාවා!

338. මුලට අනතුරක් නැති ව එය දැඩි ව පවත්නා කල්හි මුදුනෙන් කැපූ ගස නැවත වැඩෙන්නේ යම් සේ ද එසේ ම තණ්හා අනුසය මුලින් නො නැසූ කල්හි මේ දුක නැවතත් හට ගනී.

339. දිය පහරවල් සතිසකින් යුක්ත වූ තෘෂ්ණා නදිය යමකුගේ අරමුණුවල වේගයෙන් ගලා බසී ද ඒ නදියට අයත් රාග නිශ්‍රිත වූ විතර්ක නමැති ජල පහරවල් විපරීත බුද්ධිය ඇති ඒ පුද්ගලයා අපායට ගෙන යත්.

337. I declare to you: good luck to you all who have gathered here! Dig up the root of craving like the digger of Bīrana for its (usīra) root. Let Māra (death) not crush you again and again as the flood, a reed.

338. As a tree, though cut down, grows again if its root remains uninjured and strong even so when the propensity to craving is not rooted out, this suffering springs up again and again.

339. Whose thirty-six streams of craving that flow towards pleasurable objects are strong, whose thoughts are centred on passion, that misguided man is taken away by floods.

340. සවන්ති සබ්බධී සෝතා,
ලතා උබ්භිජ්ජ තිට්ඨති,
තං ච දිස්වා ලතං ජාතං,
මූලං පඤ්ඤාය ඡින්දථ.

341. සරිතානි සිනේහිතානි ච,
සෝමනස්සානි භවන්ති ජන්තුනෝ
තේ සාතසිතා සුඛේසිනෝ,
තේ වේ ජාතිජරූපගා නරා.

342. තසිණාය පුරක්ඛතා පජා
පරිසප්පන්ති සසෝ'ව බන්ධිතෝ,
සංයෝජනසංගසත්තා
දුක්ඛමුපෙන්ති පුනප්පුනං චිරාය.

340. Savanti sabbadhī sotā, latā ubbhijja titthati,
Tañ ca disvā latam̤ jātam̤, mūlam̤ paññāya chindatha.

341. Saritāni sinehitāni ca,
Somanassāni bhavanti jantuno,
Te sātasitā sukhesino,
Te ve jātijarūpagā narā.

342. Tasiṇāya purakkhatā pajā
Parisappanti saso'va bandhito,
Sam̤yojanasaṅgasattā
Dukkham'upenti punappunam̤ cirāya.

340. තෘෂ්ණා නමැති දිය පහරවල් හැම තැන ගලා බසිත්. තෘෂ්ණා නමැති ලතාව සදෙරින් මතු වී සිටී. එසේ හට ගත් ඒ තෘෂ්ණා ලතාව බලා එහි මූල නුවණින් සිඳිව්.

341. සත්ත්වයාම රූපාදි අරමුණුවල විසිර පවත්නා වූ, තෘෂ්ණාවෙන් තෙත් වූ සොම්නස් වේදනාවෝ ඇති වෙත්. ඒ සොම්නස් ඇසුරු කළාහු සිත කය දෙකට සැප සොයත්. ඔවුහු ඒකාන්තයෙන් ම ජාති, ජරා ආදියට පැමිණෙන්නෝ ය.

342. තණ්හාවෙන් වට වූ ප්‍රජාවෝ මල පුඩුවෙන් බැඳුණු සාවා මෙන් හැපෙත්, හෙවත් බියෙන් ගැහෙත්. දශ සංයෝජනවලින් හා රාගාදි සත් සංගවලින් බැඳුණෝ කලක් යන තුරු ම නැවත නැවතත් දුකට පැමිණෙත්.

340 The streams flow everywhere. The creeper (of, craving) sprouts and stands. Seeing that creeper sprung up cut its root with wisdom.

341. To beings there arise pleasures that rush towards sense objects and are moistened with craving They seeing only happiness hanker after pleasures; and verily, they, come to birth and decay.

342. People, enwrapt in craving, run about like a captured hare. Held fast by fetters and toils, for long they come to suffering again and again.

343. තසිණාය පුරක්ඛතා පජා
පරිසප්පන්ති සසෝ'ව බන්ධිතෝ,
තස්මා තසිණං විනෝදයේ
භික්ඛු ආකංඛී විරාගමත්තනෝ.

344. යෝ නිබ්බනථෝ වනාධිමුත්තෝ
වනමුත්තෝ වනමේව ධාවති,
තං පුග්ගලමේව පස්සථ
මුත්තෝ බන්ධනමේව ධාවති.

345. න තං දළ්හං බන්ධනමාහු ධීරා
යදායසං දාරුජං බබ්බජං ච,
සාරත්තරත්තා මණිකුණ්ඩලේසු
පුත්තේසු දාරේසු ච යා අපේඛා,—

343. Tasiṇāya purakkhatā pajā
Parisappanti saso'va bandhito,
Tasmā tasiṇaṃ vinodaye
Bhikkhu ākankhī virāgam attano

344. Yo nibbanatho vanādhimutto
Vanamutto vanam eva dhāvati,
Taṃ puggalam eva passatha,
Mutto bandhanam eva dhāvati.

345. Na taṃ daḷhaṃ bandhanaṃ āhu dhīrā
Yadā yasaṃ dārujaṃ babbajañ ca,
Sārattarattā maṇikundalesu
Puttesu dāresu ca yā apekhā,—

343. තණ්හාවෙන් වට වූ ප්‍රජාවෝ මල පුඩුවෙන් බැඳුණු සාවා මෙන් හැපෙත්, හෙවත් බියෙන් ගැහෙත්. ඒ නිසා තමහට නිවන් කැමැති භික්ෂුව විසින් තණ්හාව දුරු කළ යුතු ය.

344. යමෙක් වනථය (=ගිහි ගෙයි ඇල්ම) හැර දමා තපෝ වනයෙහි ඇලී, නැවතත් ඒ තපෝ වනයෙන් මිදී හෙවත් වෙන් ව ගිහි ගෙට ම දුවයි ද, එසේ වරක් බන්ධනයෙන් මිදී නැවත බන්ධනයට ම අසු වන ඒ පුද්ගලයා මෙබඳු බව දැන ගනිව්.

345. යකඩින් හෝ, දැවයෙන් හෝ, බබුස් තණින් හෝ කළා වූ යම් බැම්මක් වේ ද එය දැඩි බැම්මකැයි පණ්ඩිතයෝ නො කියත්. මිණි කොඬොල්හි ද, පුතු දරුවන් කෙරෙහි ද යම් දැඩි ඇල්මක් වේ නම්,—

343. People enwrapt in craving, run about like a captive hare. Therefore a Bhikkhu, wishing for himself freedom from passion, should descard craving.

344. Whoso, devoid of craving turns to the life of the forest, and thus freed from forest, runs back to the very forest. Look at him, though free, runs back to bondage!

345. The wise say that it is not strong bond which is made of iron, wood or fibre. Far greater an attachment is that longing for jewels and ornaments, children and wives,—

346. ඒතං දළ්හං බන්ධනමාහු ධීරා
ඕහාරිනං සිථිලං දුප්පමුඤ්චං,
ඒතම්පි ඡෙත්වාන පරිබ්බජන්ති
අනපෙක්ඛිනෝ කාමසුඛං පහාය.

347. යේ රාගරත්තානුපතන්ති සෝතං
සයං කතං මක්කටකෝ'ව ජාලං,
ඒතම්පි ඡෙත්වාන වජන්ති ධීරා
අනපෙක්ඛිනෝ සබ්බදුක්ඛං පහාය.

348. මුඤ්ච පුරේ මුඤ්ච පච්ඡතෝ,
මජ්ඣේ මුඤ්ච භවස්ස පාරගූ
සබ්බත්ථ විමුත්තමානසෝ,
න පුන ජාතිජරං උපේහිසි.

346. Etaṃ daḷhaṃ bandhanam āhu dhīrā
Ohārinaṃ sithilaṃ duppamuñcaṃ,
Etam pi chetvāna paribbajanti
Anapekkhino kāmasukhaṃ pahāya.

347. Ye rāgarattā' nupatanti sotaṃ
Sayaṃ kataṃ makkatako'va jālaṃ,
Etam pi chetvāna vajanti dhīrā
Anapekkhino sabbadukkhaṃ pahāya.

348. Muñca pure muñca pacchato,
Majjhe muñca bhavassa pāragū.
Sabbattha vimuttamānaso,
Na puna jātijaraṃ upehisi.

346. එය දැඩි බැම්මකැ යි පණ්ඩිතයෝ කියත්. කාම
සැපෙහි බලාපොරොත්තු නැත්තෝ සක්කාය පහතට ඇද
ලන්නා වූ, ලිහිල් වූ, මිදිය නො හැකි වූ ඒ බැම්ම ද කපා
දමා කාම සැප ද හැර මහණ වෙත්.

347. රාගයෙන් රත් වූ යම් කෙනෙක් තමා විසින්
සාදා ගන්නා ලද දැලෙහි වැටෙන මකුළුවා මෙන් තමාගේ
ම තෘෂ්ණාව නමැති වතුරට වැටෙත්. කාම සැප ගැන
බලාපොරොත්තු නැති පණ්ඩිතයෝ ඒ බැම්ම ද කපා
දමා සියලු දුක් දුරු කොට නිවනට යත්.

348. පෙර පැවැත්තා වූත්, ඉදිරියට පවතින්නා වූත්,
දැනට පවත්නා වූත්, පඤ්චස්කන්ධය ගැන ඇති ආශාව
දුර ලව. භවයෙන් එ තෙරට ගිය ඔබ සැම තන්හි ම
මිදුණු සිත් ඇත්තේ නැවත ජාති ජරාවලට පත් නො
වන්නේ ය.

